| | | | 841 | වාර | | භා | | | | | | |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 57 2 0 | 2 | | ඡේඩාගාරඇපකරය | | | | | | |
| | | | 829 756 61 | වාර 2 | | හාඡේඩාගාරඇපකරය | | | | | | |
| | | | 754 944 62 | වාර 2 | 727 | හාඡේඩාගාරඇපකරය | | | | | | |
| | | | 8 584 764 | වාර 2 | 26,057 | හාඡේඩාගාරඇපකරය | | | | | | |
| | | | 851 384 | වාර 2 | 23,20 | හාඡේ | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 55 | | 8 | ඩාගාර ඇපකරය | | | | | |
| | | 85918910 | වාර 2 | 2,361 | භාණ්ඩාගාර ඇපකරය | | | | | |
| | | 85991542 | වාර 2 | 9,365 | භාණ්ඩාගාර ඇපකරය | | | | | |
| | සීමාසහිත ලංකා සතොස | ටී.එෆ්-එල් 488961 | වාර 1 | 3,057 | භාර ගැනීමේ ලිපිය | 2019.12.31 දක්වා ප්‍රාග්ධනය කොටස | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | සහ උපචිත පොලීය අයකර ගැනීමටත් කාලීන ණය පහසුකම් 2 ක ලබා දීම අවසන් වන තෙක් තවදුරටත් උපචිත පොළිය අත්හැරීමටත් රු.8, 626, 982, 993. 38 ක සහ රු.1, 612, 745, | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 537 ක කාලී න ණය දෙක ක් ලබා දී ඇත. එබැ වින් සීමා සහිත ලං කා ස තො ස අක්‍රිය ණය ලෙස වර්ගී කර ණය කිරී මෙ න් බැං කුව වැළ කී සිටි න බව පෙනි යයි. | | | | |
| | ශ්‍රී ලං කා රජය | | වාර 4 | 11,50 8 | ණ ය ගි වි | ශ්‍රී ලං කා ගිණු | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සුම | මිකරණ ප්‍රමිතිය - එස්. එල්. එෆ්. ආර්. එස් 9 ට අනුවර්තනය කිරීම පිළිබඳ සී.බී. එස්. එල් මාර්ගෝපදේශයට අනුව, සියලුම පහසුකම් පාහේ දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කර ඇති බැවින් | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | මෙම ණය පහසුකම් 3 අදියර යටතේ වර්ග කළ යුතුය. නමුත් ශ්‍රී ලංකා රජයට ණය ලබා දී ඇති බැවින් සියලුම පහසුකම් 1 අදියර යටතේ වර්ගීකරණය කර ඇත. | | | | |

<table>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr>
<td>13.</td>
<td>2008 අංක 03 බැංකු පනත් විධානයට අනුව, ණය ගැනුම්කරුගේ ආපසු ගෙවීමේ හැකියාව කෙරෙහි බලපාන තත්ත්වයන් හේතුවෙන් එකඟ වූ කාලසීමාවට අනුව සම්පූර්ණ අයකර ගැනීමේ හැකියාව සැක සහිත නම් බැංකුව විසින් ක්‍රියාකාරී ණය සහ අත්තිකාරම් අක්‍රීය ණය සහ අත්තිකාරම් ලෙස වර්ග කළ යුතුය. කෙසේ වෙතත්, ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් දැකිය හැකි වුවද, බැංකුව පහත ගණුදෙනුකරුවන් නිවැරදි කාණ්ඩයට වර්ග කර නොමැති බව නිරීක්ෂණය විය. විස්තර පහත වගුවේ දක්වා ඇත.
<table>
<tr><th>ගණුදෙනුකරුගේ නම</th><th>2020 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය (රු. මිලියන)</th><th>සටහන</th></tr>
<tr><td>මිහින් ලංකා</td><td>2,763</td><td>දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කර ඇති අතර 3 වන අදියරට වර්ග කළ යුතුය. කෙසේ වෙතත් බැංකුව රජයේ එෆ්.සී.වයි නිරාවරණ කාණ්ඩය යටතේ 2 වන අදියරට වර්ග කර ඇත.</td></tr>
<tr><td>රාජ්‍ය ඉංජිනේරු සංස්ථා</td><td>2,652</td><td>සී.ඊ.සී අඛණ්ඩව මූල්‍ය දුෂ්කරතා කිහිපයකට මුහුණ දුන් අතර රු.</td></tr>
</table>
</td>
<td>2008 අංක 03 දරන බැංකු පනතේ විධානය යටතේ ලබා දී ඇති උපදෙස් අනුව ගනුදෙනුකරුවන් නිවැරදි කාණ්ඩයට වර්ග කිරීමට නිර්දේශ කෙරේ.</td>
<td><u>මිහින් ලංකා</u><br><br>පොලිය ඇතුළුව සම්පූර්ණ වගකීම් ආවරණය වන පරිදි භාණ්ඩාගාර ඇපකර මගින් ණය සුරක්ෂිත කර ඇති නිසා බැංකුව ගණුදෙනුකරුව වර්ගීකරණය කර නැත.<br><br><u>රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව</u><br><br>පොලිය ඇතුළුව සම්පූර්ණ වගකීම් ආවරණය වන පරිදි භාණ්ඩාගාර ඇපකර මගින් ණය සුරක්ෂිත කර ඇත.<br><br>කෙසේ වෙතත්, බැංකුව එස්.එල්.එෆ්.ආර්.එස් 9 ට අනුකූලව පහසුකම්වල පොලී කොටස හානිකරණය කර ඇත.</td>
<td>සමාගම ඈවර කිරීමේ ක්‍රියාවලිය යටතේ පවතින අතර භාණ්ඩාගාර ඇපකරය යටතේ හිමිකම් පෑමක් ඉදිරිපත් කර ඇත.<br><br>බැංකුව සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිලධාරීන් සමඟ රැස්වීම් කිහිපයක් සංවිධානය කර ඇති අතර ඔවුන් බැංකුවට පියවීම් සැලැස්මක් ඉදිරිපත් කිරීමට එකඟ විය. තවද, භාණ්ඩාගාර ඇපකරය යටතේ හිමිකම් පෑමක් ඉදිරිපත් කර ඇත.</td>
<td><u>මිහින් ලංකා</u><br><br>රජයේ භාණ්ඩාගාරය විසින් 2022.12.31 දක්වා සහන ලිපිය දීර්ඝ කරන ලදි. කෙසේ වෙතත්, බැංකුව 2021.12.31 වන විට අදියර III යටතේ ගනුදෙනුකරුව සම්පූර්ණයෙන්ම හානිකරණ තත්ත්වයට පත් කර ඇත.<br><br><u>රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව</u><br><br>සම්පූර්ණ වගකීම් ආවරණය කිරීම සඳහා භාණ්ඩාගාර</td>
</tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| | ව (සී.ඊ.සී ) \| \| මිලියන 2,000 ක භාණ්ඩාගාර ඇපකරයට එරෙහිව රු. මිලියන 2,000 ක කාලීන ණය පහසුකම ලබා දීමෙන් පසු රු. මිලියන 566.9 ක කාලීන ණය පහසුකම, පී.ඕ.ඩී රු. මිලියන 150 ක් සහ ටී.ඕ.ඩී රු. මිලියන 50 ක් අවලංගු කර ඇත. සැලකිය යුතු මට්ටමකට ණය අවදානම වැඩි වී ඇති බව නිරීක්ෂණය වූ අතර එබැවින් අක්‍රීය කාණ්ඩයට වර්ගීකරණය කළ යුතුය. | | | | ඇපකරයක් තිබේ. කෙසේ වෙතත්, බැංකුව 2021.12.31 දිනට අදියර III යටතේ ගනුදෙනුකරුව වර්ග කර ඇති අතර පොලී කොටස හානිකරණ කර ඇත. |
| 14. | එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමයේ අක්‍රීය ගනුදෙනුකරුවන්ගෙන් ණය දීමේ අනුපාතය සහ සහනාධාර අනුපාතය අය කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ගනුදෙනුකරුවන් 2030 කගේ පොලී අනුපාතිකය පද්ධතිය තුළ වෙනස් කර නොතිබුණි. එසේම අක්‍රීය ගනුදෙනුකරුවන් 36 දෙනෙකුගේ පොලී අනුපාතය පද්ධතියේ මුලින් අය කළ අනුපාතයට වඩා අඩු කර තිබුණි. | එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමයේ අක්‍රීය ගනුදෙනුකරුවන්ගෙන් මුලින් එකඟ වූ පරිදි ණය දීමේ අනුපාතය සහ සහනාධාර අනුපාතය අය කිරීමට | ශාඛාවල දෛනික පදනමින් මෙම කාරණය සමීපව නිරීක්ෂණය කරන යාන්ත්‍රණය දැන් ක්‍රියාත්මක වේ. 2021.11.12 දිනට පොලී අනුපාතිකය වෙනස් කර නොමැති අක්‍රීය ණය ගිණුම් සංඛ්‍යාව 1,101 ක් වන අතර ඒ සියල්ල දැන් පිළිවෙළට ඇත. | ප්‍රධාන කාර්යාල දෙපාර්තමේන්තුව සහ ශාඛා විසින් මෙම කරුණ අධීක්ෂණය කිරීම සඳහා දැනටමත් අඛණ්ඩ යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත. හඳුනාගත් අඩුපාඩුවලට ඉක්මනින් ප්‍රවේශ වනු ලැබේ. | ණය තත්ත්ව රක්‍ෂණ ඒකක විසින් මෙම කරුණ දැඩිව පසු විපරම් කරන ලදී.<br>2020.02.10 වන විට නිවැරදි කිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | නිර්දේශ කෙරේ. | | | සඳහා පවතින පහසුකම් 15ක් පමණි.<br><br>අපි අඛණ්ඩව ප්‍රගතිය පසු විපරම් කරන්නෙමු. |
| 15. | පහත සඳහන් කාලසීමාවන් තුළ ලංකා බැංකු ආඥාපනතට අනුව අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් 6 දෙනෙකුගේ අවශ්‍යතාවයට බැංකුව අනුකූල වී නොතිබුණි.<br><br>• 2020 ජනවාර 01 - 2020 අප්‍රේල් 21<br>• 2020 දෙසැම්බර් 08 – 2020 දෙසැම්බර් 31 | 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනතේ අවශ්‍යතායවන්ට අනුකූල වීමට නිර්දේශ කෙරේ. | බලාත්මක නිතියට අනුව අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ බැංකුව භාර අමාත්‍යවරයා විසින් බැවින් මෙය බැංකුවේ පාලනයෙන් ඔබ්බට ගිය කාරණයකි.<br><br>වර්තමානය වන විට අධ්‍යක්ෂ මණ්ඩලය **6** දෙනෙකුගෙන් සමන්විත වේ. | - | 2021 වර්ෂය තුළ අධ්‍යක්ෂ වරුන් 6 දෙනෙක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටියහ.<br><br>2022 පෙබරවාරි 01 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් පවතින අතර එය අමාත්‍යාංශය විසින් පිරවීමට අපේක්ෂා කෙරේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 16. | 2020 ජනවාරි 01 සිට 2020 ජනවාරි 13 දක්වා කාලය සඳහා බැංකුව අවම වශයෙන් ස්වාධීන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකුගේ අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. | 2007 අංක 11 දරන බැංකු පනත් විධානයේ 3 (2) (iv) වගන්තියේ අවශ්‍යතායව න්ට අනුකූල වීමට නිර්දේශ කෙරේ. | බලාත්මක නිතියට අනුව අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ බැංකුව භාර අමාත්‍යවරයා විසින් බැවින් මෙය බැංකුවේ පාලනයෙන් ඔබ්බට ගිය කාරණයකි.<br><br>දැනට මණ්ඩලය ස්වාධීන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකුගෙන් සමන්විත වේ. | | 2021 වර්ෂය තුළ අධ්‍යක්ෂ වරුන් 6 දෙනෙක් අධ්‍යක්ෂ මණ්ඩල යේ සිටියහ. 2022 පෙබරවා රි 01 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල යේ පුරප්පාඩු වක් පවතින අතර අමාත්‍යාං ශය විසින් හැකි ඉක්මනි න් එය පිරවීමට බලාපො රොත්තු වේ. |
| 17. | 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී 03/2016 හි ඡේදය (2) අනුව, දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ අදාළ රෙගුලාසිවලට අනුව රජයට අයත් ව්‍යවසායන්වල සේවකයින් ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ උපයන විට ගෙවන බදු, බදු ගෙවිය යුතු සේවක ඉපැයීම්වලින් අඩු කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව සහ ලංකා බැංකුවේ සේවක සංගමය අතර අත්සන් කර ඇති සාමූහික ගිවිසුම මගින් සේවකයින්ගේ ආදායම් බදු වගකීම සේවකයින්ගේ වැටුපෙන් අඩු | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී 03/2016 යටතේ දක්වා ඇති උපදෙස්වල ට අනුකූල වීමට නිර්දේශ කෙරේ. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදි. | අදාළ නොවේ. | එම චක්‍රලේඛ ය, පී.ඊ.ඩී 03/2016 රජයේ බැංකු වෙත යොමු කර නැත.<br><br>ඒ නිසා අපි |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොකර බැංකුව විසින් ගෙවීමට නියම කර ඇත. එය මත පදනම්ව, 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සේවක ඉපැයීම්වලින් අඩු නොකර සේවකයින් වෙනුවෙන් උපයන විට ගෙවන බදු ලෙස බැංකුව රු. 22,324,700 ක් ගෙවා ඇත. | | | | සාමූහික ගිවිසුම මත ගෙවීම් දිගටම කරගෙන යයි. |
| 18. | බිබිල ශාඛාවේ ශාඛා කළමනාකරු පුද්ගලික ආයතනයක සේවය කරන සේවකයන් 29 දෙනෙකුගේ නම් මත ණය ගිණුම් 29 ක් ඔවුන් නොදැනුවත්ව ආරම්භ කර ඇත. එම ණය ගිණුම් විවෘත කිරීම සඳහා ශාඛා කළමණාකරු විසින් ව්‍යාජ ලේඛන සකස් කර රු. මිලියන 14.5 ක මුදලක් එම පෞද්ගලික ආයතනයේ හිමිකරුට ලබාදී තිබුණි. එසේම ණය වාරික නොගෙවීම හේතුවෙන් එම ණය අක්‍රිය ණය ලෙස වර්ගීකරණය වීම වැලැක්වීමට කළමනාකරු සිය මුරපදය භාවිත කරමින් පද්ධතිය වෙනස් කර තිබුණි. | අනාගතයේ දී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මඟහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. | විමර්ශනය අවසන් කර ඇත. විනය පරීක්ෂණය සිදුවෙමින් පවතී. | සියලුම ණය ලේඛන පද්ධතියට උඩුගත කළ යුතු සහ අදාළ නියෝජිත අධිකාරියට අනුව පරිශීලක පැතිකඩ නිර්වචනය කර ඇති, ලේඛන කළමනාකරණ පද්ධතිය (ඩී.එම්.එස්) ක්‍රියාත්මක කිරීමත් සමඟ ණය ආරම්භ කිරීමේ ක්‍රියාවලිය දැන් ස්වයංක්‍රීය කර ඇත. තවද, ඩී.එම්.එස් හි වැඩ ප්‍රවාහය ශාඛාවේ අභ්‍යන්තර පාලන නිලධාරියාගේ (අයි.සී.ඕ) ස්වාධීන සත්‍යාපනය මත පමණක් සම්පූර්ණ කළ හැක. තවද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අයි.එස් | විමර්ශනය අවසන් කර ඇත.<br>කොවිඩ් **19** හේතුවෙන් තවමත් විනය පරීක්ෂණය අවසන් වී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | විගණන ඒකකය දිනපතා බකට් නිෂ්කාශනය (Bucket Clearance) කිරීමේ උත්සාහයන් නිරීක්ෂණය කරන අතර අදාළ වන පරිදි ශාඛා කළමනාකරු, ප්‍රදේශ කළමනාකරු සහ සහකාර සාමාන්‍යාධිකාරී වෙත දෛනික පදනමින් වාර්තාවක් නිකුත් කරයි. | |
| 19. | ලේක්වීව් ශාඛාවේ ණය නිලධාරිනිය ව්‍යාජ අත්සනක් සහ ව්‍යාජ හැඳුනුම්පත් අංකයක් යොදාගෙන ව්‍යාජ ණය ගිණුම් 14 ක් සහ ඇගේ මවගේ නමට ඉතුරුම් ගිණුමක් සාදා ඇත. ඇය ව්‍යාජ ණය ගිණුම් 14ක් සඳහා රු. 7,147,000 ක් ලබාදී එම මුදල් නිර්මාණය කළ ඉතිරිකිරීමේ ගිණුමට තැන්පත් කර ඇත. පසුව ඇය තම මවගේ නමට ව්‍යාජ මුදල් ලබා ගැනීමේ පත්‍රිකා සාදා ඉතිරි කිරීමේ ගිණුමේ තිබූ මුදල් ආපසු ලබාගෙන එම මුදල් පෞද්ගලික කටයුතු සඳහා යොදවා ඇත. | අනාගතයේ දී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මඟහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. | විමර්ශනය අවසන් කර ඇත. | සියලුම ණය ලේඛන පද්ධතියට උඩුගත කළ යුතු සහ අදාළ නියෝජිත අධිකාරියට අනුව පරිශීලක පැතිකඩ නිර්වචනය කර ඇති, ලේඛන කළමනාකරණ පද්ධතිය (ඩී.එම්.එස්) ක්‍රියාත්මක කිරීමත් සමඟ ණය ආරම්භ කිරීමේ ක්‍රියාවලිය දැන් ස්වයංක්‍රීය කර ඇත. තවද, ඩී.එම්.එස් හි වැඩ ප්‍රවාහය ශාඛාවේ | විමර්ශනය අවසන් කර ඇත.<br>කොවිඩ් 19 හේතුවෙන් තවමත් විනය පරීක්ෂණය අවසන් වී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | අභ්‍යන්තර පාලන නිලධාරියාගේ (අයි.සී.ඕ) ස්වාධීන සත්‍යාපනය මත පමණක් සම්පූර්ණ කළ හැක. තවද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අයි.එස් විගණන ඒකකය දිනපතා බකට් නිෂ්කාශනය (Bucket Clearance) කිරීමේ උත්සාහයන් නිරීක්ෂණය කරන අතර අදාළ වන පරිදි ශාඛා කළමනාකරු, ප්‍රාදේශීය කළමනාකරු සහ සහකාර සාමාන්‍යාධිකාරී වෙත දෛනික පදනමින් වාර්තාවක් නිකුත් කරයි. | |
| 20. | ආරක්ෂක අමාත්‍යාංශයේ සේවය කරන බව පැවසූ ණය ගැණුම්කරුවන් 5 දෙනෙකුට ඔහුන් ලබාදුන් ව්‍යාජ ලේඛන ලබාගෙන මරදාන ශාඛාවෙන් රු. 6,525,000 ක ණය ලබාදී ඇත. ශාඛා කාර්ය මණ්ඩලය ණය ගැණුම්කරුවන් විසින් සපයන ලද ලේඛනවල නිරවද්‍යතාවය තහවුරු කර හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ ඔවුන්ගේ රැකියාව තහවුරු කර නොතිබූ අතර එම නිසා මේ සම්බන්ධයෙන් | අනාගතයේ දී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මගහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට | විමර්ශන සහ විනය පරීක්ෂණ අවසන් කර ඇත. | ඕ.අයි.සී 319/2018 ට කරන ලද 08 වැනි සංශෝධන යටතේ ණය නිලධාරියා අදාළ සේවා යෝජකයා විසින් ලබා දෙන 375 පෝරමය නැවත තහවුරු | විමර්ශන සහ විනය පරීක්ෂණ අවසන් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොසැලකිලිමත් ලෙස ක්‍රියා කර ඇත. | නිර්දේශ කෙරේ. | | කර ගත යුතු වන පරිදි සේවකයින්ට ලබා දෙන ණය පිළිබඳ අභ්‍යන්තර පාලනය බැංකුව විසින් ශක්තිමත් කර ඇත. | |
| 21. | නිකවැරටිය සහ වාරියපොළ ශාඛාවේ සේවයේ නියැළි නිලධාරියෙකු එම ශාඛාවේ අනෙකුත් කාර්ය මණ්ඩලය නොමඟ යවමින් ව්‍යාජ ලේඛන මත ජංගම ගිණුම් 3ක් සහ ඉතිරි කිරීමේ ගිණුම් 2ක් ආරම්භ කර ඇත. ඔහු මුදල් අයකැමිගේ මුරපදය අවභාවිත කර ඉහත ගිණුම්වලට අවම තැන්පතු මුදල මාරු කර ඇති අතර ජංගම ගිණුම් සඳහා චෙක් පොත් 3ක් ද ලබාගෙන ඇත. තවද ඔහු බැංකුවේ කාර්ය මණ්ඩලයට ව්‍යාජ ලේඛන සපයා ණය ගිණුම් 2ක් සාදා ඇත. රු. මිලියන 15.5 ක් වටිනා බැංකුවේ වත්කම් මූල්‍ය අවදානමකට ලක් කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතුය. | අනාගතයේ දී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මඟහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. | විමර්ශනය අවසන් කර ඇත. | ලේඛන කළමනාකරණ පද්ධතිය (ඩී.එම්.එස්) ක්‍රියාත්මක කිරීමත් සමඟ ණය ආරම්භ කිරීමේ ක්‍රියාවලිය දැන් ස්වයංක්‍රීය කර ඇත.<br><br>තවද, දිනක විවෘත කරන ලද සියලුම ගිණුම් පසු දින ඒ පන්තියේ නිලධාරියෙකු විසින් පරීක්ෂා කළ යුතුය. | විමර්ශනය අවසන් කර ඇත. |
| 22. | නුගේගොඩ ශාඛාව විසින් ටියානා මල්ටි (පුද්) සමාගම වෙත රු. මිලියන 328.648 ක ණය මුදලක් ද ගජබා සිටි සෙන්ටර් වෙත රු. මිලියන 684 ක ණය මුදලක් ද ලබා දී ඇත. මෙම අවස්ථා දෙකේදීම එම ශාඛාවේ නිලධාරීන් තම රාජකාරිය නිසියාකාරව ඉටුකර නොතිබූ අතර ණය ලබාදීමේ සහ පසු අධීක්ෂණ ක්‍රියාවලියේ අක්‍රමිකතා රැසක් නිරීක්ෂණය විය. මෙම ණය පිළිවෙලින් 2018 මැයි 31 සහ 2020 ජනවාරි 20 යන දිනවලදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත. 2020 දෙසැම්බර් 31 දිනට ටියානා මල්ටි (පුද්) සමාගමේ සහ ගජබා සිටි සෙන්ටර් හි මුළු හිඟ ශේෂය | අනාගතයේ දී මෙවැනි වංචනික ක්රියාකාරකම් මඟහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. | විමර්ශනය සිදුවෙමින් පවතී. | සෑම සුපිරි ශ්‍රේණියේ ශාඛාවකම අයි.සී.ඕ යොදවා ඇති අතර නිසි ලෙස පවරන ලද අධිකාරියක් ක්‍රියාත්මක වේ. | විමර්ශන සිදුවෙමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පිළිවෙලින් රු. මිලියන 476.446 ක් සහ රු. මිලියන 834.407 ක් විය. | | | | |
| 23. | තණමල්විල ශාඛාවේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු 2020 පෙබරවාරි 05 සිට 2020 මාර්තු 10 දක්වා කාලය තුළ අවස්ථා පහකදී රු. මිලියන 15.95 ක මුදලක් ශාඛාවේ මධ්‍යම කාර්යාලයේ අපගේ ගිණුමට වංචනික ලෙස හර කර එම මුදල් සමීප ඥාතීන්ගේ ඉතුරුම් ගිණුම් 05 කට බැර කර ඇත. සියලුම ගිණුම්වලින් බැර කළ මුදල් නිලධාරියා විසින් වරින් වර ලබාගෙන ඇත. තවද මෙම නිලධාරියා ව්‍යාජ ලේඛන ලබාදී ඥාතීන් තිදෙනෙකුගේ නම් මත එකතුව රු. ලක්ෂ 9 ක ණය මුදල් 3ක් ලබාගෙන ඇත. එම ණය සම්පූර්ණයෙන්ම ගෙවා නොමැති අතර දැනට අක්‍රීය ණය කාණ්ඩයේ පවතී. | අනාගතයේ දී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මඟහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. | විමර්ශනය අවසන් කර ඇත. | සෑම ශාඛාවකම මාසය අවසානයේ පොදු ලේජර ගිණුම තුලනය කිරීම සඳහා හොඳින් ස්ථාපිත ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන අතර එය පළාතේ මෙහෙයුම් කළමනාකරු විසින් අධීක්ෂණය කරනු ලැබේ. සටහන් කිරීමට පෙර සෑම අවස්ථාවකදීම ඒ සහ බී පන්තියේ නිලධාරීන් විසින් පොදු ලේජර හර වවුචරයට අත්සන් කළ යුතුය. | විමර්ශනය අවසන් කර ඇත. කොවිඩ් 19 හේතුවෙන් තවමත් විනය පරීක්ෂණය අවසන් වී නොමැත. |
| 24. | 2019 සහ 2020 කාලය තුළ පාරිභෝගික ගිණුම් 4 කින් රු. මිලියන 283.1 ක සාවද්‍ය සී.ඊ.එෆ්.ටී ගනුදෙනු 22 ක් සිදුවී ඇත. මූලික බැංකු පද්ධතිය සමඟ සන්නිවේදනය කිරීමට ගනුදෙනු තොරතුරු මාරු කිරීම සඳහා භාවිතා කරන ලද 'ඊ.එෆ්.ටී සේවය' මෘදුකාංගයේ (අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද තොරතුරු තාක්ෂණ මෘදුකාංගය) 'පද්ධති දෝෂයක්' හේතුවෙන් වැරදි සී.ඊ.එෆ්.ටී ගනුදෙනු සිදු විය. ඉලෙක්ට්‍රොනික බැංකු අංශය මගින් දෛනිකව සිදුකරන ලද | අනාගතයේ දී එවැනි වැරදි ගනුදෙනු වළක්වා ගැනීම සඳහා වඩාත් නිවැරදි, පරිශීලක හිතකාමී සැසැඳීමේ පද්ධතියක් | විමර්ශනය අවසන් කර ඇත. | බැංකුව සී.ඊ.එෆ්.ටී සැසැඳීමේ ඒකකයක් ස්ථාපිත කර ඇති අතර සැසැඳීමේ ක්‍රියාවලිය දිනපතා සිදු කිරීමට හඳුන්වා දී ඇත. | විමර්ශනය අවසන් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සැසැඳීමේ ක්‍රියාවලියේදී මෙම වැරදි සී.ඊ.එෆ්.ටී ගනුදෙනු අනාවරණය වී නොතිබුණි.<br><br>නව පාර්කින් ගිණුම් ව්‍යුහයක් භාවිතා කරමින් වඩාත් නිවැරදි, පරිශීලක හිතකාමී සහ බහුකාර්ය සැසැඳීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා 2018 සිට ඉලෙක්ට්‍රොනික බැංකු අංශයේ සහ තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් අතර සාකච්ඡා පැවතියද, 2020 මැයි මාසයේ සිදු වූ වැරදි ගනුදෙනු සිදු වන තුරුම තොරතුරු තාක්ෂණ අංශයට යෝජිත සංවර්ධනය සම්පූර්ණ කිරීමට නොහැකි විය. AML Clari5 පද්ධතිය හරහා ඉහළ වටිනාකම් ඇති සාවද්‍ය ණය ගනුදෙනු සම්බන්ධයෙන් අනතුරු ඇඟවීම් ජනනය කර ඇතත්, එම ගනුදෙනු අසාමාන්‍ය හෝ සැක කටයුතු ලෙස හඳුනා ගැනීමට එම ශාඛාවල නිලධාරීන්ට නොහැකි විය. සෑම ගණුදෙනුකරුවකුගේ ගිණුමකටම වැරදි ලෙස බැර කරන ලද සියලුම මුදල් සම්පූර්ණයෙන් අයකරගෙන ඇති අතර අනාගතයේදී සිදුවිය හැකි සියලු අවස්ථා සලකාබලමින් මෘදුකාංගය වෙනස් කර සංවර්ධනය කර ඇත. | සකස් කිරීමට නිර්දේශ කෙරේ. | | | |

## 2. මහජන බැංකුව

**1. ආයතනයේ නම** මහජන බැංකුව

2. **මතය**

**වර්ෂ සඳහා මතය**

2018 තත්ත්වාගණනය නොකළ මතය
2019 තත්ත්වාගණනය නොකළ මතය
2020 තත්ත්වාගණනය නොකළ මතය

3. අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| **කාර්ය සාධන අනුපාත** | | | |
| i. ස්කන්ධය මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඊ) | 20.3 | 13.9 | 14.4 |
| ii. වත්කම් මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඒ) | 1.5 | 1.1 | 1.0 |
| iii. පොලී ආන්තිකය | 3.5 | 3.2 | 3.0 |
| **වත්කම්වල ගුණාත්මක අනුපාතය** | | | |
| දළ අක්‍රීය අත්තිකාරම් (එන්.පී.එල්) | 2.5 | 3.3 | 3.2 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත** | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවමය 10%) | 11 | 10.7 | 9.5 |
| මුළු ප්‍රාග්ධනය (උපරිමය 14%) | 14.5 | 14.7 | 15.5 |
| **ව්‍යවස්ථාපිත අනුපාතය** | | | |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය (අවම අවශ්‍යතාවය 20%) | 27.6 | 21.7 | 25.61 |
| ද්‍රවශීලතා ආවරණ අනුපාතය (අවම අවශ්‍යතාවය 100%) | රුපියල්-144.90<br>සියලුම විනිමයන් - 100.42 | රුපියල් -160.80<br>සියලුම විනිමයන් - 132.10 | රුපියල් - 166.82<br>සියලුම විනිමයන් - 111.55 |

4. ශුද්ධ වත්කම් තත්ත්වය රු.'000

| | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| මුළු වත්කම් | 1,734,702,989 | 1,873,406,218 | 2,230,118,665 |
| මුළු වගකීම් | 1,643,493,064 | 1,778,441,778 | 2,128,135,067 |
| ශුද්ධ වත්කම් | 91,209,925 | 94,964,440 | 101,983,598 |

5. රජයට ලබා දුන් දායකත්වය

රු. මි.

| විස්තරය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| රජයට ගෙවන ලාභාංශ/බදු | 19,814.6 | 19,817 | 14,444.9 |

6. කාර්ය මණ්ඩල තත්ත්වය

| කාර්ය මණ්ඩල කාණ්ඩය | දෙසැම්බර් 31 වන දිනට තත්‍ය සේවක සංඛ්‍යාව (වැඩ බලන තනතුරු සමඟ) | | අනුමත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| | | එකතුව | |
| **ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී** | 1 | **1** | **1** |
| **ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී** | 2 | **2** | **2** |
| **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**<br>වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොන්ත්‍රාත්) | 8<br>2<br>4 | **14** | **15** |
| **සහකාර සාමාන්‍යාධිකාරී**<br>සහකාර සාමාන්‍යාධිකාරී (කොන්ත්‍රාත්)<br>වැඩ බලන සහකාර සාමාන්‍යාධිකාරී | 25<br>2<br>4 | **31** | **33** |
| **ප්‍රධාන කළමණාකරු**<br>ප්‍රධාන කළමණාකරු<br>ජ්‍යෙෂ්ඨ නීති නිලධාරියා<br>වැඩ බලන ප්‍රාදේශීය කළමනාකරු<br>වැඩ බලන ජ්‍යෙෂ්ඨ කළමනාකරු | <br>46<br>7 | 53 | **59** |
| **ජ්‍යේෂ්ඨ කළමනාකරු** | 65 | 65 | 131 |
| **කළමනාකරු (3-1)** | 267 | 267 | 510 |
| **සහකාර සහ නියෝජ්‍ය කළමණාකරු (3-II & 3-III)** | | 3199 | 3103 |

| | | | |
|---|---|---|---|
| නියෝජ්‍ය කළමණාකරු | 1767 | | |
| සහකාර කළමණාකරු | 1430 | | |
| කළමනාකරණ අභ්‍යාසලාභියා | 2 | | |
| **මාණ්ඩලික සහකාර + සී.එස්.ඒ** | | | |
| **මාණ්ඩලික සහකාර** | 2093 | 2095 | 4242 |
| පාරිභෝගික සේවා සහකාර | 2 | | |
| **ලේකම්** | | | |
| ජ්‍යෙෂ්ඨ රහස්‍ය ලේකම් | 7 | | |
| රහස්‍ය ලේකම් II | 69 | 147 | - |
| රහස්‍ය ලේකම් I | 71 | | |
| විධායක සහකාර(කොන්ත්‍රාත්) | | | |
| **ටයිපිස්ට් / ස්ටෙනෝග්‍රැෆර්** | | | 566 |
| **දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරු** | | | <u>274</u> |
| සහකාර ලේකම් | 139 | | 840 |
| ලේකම් සහකාර | 220 | | |
| සේවා සහකාර | 361 | | |
| අභ්‍යාසලාභියා රහස් ලේකම් (කොන්ත්‍රාත්) | | 735 | |
| ටයිපිස්ට් (කොන්ත්‍රාත්) | 3 | | |
| බහු රාජකාරි සහකාර (කොන්ත්‍රාත්) | 9 | | |
| දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරු (කොන්ත්‍රාත්) | 3 | | |
| **කාර්යාල සහකාර/කම්කරු** | | | |
| වාර්තා සහ සේවා සහකාර | 96 | | |
| කාර්යාල සහයක | 247 | | |
| කම්කරු | 105 | | |
| පුහුණු කම්කරු | 11 | 533 | 621 |
| පණිවිඩකරුවන් (කොන්ත්‍රාත්) | 2 | | |
| කාර්යාල සහකාර (කොන්ත්‍රාත්) | 71 | | |
| කම්කරු (කොන්ත්‍රාත්) | 1 | | |
| පුහුණු කම්කරු (කොන්ත්‍රාත්) | | | |
| **පිළිගැනීමේ නිලධාරී/දුරකථන ක්‍රියාකරු** | | | |
| සන්නිවේදන සහකාර | 14 | 14 | 25 |
| පිළිගැනීමේ නිලධාරී/දුරකථන ක්‍රියාකරු (කොන්ත්‍රාත්) | | | |
| රියදුරු | | | |
| **රියදුරු** | 139 | 146 | 196 |
| රියදුරු (කොන්ත්‍රාත්) | 7 | | |
| **ආරක්ෂක** | | | |
| ආරක්ෂක කාර්ය මණ්ඩලය | 134 | 142 | 148 |
| ආරක්ෂක කාර්ය මණ්ඩලය (කොන්ත්‍රාත්) | 8 | | |
| **විශේෂ තනතුරු** | 6 | 6 | - |
| **අලෙවි නියෝජිතයන්** | 8 | 8 | - |
| **විගණන කාර්ය මණ්ඩලය** | 3 | 3 | - |
| **මූල්‍ය කාර්ය මණ්ඩලය** | 6 | 6 | - |
| **නීති කාර්ය මණ්ඩලය** | | | - |

| | | | |
|---|---|---|---|
| නීති කාර්ය මණ්ඩලය (ස්ථිර)<br>නීති නිලධාරීන් (කොන්ත්‍රාත්) | 76<br>4 | 80 | |
| **තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය** | 102 | 102 | - |
| **ඉංජිනේරු කාර්ය මණ්ඩලය** | 15 | 15 | - |
| **අනෙකුත් කොන්ත්‍රාත් සේවකයින්** | 28 | 28 | - |
| **එකතුව** | **7692** | **7692** | **9926** |

7. පරිපාලන වියදම් පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස

රු.'000

| | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| මුළු ආදායම / පිරිවැටුම (දළ ආදායම) | 181,283,878 | 199,728,985 | 190,981,708 |
| පරිපාලන වියදම් | 35,309,782 | 36,730,523 | 35,070,102 |
| පරිපාලන වියදම් පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස | 19.48% | 18.39% | 18.36% |

**8**. ප්‍රධාන විගණන නිරීක්ෂණ

| අනු අංකය | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | | **2018** වර්ෂය | | |
| 01. | බැංකුවට අයත් පහත සඳහන් වෙන්කළ වාහන විශ්‍රාමගිය/ඉල්ලා අස්වූ නිලධාරීන් විසින් ඔවුන් විශ්‍රමයාමේදී/ඉල්ලා අස්වීමේදී බැංකුවට භාර නොදී භාවිතා කරන බව නිරීක්ෂණය විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව ඉහත වාහන භාවිතා කිරීම සඳහා ප්‍රධාන විධායක නිලධාරී විසින් අනුමැතිය ලබාදී තිබුණු අතර පසුව ඒවා අපර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත | බැංකුවේ වාහනය භාවිතය/උපයෝජනය වෙනුවෙන් විනිවිදභාවයෙන් ,ආර්ථිකභාවයෙන් යුතු නිශ්චිත ප්‍රතිපත්තියක් | අවධාරණය කරන ලද සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නව ප්‍රවාහන ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත (BP | පසුගිය කාලයේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරිවරුන්ට විශ්‍රාම යන විට ඔවුන් භාවිත කළ වාහනය "පොත් වටිනාකම" යටතේ මිලදී ගැනීමට අවස්ථාව ලබාදී තිබුණි. |

<table>
<tr>
<td></td>
<td>යොමු කර ඇත.
<table>
<tr><th>තනතුර</th><th>ඉල්ලා අස්වූ /විශ්‍රාම ගිය දිනය</th><th>වෙන් කළ වාහන අංකය</th><th>වාහනය භාර දුන් දිනය</th></tr>
<tr><td>සභාපති- හේමසිරි ප්‍රනාන්දු මහතා</td><td>2018.10.22</td><td>කේආර්-0117</td><td>2018.11.02</td></tr>
<tr><td>තොරතුරු තාක්ෂණ අංශ ප්‍රධානී- සදමාල් මහතා</td><td>2019.04.01</td><td>ඒඑච්-0702</td><td>2019.07.24</td></tr>
<tr><td>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- ජාත්‍යන්තර බැංකුකරණය- එස්. ප්‍රතාපසිංහ මහත්මිය</td><td>2019.04.01</td><td>සීජ්ජී 3450</td><td>භාර දී නැත</td></tr>
<tr><td>ප්‍රධාන විධායක නිලධාරී- වසන්ත කුමාර මහතා</td><td>2019.04.15</td><td>සීජ්අයි 4646</td><td>භාර දී නැත</td></tr>
</table>
</td>
<td>ස්ථාපිත කළ යුතුය. මුදලින් වටිනාකම් පියවීම් සම්බන්ධ තීරණ ගැනිමේදි බැංකුව විසින් වාහනයේ වෙළඳපල වටිනාකම එහි වට්ටම් සමඟ සැසඳිම කල යුතු වේ.</td>
<td>723/2019 2019.09.30).</td>
<td>2016 වසරේදී බැංකුව විසින් වාහන බැහැර කිරීමේ ප්‍රතිපත්තියක් අනුමත කර ඇති අතර, වසර 7ක සේවා කාලයක් ඇති ආයතනික සාමාජිකයෙකුට ඔහු/ඇය භාවිත කළ වාහනය කිසිදු වියදමකින් තොරව සන්තකයේ තබා ගැනීමට සුදුසුකම් ලබයි. වසන්ත කුමාර් මහතා 2019 අප්‍රේල් මාසයේදී විශ්‍රාම යන විට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය.<br><br>BHRRC අංක 89/2016 විසින් අනුමත කරන ලද අදාළ ප්‍රතිපත්තිය සලකා බැලීමෙන් අනතුරුව, BP අංක 487/2019 මඟින් එය පිළිපැදම ඥානාන්විත බව මණ්ඩලයේ තීරණයක් ගන්නා ලදී. එබැවින් පහත සඳහන් නියමයන් සහ කොන්දේසිවලට යටත්ව ක්ෂය වීමෙන් පසු පොත් වටිනාකම වන රු. 113,698.63 ක මුදලකට අංක CAI 4646 වාහනය N. වසන්ත කුමාර් මහතා වෙත මුදා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදි.<br><br>1. අංක KM-9238 දරන වාහනයේ අයිතිය ලබා ගැනීම<br>2. 2018.9.30 දිනට මහ බැංකුව ව්‍යවස්ථාපිත විභාගයේදී නැවත නැවතත් අවධාරණය කරන ලද පරිදි ඔහුට වැඩිපුර ගෙවූ ගෙවීම් පියවිය යුතුය.<br>3. වසන්ත කුමාර මහතාට බැංකුවෙන් වෙනත්</td>
</tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | | | | හිමිකම් පෑමක් නොමැති බව පිළිගැනීම.<br><br>වසන්ත කුමාර් මහතා විසින් 2019.09.24 වන දින අංක KM-9238 දරන වාහනය බැංකුව වෙත භාර දුන් අතර ඉහත දක්වා ඇති අනෙකුත් කොන්දේසි දෙකද සම්පූර්ණ කර ඇත.<br><br>ඒ අනුව CAI 4646 දරන වාහනය 2021.07.20 දින හිටපු ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වෙත මාරු කරන ලදි.<br><br>2020.06.19 දින සියයට 50 ක් ගෙවීමෙන් පසු අංක CAG 3450 දරන වාහනය S. ප්‍රතාපසිංහ, හිටපු නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර බැංකුකරණය) වෙත මාරු කරන ලදි. (BP – 487/19 අනුව). |
| 02. | (i) අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) අංක 51/2018 දරන පත්‍රිකාව මගින් කමිටුව විසින් 2018 ඔක්තෝම්බර් 10 වන දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ට නව වාහන දීමනාවක් සහ වාහන ණයක් ලබා දීමට අනුමැතිය ලබා දී ඇත.මෙම ණය යෝජනා ක්‍රමය සඳහා සියයට 5 ක පොලී අනුපාතයක් හඳුන්වා දී ඇති අතර එය දැනට පවතින වාහන ණය යෝජනා ක්‍රමයේ පොලී අනුපාතයට වඩා සියයට 1.5 කින් අඩුය.<br><br>කෙසේ වෙතත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 මැයි 17 වන දින ණය යෝජනා ක්‍රමය අනුමත කර තිබුණද, ණය 12 ක් සඳහා රු. මිලියන 215.5 ක් අධ්‍යක්ෂ මණ්ඩල | ප්‍රධාන මෙහෙයුම් තීරණ ක්‍රියාත්මක කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය. | කරුණාකර වත්මන් තත්ත්වයට අදාළව ලබා දී ඇති ප්‍රතිචාරය බලන්න. | DGM ශ්‍රේණියෙන් ඉහළ විධායක නිලධාරීන් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන විට පොලී අනුපාතය සියයට 5 ක් වූ අතර, 2020.11.03 දිනැති මාණ්ඩලික චක්‍රලේඛ 361/2003 (1) අනුව සමස්ත කාර්ය මණ්ඩල ණය අනුපාතවල සිදු කරන ලද සංශෝධන මත වාහන සඳහා සාමාන්‍ය කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමය සියයට 6.5 ක අනුපාතයකින් ක්‍රියාත්මක විය. වාහන සඳහා සාමාන්‍ය ණය යෝජනා ක්‍රමයේ පොලී අනුපාතය දැන් සියයට 4.5 |

| | | | | |
|---|---|---|---|---|
| | අනුමැතියට පෙර නිදහස් කර තිබුණි.<br><br>(ii) ඉහත වාහන ණය යෝජනා ක්‍රමයේ කොන්දේසිවලට අනුව, විශ්‍රාමයාමට හෝ කොන්ත්‍රාත්තුව කල් ඉකුත්වීමට පෙර විධායකයින්ට අවම වශයෙන් අවුරුදු 2 ක සේවා කාලයක් තිබිය යුතුය. මෙම කොන්දේසියට පටහැනිව බැංකුවේ සේවය කිරීමට ඉදිරියට වසර 2 ක් නොමැති ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ට බැංකුව ණය ලබා දී ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන දැඩි ලෙස පිළිපැදිය යුතුය. | කරුණාකර ඉහත 2 (II) කරුණ සම්බන්ධයෙන් වත්මන් තත්ත්වය සඳහා ලබා දී ඇති ප්‍රතිචාරය බලන්න. | දක්වා අඩු කර ඇත.<br><br>විධායකයින් සඳහා වන විශේෂ වාහන ණය යෝජනා ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක නොවන නමුත් වත්මන් තත්ත්වය යටතේ විධායක නිලධාරීන් සඳහා වාහන ණය සඳහා අය කරන පොලී අනුපාතය බැංකුවේ සාමාන්‍ය වාහන ණය යෝජනා ක්‍රමයේ පොලී අනුපාතයට වඩා වැඩි විය.<br><br>2018.10.10 දින පැවති රැස්වීමේදී බැංකුව සමඟ නිලධාරීන්ගේ දීර්ඝ හා කැපවූ සේවය සැලකිල්ලට ගනිමින් BHRRC විසින් අනුමත ණය යෝජනා ක්‍රමයට ව්‍යතිරේඛයක් කර තිබුණි. මෙය BHRRC හි පූර්ව අනුමැතිය ඇතිව සිදු කර ඇත. |
| 03. | කොන්ත්‍රාත් ගිවිසුමේ වේතන හා ගෙවීම් කොන්දේසිය අනුව වියදම් ගිණුමට අනුව වැටුප් වර්ධක හිඟ මුදල් ලෙස වියදම් ගිණුමෙන් රු. 36,620,606 ක් සහ රු.38,400,343 ක් පිළිවෙලින් හිටපු ප්‍රධාන විධායක නිලධාරී සහ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොග බැංකු) වෙත 2017 මාර්තු 30 සහ 2017 ඔක්තෝබර් 02 යන දිනවල ගෙවා තිබුණි.කෙසේ වෙතත්, කොන්ත්‍රාත් ගිවිසුම්වල කල් ඉකුත්වීම මත ගිවිසුම් අළුත් කර ඇති නමුත් මූලික වැටුපට වැටුප් වර්ධක ගලපා නොතිබුණු බව නිරීක්ෂණය විය. අදාළ කාල සීමාවන් සඳහා අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම් මගින් ඔවුන් පාලනය වන බැවින් ඉහත එම ගෙවීම් සඳහා ඔවුන්ට හිමිකම් නොතිබුණි. | මෙවැනි පටහැනි ගෙවීම් වළක්වා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි දැඩි ලෙස පිළිපැදිය යුතුය. | | හිටපු ප්‍රධාන විධායක නිලධාරී/ සමාන්‍යාධිකාරී වසන්ත කුමාර මහතාට රු. මිලියන 36.62 ක් සහ 2010 වසරෙන් පසු වැටුප් වර්ධක නොගෙවීම සැලකිල්ලට ගනිමින් BHRCC අංක 41/2017 මත පදනම් වූ BP අංක: 248/2017 හරහා එවකට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව Sabry Ibrahim මහතාට (SDGM විශ්‍රාමික) රු. මිලියන 38.4ක් ලබා දී ඇත.<br>පසුව මතයක් ලබා දීම සඳහා ප්‍රධාන විධායක නිලධාරී/ සමාන්‍යාධිකාරී විසින් පත් කරන ලද කළමනාකරණ කමිටුවක් විසින් මෙම කාරණය විමර්ශනය කරන ලදි. කළමනාකරණ කමිටු වාර්තාව 2020 දෙසැම්බර් 23 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සභාගත කරන ලද අතර නිර්දේශ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සහිතව එය නැවත ඉදිරිපත් කරන ලෙස DGM (HR) වෙත උපදෙස් දී ඇත. ඉහත සඳහන් කරුණු මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත්තේ , "ඉහත දක්වා ඇති පරිදි පාරිතෝෂික ගෙවීම සහ වර්ධක ප්‍රතිලාභය ගෙවීම හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ට පැවරී ඇති බලතලවලට අනුව අනුමත කර, සිදු කර ඇති අතර ඒ අනුව ගෙවීම් නීත්‍යානුකූල" බවයි. |
| 04 | කොන්ත්‍රාත් පදනම මත මාස හයක කාලයක් සඳහා රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට ඒ.සෙගර් මියට සහ බී.සී.කේ.මැන්ඩිස් මියට 2017 අප්‍රේල් 27 සහ 2018 අප්‍රේල් 18 යන දිනවල පැවති මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් හරහා බැංකුව විසින් පිළිවෙලින් රු.75,000 සහ රු.100,000 ක දීමනාවක් ඇතුළු මසකට රු.30,000 ක ඉන්ධන දීමනාවක් ගෙවීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, එවැනි සේවකයින්ගේ අවශ්‍යතාවය පිළිබඳව විගණනයට ගැටළු සහගත වන අතර අනෙක් රජයේ බැංකු එවැනි සේවකයින් බඳවා ගෙන නොතිබුණි. | හිමිකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමුකළ යුතුය. | | BHRRC අංක: 53/2017 සහ BHRRC අංක: 36/2018 දරන ඒ.සෙගර් මිය සහ බී.සී.කේ.මැන්ඩිස් මිය පත්කිරීමට අදාළ ස්වයං පැහැදිලි කිරීම් සහිත BHHRC රැස්වීම් වාර්තාවේ උපුටා ගැනීම් අමුණුමේ ඇත. (ඇමුණුම 1-2018 සහ 2-2018). තවද දැනට එවැනි කිසිදු සේවකයෙකු සේවයේ යොදවා නොමැති බවද මෙහිදී ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු. |
| 05 | ලිබර්ටි ප්ලාසා ශාඛාවේ හිටපු ශාඛා කළමනාකරු 2008 දෙසැම්බර් 31 වන දින කැන්කෝ අරලියා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ සමඟ ඇමරිකානු ඩොලර් 750,000 ක් වටිනා විදේශීය බැංකු අණකරයක් වංචනික ලෙස මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් කළමනාකරුගේ උපදෙස්වලට පටහැනිව මෙම අණකරය රු.84,083,122 කට ශාඛාව විසින් මිලදී ගෙන තිබුණි.<br><br>තවද, බැංකුවේ විදේශ මුදල් අංශයෙන් මෙම චෙක්පතෙහි විශ්වාසනීයත්වය පරීක්ෂා කිරීමෙන් තොරව හා සිය අධිකාරී සීමාව ඉක්මවා කළමනාකරු මෙම බැංකු අණකරය | අලාභය අයකර ගැනීම සඳහා කාලීනව නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු අතර බැංකු කාර්ය මණ්ඩලය ඔවුන්ගේ වෘත්තියේ සදාචාරාත්මක බව තරයේ පිළිපැදිය යුතුය. | මින් ඉදිරියට මෙවැනි අවස්ථා ඇති නොවීමට වරින් වර චක්‍රලේඛ උපදෙස් නිකුත් කර ඇත.<br><br>තවද, චක්‍රලේඛ උපදෙස් පිළිපදින ලෙස අදාළ | 2021.04.16 දිනැති සංදේශයක් මගින් කොළඹ දකුණ ප්‍රාදේශීය කළමනාකරු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් පවත්වා එම සොයාගැනීම් මත ලිබර්ටි ප්ලාසා ශාඛාවේ කළමනාකරු සහ තවත් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති බව තහවුරු කර ඇත. ඔවුන් මේ වන විට ඇප මත මුදා හැර ඇත. තවද අධිචෝදනා ගොනු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ |

| | | | | |
|---|---|---|---|---|
| | මිලදී ගෙන තිබුණි.<br><br>රු. 53,700,212 ක මුදලක් එම දිනයේදීම තමගිණුමෙන් ලබාගැනීමට කළමනාකරු විසින් මෙම ගනුදෙනුකරුට ඉඩ ලබාදී තිබුණි. කෙසේ වෙතත්, මෙම අණකරය 2009 ජනවාරි 21 දින අහරුවී තිබුණු අතර එය සාමාන්‍ය එකතු කිරීමේ ක්‍රියාවලියේදී නැතිවූ බවත් මෙම චෙක්පත නිෂ්කාශණය වීම ඔවුන් විසින් අත්හිටවූ බවත් ආර්පීසී රාජකීය බැංකුව විසින් 2009 පෙබරවාරි 04 දිනැති තම ලිපිය මගින් දැනුම් දී තිබුණි. මෙම ගනුදෙනුව කළමනාකරු විසින් හිතාමතාම ඉහත ගනුදෙනුකරු සමඟ සිදුකළ බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2009 අගෝස්තු 13 දිනැති ලිපිය මගින් දන්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුව විසින් රු.86,776,575 ක් 2011 වර්ෂයේ ලාභයෙන් කපාහැර තිබුණි. රක්ෂණයෙන් මෙය ලබා ගැනීමට බැංකුව උත්සාහයන් කිහිපයක් ගෙන ඇතත් එය සාර්ථක වී නොතිබුණි. තවද, මෙම චෙක්පත් මිලදී ගැනීම ශාඛාවේ විදේශීය චෙක්පත් මිලදී ගැනීමේ ලේඛනයේ සටහන් වී නොතිබුණි. | | නිලධාරීන්ට දැඩිව උපදෙස් දී ඇත. | දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුවට තොරතුරු ලබා දී ඇත.<br><br>දැනට රජයේ නීතිඥවරයා සමඟ නඩුව (අංක. HC 6427/13 දරන මහාධිකරණ නඩුව) ගොනු කර ඇති අතර සියලු විමර්ශනවල අවසන් ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතව ඇත.<br><br>සිද්ධියට වගකිව යුතු බවට හඳුනාගෙන ඇති පුද්ගලයින් හය දෙනෙකුට පහත පරිදි විනයානුකූලව කටයුතු කර ඇත.<br><br>1. බී.අයි.ඒ. වීරසේකර මහත්මිය (අංක 13601-0)<br><br>විනය තීරණය "උපදෙස්" ලෙස පනවා ඇත.<br><br>2. එන් මනෝරංජනී මහත්මිය (අංක 11486-8)<br><br>විනය තීරණය "ප්‍රවේශම් වන්න" ලෙස පනවා ඇත.<br><br>3. ඊ.පී මාන් මහතා (අංක 6062-4)<br>2009.05.12 දින සිට විනය තීරණය "දැඩි අවවාදය" ලෙස පනවා ඇත.<br>විශ්‍රාම වැටුපෙන් සියයට 50 ක් බැංකුවේ රඳවා ඇත (රු. 660,180/36)<br>4. පී.කේ.ඒ.සේනාරත්න මහත්මිය (අංක 8375-8)<br>2009.05.12 දින සිට විනය තීරණය "දැඩි අවවාදය" ලෙස පනවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | විශ්‍රාම යන අවස්ථාවේදී සමානුපාතික වැටුප් වර්ධක අත්හිටුවීම.<br>5. ඩබ්ලිව්.ඕ.එන්.ද සිල්වා මහත්මිය (අංක 13621-8)<br>2009.05.12 දින සිට විනය තීරණය "දැඩි අවවාදය" ලෙස පනවා ඇත.<br>වාර්ෂික වර්ධක දෙකක් අත්හිටුවීම.<br>6. එම්.ඒ.ඊ.එස්.පෙරේරා මහතා (අංක 4334-9)<br>2009.06.04 දින සිට ඔහුගේ වැඩ තහනම් කර ඇති අතර චෝදනා 30 කින් සමන්විත චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත. ඔහු චෝදනා 26 කට වගකිව යුතු බවට හඳුනාගෙන ඇති අතර පහත සඳහන් විනය තීරණ පනවා ඇත.<br>• 2009.06.04 දින සිට ඔහු බැංකුවේ සේවයෙන් ඉවත් කර ඇත.<br>• බැංකුවට සිදුවූ පාඩුව අයකර ගැනීම සඳහා පාරිතෝෂික ප්‍රතිලාභය රඳවා තබා ඇත.<br>මේ අතර ලිබර්ටි ප්ලාසා ශාඛාවේ හිටපු කළමනාකරු පෙරේරා මහතා විසින් බැංකුවට එරෙහිව කම්කරු විනිශ්චය සභාව හමුවේ නඩුවක් පවරා ඇති අතර දැනට උසාවියේ පවතින නඩුවේ තීන්දුව ලැබෙන තෙක් නඩුව පවරා ඇත. |
| 06 | බැංකුව සහ හිටපු ප්‍රධාන විධායක නිලධාරියා අතර ඇති ගිවිසුමත් එම්එස්එල් (පුද්) සමාගමේ වැටුප් විස්තරයත් සමඟ සසඳන විට හිටපු ප්‍රධාන විධායක නිලධාරියාට | හිමිකම් ලබන ගෙවීම් සඳහා දැඩි ලෙස අනුගත විය | කරුණාකර වත්මන් තත්ත්වය තීරුව යටතේ | රු.12,049,451 ක් (එනම් අතිරික්ත ගෙවීම් ලෙස) සහ රු. 2,505,060 ක් (එනම් හිඟ වැටුප් ගෙවීම් ලෙස) හිටපු |

| | | | | |
|---|---|---|---|---|
| | රු.12,049,451 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, මාසික වැටුපට අමතරව 2005 නොවැම්බර් සිට 2017 ඔක්තෝබර් දක්වා රු.2,505,060 ක් හිඟ වැටුප් ලෙස බැංකුව විසින් ඔහුට ගෙවා තිබුණි. | යුතුය. | ලබා දී ඇති ප්‍රතිචාරය බලන්න. | ප්‍රධාන විධායක නිලධාරී/ සමානාධිකාරී සමඟ ඇති සේවා කොන්ත්‍රාත්තුවේ විධිවිධානවලට අනුකූලව සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍ය අනුමැතිය ඇතිව සිදු කර ඇත. අදාළ සියලුම ලියකියවිලි (එනම් මණ්ඩල පත්‍රිකා/BHRRC පත්‍රිකා) ඔබේ පරීක්ෂාව සඳහා ලේකම් දෙපාර්තමේන්තුවේ ඇත. |
| 07 | 2018 දෙසැම්බර් 31 දිනට ණය හා අත්තිකාරම්වල අයවිය යුතුව ඇති මුළු ශේෂය රු. මිලියන 1,271,018 ක් වූ අතර එයින් රු. මිලියන 31,472 ක් හෝ සියයට 2.48 ක් අක්‍රීය ණය ශේෂයක් ලෙස පෙන්වා ඇත. සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය සමඟ සසඳන විට සමස්ත අක්‍රීය ණය ශේෂය රු. මිලියන 11,899 කින් හෝ සියයට 61 කින් වැඩිවී තිබුණි. | පසුගිය හිඟ මුදල් නිසි ලෙස අය කර ගත යුතු අතර ණය පැහැරහැරීම් වැළැක්වීම සඳහා ණය අනුමත කිරීමට පෙර ගනුදෙනුකරු සහ ඇප පිළිබඳ නිසි ඇගයීමක් සිදු කිරීම අවශ්‍ය වේ. | පහත පියවර ගෙන ඇත;<br>1. සෑම අංශයකින්ම දැනුමැති ප්‍රතිසාධන කාර්ය මණ්ඩලයක් සාක්ෂාත් කර ගැනීම අරමුණු කර ගෙන විස්තීරණ "ඉගෙනුම් සංස්කෘතිය" සංවර්ධනය කරන ලදී.<br>2. බොල් ණය/කපා හරින ලද ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය විධිමත් | 2021.12.31 දිනට දළ ණය සහ අත්තිකාරම් සහ අක්‍රීය ණය කළඹ පිළිවෙලින් රු. මිලියන 1,808,829 ක් සහ රු. මිලියන 59,955 කි. මෙම තත්ත්වය පසුගිය වසර 02 තුළ මෙන් සියයට 3.3 ක අක්‍රීය ණය අනුපාතයක් පිළිබිඹු කරයි. වසර පුරා ක්‍රියාත්මක කරන ලද ආක්‍රමණශීලී ප්‍රතිසාධන යාන්ත්‍රණයේ ප්‍රතිඵලයක් ලෙස මෙය සාක්ෂාත් කර ගන්නා ලදි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කිරීමේ අරමුණින් බොහෝ ප්‍රතිසාධන කාර්යයන් සාර්ථකව බාහිරින් ලබා ගෙන ඇත.<br>3. කාලීන ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට බොහෝ ඉහළ මට්ටමේ මූල පිරිම්/ BELC/ BEIRMC/ CRMC/ BECC පිහිටුවා ඇත. "වැඩකරන සංඥා" මැනීමේ කොටස (පුනරාවර්තන කාල පාඩු | |

| | | | | |
|---|---|---|---|---|
| | | | කළමනාකරණය) සමඟ ණය සහ අත්තිකාරම් කළමනාකරණය කිරීම සඳහා ආරම්භ කරන ලද ක්‍රමවේදය සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කරයි. දළ අක්‍රීය ණය කළමනාකරණය සඳහා ආරම්භ කරන ලද කාලානුරූපී ක්‍රියාකාරී සැලැස්ම අතිශයින් සාර්ථක විය.<br>4. වත්කම්වල ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා විවිධ කළඹ විශ්ලේෂණ සිදු | |

| | | | | |
|---|---|---|---|---|
| | | | කිරීම මගින් CRMC/ BIRMC/ BECC/Board යනාදිය වෙත තත්කාර්ය (ad-hoc) වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.<br>5. DCA, CEO/GM, BECC සහ මණ්ඩලය සමඟ ණය යෝජනා අඛණ්ඩව ඇගයීම සහ නිර්දේශ හා සම්බන්ධ ඕනෑම අවදානමක්, එවැනි අවදානම් අවම කිරීම සඳහා ඉස්මතු කිරීම.<br>6. ආයතනික ණය සම්බන්ධයෙන් | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ඉහත කරුණු වලට අමතරව, පාරිභෝගික සබඳතා කළමනාකරණය කිරීමේදී පොකුරු ක්‍රමය හඳුන්වාදීම මගින් ණය ඇගයීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කර ඇත. සෑම පොකුරක්ම ලිපිගොනු ගණනකින් වෙන් කර ඇති අතර වෙන් කරන ලද පාරිභෝගිකයින් කළමනාකරණය කිරීමේ අවසාන වගකීම සම්බන්ධතා කළමනාකරු | |

<table>
<tr><td></td><td></td><td></td><td>වෙත පැවරේ.</td><td></td></tr>
<tr>
<td>08.</td>
<td><u>සිටි කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම</u><br><br>සුඛෝපභෝගී සහාධිපත්‍ය නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2007 දී බැංකුව මූලිකව රු.මිලියන 350 ක ණය පහසුකමක් ලබාදී තිබුණු අතර හේතු කිහිපයක් නිසා ව්‍යාපෘතිය අසාර්ථක විය. බැංකුව විසින් දැනට පවතින ණය පහසුකම් කිහිපවතාවක්ම ප්‍රතිලේඛණය කර ඇත. පසුව මෙම ව්‍යාපෘතිය සමාගමේ කළමනාකාරිත්වයේ වෙනසක් ඇතිව හෝටල් ව්‍යාපෘතියක් බවට පරිවර්තනය කරන ලදී. ව්‍යාපෘතිය 2015 දෙසැම්බර් මස අවසන්වුවද, ගනුදෙනුකරු විසින් ලබාගෙන ඇති සියලුම ණයයෙ පහසුකම් ගෙවීම පැහැර හැර ඇති අතර ඇපකරය වෙන්දේසි කිරීමට බැංකුව තීරණය කර තිබේ.<br><br>කෙසේවෙතත්, ණය මුදල ප්‍රතිලේඛණය කිරීම සඳහා ගනුදෙනුකරුගේ ඉල්ලීම මත බැංකුව වෙන්දේසිය නතර කර ඇතිබව නිරීක්ෂණය විය. 2018 නොවැම්බර් 12 දින වනවිට පහසුකම් හයකට අයත් මිලියන රු. 890.64 ක හිඟ හිට ඇති ශේෂය අය නොවී පැවතුණි.<br><br>ණය මුදල සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 50 නොඉක්ම විය යුතුය යන විශේෂ කොන්දේසියක් මූලික ණය පහසුකම ලබාදීමේදී බැංකුව විසින් පනවා තිබුණද, සමස්ත ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 50 කට වඩා වැඩි මුළු ණය ප්‍රමාණයක් බැංකුව විසින් ලබා දී ඇත.</td>
<td>හිඟ ශේෂය අයකර ගැනීමට පියවර ගත යුතුය.</td>
<td>පහසුකම් අයකර ගැනීම සඳහා ගණුදෙනුකරු වන් සමඟ අඛණ්ඩ සාකච්ඡා සහ පසු විපරම් සිදු කෙරේ.</td>
<td>මාසික වාරික වශයෙන් ගෙවිය යුතු ප්‍රාග්ධනීකරණය කරන ලද සමුච්චිත ණය පොලී සමඟ සමාගමට ප්‍රදානය කරන ලද රු.මිලියන 732.70 ක මුළු ප්‍රාග්ධන මුදල ප්‍රතිලේඛණය කර ඇත.<br><br>සමාගම විසින් ණය ගෙවීම අක්‍රමවත් ලෙස සිදු කරන අතර බැංකුවට රු. මිලියන 571.3 ක් අයකර ගැනීමට හැකි වූ අතර එය පිළිවෙලින් රු. මිලියන 63 ක් සහ රු. මිලියන 508.03 ක් ප්‍රාග්ධනය සහ පොලිය සඳහා ප්‍රමාණවත් විය. මෙම පහසුකම රු. බිලියන 1.2 ක නිශ්චල වත්කම් සමඟ සම්පූර්ණයෙන්ම සුරක්ෂිත විය.<br><br>2022.02.14 දිනට ලබා දී ඇති පහසුකම්වල වර්තමාන තත්ත්වය පහත පරිදි වේ;<br><br>
<table>
<tr><th>ණය අංකය</th><th>ලබා දුන් මුදල (රු. මිලියන )</th><th>2022.02.14 දිනට ශේෂය (රු. මිලියන )</th></tr>
<tr><td>309 8001 - 1036</td><td>506.2</td><td>495.4</td></tr>
</table>
</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| 3 9 8001 – 1045 | 78.0 | 53.8 |
| 309 8001 - 1679 | 100.0 | 99.3 |
| 3098001 - 1713 | 48.5 | 46.8 |
| 309 8001 - 2044 | 37.5 | 33.3 |
| 309 8001 - 2204 | 194. | 185 0 |
| 309 8001 – 2213 | 14.4 | 12.6 |
| 309 8001 – 2222 | 69.2 | 60.2 |
| 309 8001 – 2231 | 12. | 10.1 |
| | **1060.3** | **996.5** |

ණය ප්‍රතිලේඛණය කරන ලද අතර වාරික නිතිපතා ගෙවනු ලැබේ.

| **2019 වර්ෂය** | | | | |
|---|---|---|---|---|
| **අනු අංකය** | **විගණන නිරීක්ෂණ** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |

| | | | | |
|---|---|---|---|---|
| 01. | ඉහළම අක්‍රීය ගනුදෙනුකරුවන් 20 දෙනාගේ මුළු හිඟ ප්‍රාග්ධන සහ පොලී මුදල 2019 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.මිලියන 20,367.24 ක් සහ රු. මිලියන 26, 039.59 ක් වන අතර එය එදිනට බැංකුවේ අක්‍රීය ණය සහ අත්තිකාරම් වලින් සියයට 22.34 ක් නියෝජනය කරයි. | අක්‍රීය ණය අවම කිරීම සඳහා ඵලදායී පියවර ගත යුතුය. | ____ | අක්‍රීය ණය පහසුකම් අයකර ගැනීම සඳහා අඛණ්ඩ ප්‍රතිසාධන ක්‍රියාමාර්ග ගනිමින් පවතී.<br><br>ඊට අමතරව, ප්‍රතිසාධන ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට සහ ණය කළඹේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට පහත පියවර ගෙන ඇත;<br><br>1. සෑම අංශයකින්ම දැනුමැති ප්‍රතිසාධන කාර්ය මණ්ඩලයක් සාක්ෂාත් කර ගැනීම අරමුණු කර ගෙන විස්තීරණ "ඉගෙනුම් සංස්කෘතිය" සංවර්ධනය කරන ලදි.<br>2. බොල් ණය/කපා හරින ලද ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අරමුණින් බොහෝ ප්‍රතිසාධන කාර්යයන් සාර්ථකව බාහිරින් ලබා ගෙන ඇත.<br>3. කාලීන ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට බොහෝ ඉහළ මට්ටමේ මුල පිරීම්/ BELC/ BEIRMC/ CRMC/ BECC පිහිටුවා ඇත. "වැඩකරන සංඥා" මැනීමේ කොටස (පුනරාවර්තන කාල පාඩු කළමනාකරණය) සමඟ ණය සහ අත්තිකාරම් කළමනාකරණය කිරීම සඳහා ආරම්භ කරන ලද ක්‍රමවේදය සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කරයි. දළ අක්‍රීය ණය කළමනාකරණය සඳහා ආරම්භ කරන ලද කාලානුරූපී ක්‍රියාකාරී සැලැස්ම අතිශයින් සාර්ථක විය.<br>4. වත්කම්වල ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා විවිධ කළඹ විශ්ලේෂණ සිදු කිරීම මගින් CRMC/BIRMC/ BECC/Board යනාදිය වෙත තත්කාර්ය (ad-hoc) වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.<br>5. DCA, CEO/GM, BECC සහ මණ්ඩලය සමඟ ණය යෝජනා අඛණ්ඩව ඇගයීම සහ නිර්දේශ හා සම්බන්ධ ඕනෑම අවදානමක්, එවැනි අවදානම් අවම කිරීම සඳහා ඉස්මතු |

<table>
<tr>
<td></td>
<td></td>
<td></td>
<td></td>
<td>කිරීම.<br>6. ආයතනික ණය සම්බන්ධයෙන් ඉහත කරුණු වලට අමතරව, පාරිභෝගික සබඳතා කළමනාකරණය කිරීමේදී පොකුරු ක්‍රමය හඳුන්වාදීම මගින් ණය අැගයීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කර ඇත. සෑම පොකුරක්ම ලිපිගොනු ගණනකින් වෙන් කර ඇති අතර වෙන් කරන ලද පාරිභෝගිකයින් කළමනාකරණය කිරීමේ අවසාන වගකීම සම්බන්ධතා කළමනාකරු වෙත පැවරේ.</td>
</tr>
<tr>
<td>02.</td>
<td>සමූහයේ නියෝජ්‍ය සභාපතිවරයා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ධුරයක් දැරූ කාලය තුළදී මණ්ඩලයේ අනුමැතිය ඇතිව එම්.ටී.ඩී වෝකර්ස් පීඑල්සී සහ එහි පරිපාලිත සමාගම්වලට විවිධ ණය පැකේජ ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ඉහත ණය පැකේජය යටතේ වූ ණය අක්‍රීය කාණ්ඩයට මාරු කර ඇති අතර 2019 දෙසැම්බර් 31 වන විට හිඟ මුදල් පහත පරිදි වේ.<br><br>
<table>
<tr><th>ණයගැතියාගේ නම</th><th>ප්‍රදානය කරන ලද මුළු මුදල රු.</th><th>2019.12.31 දිනට මුළු හිඟ මුදල රු. (පොළී,දඩ සහ අනෙකුත්)</th></tr>
<tr><td>වෝකර්ස් ඉක්යුප්මන්ට් (පුද්) සමාගම</td><td>298,630,006</td><td>362,860,136</td></tr>
</table>
</td>
<td>ණය අත්පොත සහ චක්‍රලේඛ යටතේ ලබා දී ඇති ණය උපදෙස් වලට අනුකූල වීම සහතික කිරීම.</td>
<td>——</td>
<td>සීඑම්එල් එම්ටීඩී කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් වෙත ලබා දුන් රු. බිලියන 1 ක් සඳහා බැංකුවට පක්ෂව තීන්දුව ලැබුණි. ණය ගත් සමාගම සතු නිශ්චල දේපල 3ක් දැනටමත් කේවියට් තහනම් කර ඇති අතර ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සම්පාදනය කෙරේ.<br><br>වෝකර්ස් පිලිං (පුද්) සමාගම වෙත ලබා දුන් පහසුකම් සඳහා උකස් තැබූ යන්ත්‍ර වෙන්දේසි කර බැංකුව වෙත පවරා දෙන ලදි. එම යන්ත්‍ර ඉවත් කිරීමට සාකච්ඡා සිදුවෙමින් පවතී. මේ සම්බන්ධයෙන්, යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට ලැබුණු රු. මිලියන 150 ක යෝජනාව සලකා බලමින් පවතී.<br><br>වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පනි ඉන්ජිනියරින් (පුද්) සමාගම වෙත ලබා දුන් පහසුකම සඳහා උකස් කරන ලද දේපල වෙන්දේසි කර බැංකුව වෙත පවරා දෙන ලදි. ඉවත්වීමේ දැන්වීමක් යවා ඇත. නෙරපා හැරීමේ නඩුවක් ගොනු කර ඇත.<br><br>ඉතිරි ණය සඳහා නීතිමය කටයුතු සිදු වෙමින් පවතී.<br><br>ඊට අමතරව, සීඑම්එල් එම්ටීඩී කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් හා සම්බන්ධ සම්පූර්ණ ණය සඳහා සහ එම්ටීඩී වෝකර්ස් පී.එල්.සී හි ආයතනික</td>
</tr>
</table>

<table>
<tr>
<td></td>
<td>
<table>
<tr><td>වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පනි ඉන්ජිනියරින් (පුද්) සමාගම</td><td>අනුමත 265,000,000</td><td>35,042,69</td></tr>
<tr><td>වෝකර්ස් පිලිං (පුද්) සමාගම</td><td>570,832,140</td><td>565,174,225</td></tr>
<tr><td>සී.එම්.එල් එම්.ටී.ඩී කන්ස්ට්‍රක්ෂන් සමාගම</td><td>2,762,727,041</td><td>3,278,147,582</td></tr>
<tr><td>එකතුව</td><td></td><td>4,2□1,224,640</td></tr>
</table>
ප්‍රමාණවත් ශක්තිමත් සුරැකුම්පත් ලබා නොගෙන මෙම ණය ලබා දී ඇති හෙයින් සහ යම් යම් අඩුපාඩුකම් ඇති බැවින් අයකර ගැනීමේ හැකියාව සැක සහිත බව තවදුරටත් නිරීක්ෂණය විය.<br>
අනුමත ණය පැකේජයට අනුව, කෙටිකාලීන ණය පහසුකම් ප්‍රදානය කළ දින සිට උපරිම වශයෙන් දින 180 ක් ඇතුළත ආපසු ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මණ්ඩලයේ අනුමතීන් සහිතව සමහර ණය අක්‍රීය ණය තත්ත්වයට ළඟා වූ විට  දිර්ඝ කළ ඇති බව නිරීක්ෂණය විය.
</td>
<td></td>
<td></td>
<td>ඇපකරය යටතේ සුරක්ෂිත කර ඇති ණය සඳහා අදාළ ණය ගැතියන්ගේ/ප්‍රති පාර්ශවයන්ගේ සිදු කරමින් පවතින ඇවර කිරීමේ නඩුවලට දැනටමත් හිමිකම්පා ඇත. තවද, අදාළ අයට එරෙහිව මෙම අදාළ ණය දීමේ බලපෑම්කාරී හැසිරීම සම්බන්ධයෙන් CID වෙතපැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදි.</td>
</tr>
<tr>
<td>03</td>
<td>මණ්ඩලයේ මානව සම්පත් හා වේතන කමිටු (බී.එච්.ආර්.ආර්.සී) පත්‍රිකා අංක 51/2018 ට අනුව, 2018 ඔක්තෝම්බර් 10 වන දින ජොෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ට (එස්.ඩී.ජී.එම්) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ට (ඩී.ජී.එම්) වාහන දීමනාවක් සහිතව නව වාහන ණය යෝජනා ක්‍රමය බී.එච්.ආර්.ආර්.සී විසින් අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා නොගෙන බැංකුව ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇති බවත්, පසුව මණ්ඩලය විසින් එම තීරණය 2019 මැයි 17 වන දින අපරානුමත කර ඇති බවත් නිරීක්ෂණය විය. මණ්ඩලය අපරානුමත කළ දිනට පෙර බැංකුව විසින් එස්.ඩී.ජී.එම් සහ</td>
<td>ඔහුන් සතුව හිමිකාරීත්වය පවතින බැවින් දීමනාවක් ලෙස ණය වාරිකය එකතු කිරීමෙන් ණය යෝජනා ක්‍රමයේ පරමාර්ථය සාක්ෂාත් කර ගත හැකිද යන්න නැවත සලකා බැලීම</td>
<td>කරුණාකර වත්මන් තනතුර සඳහා ලබා දී ඇති ප්‍රතිචාරය බලන්න.</td>
<td>මෙම ණය යෝජනා ක්‍රමය 2019/09/30 දින සිට නතර කර ඇත (BHRRC පත්‍රය අංකය - 173/2019)<br><br>මෙම යෝජනා ක්‍රමය යටතේ ආයතනික කළමනාකාරිත්වයට තවදුරටත් නව ණය ප්‍රදානය නොකෙරේ. කෙසේ වෙතත්, මෙම වාහන ණය යෝජනා ක්‍රමයේ නියමයන් සහ කොන්දේසි තවමත් සේවයේ සිටින ආයතනික කළමනාකාරීත්වය සඳහා දැනටමත් ලබා දී ඇති ණය සඳහා තවමත් අදාළ වේ.</td>
</tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | ඩී.ජී.එම් වරුන් සඳහා රු. මිලියන 183.29 ක් වටිනා ණය 10 ක් නිකුත් කර තිබුණි.<br>ඉහත පත්‍රිකාවට අනුව, එස්.ඩී.ජී.එම් සහ ඩී.ජී.එම් වරුන් සඳහා නව ණය යෝජනා ක්‍රම හඳුන්වාදීමේ පරමාර්ථය වන්නේ හිමිකාරිත්වයේ පිරිවැය, නඩත්තුව අඩු කිරීම සහ විධායක නිලධාරීන්ට ඔවුන්ගේ නිල වාහනය හිමි කර ගැනීමට දිරිගැන්වීම සහ පහසුකම් සැලසීම ය.<br>කෙසේ වෙතත්, ඉහත සඳහන් නව ණය යෝජනා ක්‍රමය එහි අරමුණුවලට පටහැනි වන අතර එය ණය වාරිකය, රක්ෂණය සහ වාහනයේ නඩත්තු පිරිවැය ලබා දෙයි. තවද, බැංකුව විසින් දීමනාවක් ලෙස ණය වාරිකය අදාළ සේවකයාගේ වැටුපට එකතු කර ඇති අතර එයින් අදහස් කරන්නේ මුළු පහසුකම නොමිලේ ලබා දෙන බවයි.<br>ඉහත සුදුසුකම් නිර්ණායකයන්ට අමතරව විශ්‍රාම ගැනීමට / කොන්ත්‍රාත් කාලය කල් ඉකුත්වීමට පෙර අවම වශයෙන් අවුරුදු 2 ක සේවා කාලයක් ඇති විධායකයින්ට පමණක් අදාළ වේ.<br>කෙසේ වෙතත්, ඉහත සඳහන් නව ණය යෝජනා ක්‍රමයට අනුකූල නොවී සේවා අංක 107763,107474 සහ 107839 දරණ විධායක නිලධාරීන්ට බැංකුව මෙම පහසුකම ලබා දී තිබුණි. | අවශ්‍ය වේ. | | |
| 04 | බැංකුවට අයත් අංක සී.ජ්.අයි 4646 දරණ වාහනය හිටපු ප්‍රධාන විධායක නිලධාරි (කොන්ත්‍රාත් අංක 50404) විසින් 2019 අප්‍රේල් 15 දින සිට බැංකුවට භාර නොදී භාවිතා කරන බව නිරීක්ෂණය විය. ඒවා රජයට පූර්ණ අයිතිය සතු බැංකුවේ වත්කම් බැවින්, එය රාජ්‍ය වත්කම් අනිසි ලෙස භාවිතා කිරීමට හේතු විය හැකිය. මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා නොගෙන මෙම වාහනය මුදා හරින ලද අතර පසුව මණ්ඩල පත්‍රිකා අංක 315/2020 මගින් 2020 අප්‍රේල් 09 දින පැවැත්වූ මණ්ඩලය රැස්වීමේදී මණ්ඩලය විසින් | නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ක්‍රියාවලිය පසු විපරම් කිරීම අවශ්‍ය වේ. | අවධාරණය කර ඇති සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නව ප්‍රවාහන ප්‍රතිපත්තිය ක් හඳුන්වා දී ඇත (BP 723/2019,2 019.09.30). | පසුගිය කාලයේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරුන්ට විශ්‍රාම යන විට ඔවුන් භාවිත කළ වාහනය “පොත් වටිනාකම” යටතේ මිලදී ගැනීමට අවස්ථාව ලබාදී තිබුණි.<br>2016 වසරේදී බැංකුව විසින් වාහන බැහැර කිරීමේ ප්‍රතිපත්තියක් අනුමත කර ඇති අතර, වසර 7ක සේවා කාලයක් ඇති ආයතනික සාමාජිකයෙකුට ඔහු/ඇය භාවිත කළ වාහනය කිසිදු වියදමකින් තොරව සන්තකයේ තබා ගැනීමට සුදුසුකම් ලබයි. වසන්ත කුමාර් මහතා 2019 අප්‍රේල් මාසයේදී විශ්‍රාම යන විට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය.<br>BHRRC අංක 89/2016 විසින් අනුමත කරන ලද අදාළ ප්‍රතිපත්තිය සලකා |

<table>
<tr>
<td></td>
<td>අපරානුමත කරන ලදි.</td>
<td></td>
<td></td>
<td>බැලීමෙන් අනතුරුව, BP අංක 487/2019 මගින් එය පිළිපැදම ඥානාන්විත බව මණ්ඩලයේ තීරණයක් ගන්නා ලදී. එබැවින් පහත සඳහන් නියමයන් සහ කොන්දේසිවලට යටත්ව ක්ෂය වීමෙන් පසු පොත් වටිනාකම වන රු. 113,698.63 ක මුදලකට අංක CAI 4646 වාහනය N. වසන්ත කුමාර් මහතා වෙත මුදා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදි.<br>1. අංක KM-9238 දරන වාහනයේ අයිතිය ලබා ගැනීම<br>2. 2018.9.30 දිනට මහ බැංකුව ව්‍යවස්ථාපිත විභාගයේදී නැවත නැවතත් අවධාරණය කරන ලද පරිදි ඔහුට වැඩිපුර ගෙවූ ගෙවීම් පියවිය යුතුය.<br>3. වසන්ත කුමාර මහතාට බැංකුවෙන් වෙනත් හිමිකම් පෑමක් නොමැති බව පිළිගැනීම.<br>වසන්ත කුමාර් මහතා විසින් 2019.09.24 වන දින අංක KM-9238 දරන වාහනය බැංකුව වෙත භාර දුන් අතර ඉහත දක්වා ඇති අනෙකුත් කොන්දේසි දෙකද සම්පූර්ණ කර ඇත.<br>ඒ අනුව CAI 4646 දරන වාහනය 2021.07.20 දින හිටපු ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වෙත මාරු කරන ලදි.</td>
</tr>
<tr>
<td>05</td>
<td>පහත සඳහන් අක්‍රීය පහසුකම් කිහිප වතාවක් නැවත සකස් කර ඇතත්, පසුව ගනුදෙනුකරුවන් ගෙවීම් පැහැර හැර ඇති බව නිරීක්ෂණය විය.<br>
<table>
<tr><th>ණය අංක</th><th>ශාඛාව</th><th>ප්‍රදානය කරන ලද මුදල (රු.)</th></tr>
<tr><td>කොටගල වතුයාය</td><td>මූලස්ථානය</td><td>511,000,000</td></tr>
<tr><td>රත්නා ලෝක ටුවර්</td><td>මූලස්ථානය</td><td>16,900,000</td></tr>
</table></td>
<td>එවැනි පහසුකම් පිළිබඳ නව නැවත සකස් කිරීම අනුමත කිරීමට පෙර, එවැනි ගනුදෙනුකරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.</td>
<td>ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශය සටහන් කර ගන්නා ලදි.</td>
<td>
<table>
<tr><th>ණය අංක</th><th>ශාඛාව</th><th>ප්‍රදානය කරන ලද මුදල (රු.)</th><th>වර්තමාන තත්ත්වය</th></tr>
<tr><td>කොටගල වතුයාය</td><td>මූලස්ථානය</td><td>511,000,000</td><td>ක්‍රමවත්</td></tr>
<tr><td>රත්නා ලෝක ටුවර් ඉන්ස්</td><td>මූලස්ථානය</td><td>16,900,000</td><td>අඛණ්ඩව පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස මාස 3ක් සඳහා රු. 100,00/- ක් ගෙවීමට සහ ක්‍රමානුකූලව ගෙවීම වැඩි කිරීමට ගණුදෙනුකරු එකඟ වී ඇත. ඒ</td></tr>
</table></td>
</tr>
</table>

<table>
<tr>
<td></td>
<td>
<table>
<tr><td>ඉන්ස්</td><td></td><td></td></tr>
<tr><td>මයික්‍රෝ එන්ටර්ප්‍රයිසස්</td><td>මුහුදු වීදිය</td><td>75,681,418</td></tr>
<tr><td>ඇම්පියර් ඉලෙක්ට්‍රික් (පුද්) සමාගම</td><td>මුහුදු වීදිය</td><td>22,990,237</td></tr>
</table>
</td>
<td></td>
<td></td>
<td>
<table>
<tr><td></td><td></td><td></td><td>අනුව අඛණ්ඩව මාස 2 ක ගෙවීම් ගෙවා ඇත.</td></tr>
<tr><td>මයික්‍රෝ එන්ටර් ප්‍රයිසස්</td><td>මුහුදු වීදිය</td><td>75,681,418</td><td>නැවත සකස් කර ඇති අතර ගිවිසුමට අනුව ගෙවීම් සිදු කරයි.</td></tr>
<tr><td>ඇම්පියර් ඉලෙක්ට්‍රික් (පුද්) සමාගම</td><td>මුහුදු වීදිය</td><td>22,990,237</td><td>නැවත සකස් කර ඇති අතර ගිවිසුමට අනුව ගෙවීම් සිදු කරයි.</td></tr>
</table>
</td>
</tr>
<tr>
<td>06</td>
<td>2017 සිට 2019 දක්වා කාලය තුළ හයිඩ් පාර්ක් කෝනර් හි යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. 565,445,424 ක වියදමක් දරන ලද නමුත්, එය තාවකාලිකව අත්හිටුවා ඇති අතර මේ දක්වා එය අවසන් කර නොතිබුණි.</td>
<td>පසු විපරම් කිරීම අවශ්‍ය වේ.</td>
<td>-</td>
<td>කළමනාකාරීත්වයේ තීරණයකට අනුව එය තාවකාලිකව අත්හිටුවා තිබූ අතර දැන් ව්‍යාපෘතිය නැවත ආරම්භ කර ඇත.</td>
</tr>
<tr>
<td>07</td>
<td>ඇමරිකානු ඩොලර් මිලියන 11 ක පිරිවැයකට වර්තමාන ප්‍රධාන බැංකුකරණ සැපයුම්කරු වන සිල්වර්ලේක් සමාගමට ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ප්‍රදානය කර ඇත. වාණිජ යෝජනාවට අනුව, ඉහත පිරිවැයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 7.6 ක් සහ ඇමරිකානු ඩොලර් මිලියන 3.4 ක් පිළිවෙලින් ඩිජිටල්කරණය සඳහා සිල්වර්ලේක් ඩිජිටල් ආර්ථිකයට සහ ප්‍රධාන බැංකු වැඩිදියුණු කිරීම සඳහා සිල්වර්ලේක් ස්ප්‍රින්ට් වෙත අනුමත කර ඇත. තවද ඇමරිකානු ඩොලර් මිලියන 3.3137 ක පිරිවැයකට මෙම ව්‍යාපෘතිය සඳහා දෘඩාංග මිලදී ගැනීම සඳහා බැංකුව ජස්ට් ඉන් ටයිම් ටෙක්නොලොජීස් (පුද්) සමාගමට ටෙන්ඩරයක් ප්‍රදානය කර තිබුණි. ගෙවීම් විශ්ලේෂණයට අනුව, ඉහත ව්‍යාපෘතියට ඇතුළත් කර ඇති මොඩියුල සඳහා කරන ලද වෙනස් කිරීමේ ඉල්ලීම් මත පදනම්ව වරින් වර අමතර ගෙවීම් සිදු කළ ඇති බව නිරීක්ෂණය විය. දෘඩාංග මිලදී ගැනීම සඳහා එකඟ වූ පිරිවැයට අමතරව කරන ලද රු. 84,631,716 ක අතිරේක</td>
<td>තෙවන පාර්ශවයකට සත්‍යාපනය කළ හැකි පරිදි අදාළ ලියකියවිලි සමඟ සියලු වියදම් සහතික කිරීම අවශ්‍ය වේ. තවද වියදම්වල අදාළත්වය තහවුරු කර ගැනීමට හැකි විය යුතුය.</td>
<td></td>
<td>අපගේ වාර්තාවලට අනුව රු. 84,631,716/- ක අතිරේක ගෙවීම තුළ සියයට 10 ක බදු ගෙවීමක් කර නොතිබුණි. ජස්ට් ඉන් ටයිම් විසින් නිකුත් කරන ලද 2018/03/04 දිනැති බදු ඉන්වොයිසියට අනුව, සම්පූර්ණ අමතර ගෙවීම ඔවුන්ගේ දඩ හිමිකම් සහ සියයට 10 ක බදු හැර ඔවුන් විසින් දරන ලද අනෙකුත් වියදම් මගින් සමන්විත විය.<br><br>රු.452,725,561/- ක මුදල පහත විස්තර කර ඇති ගෙවීම්වල එකතුව වේ.<br><br>• ඩිජිටල් බැංකුකරණ ව්‍යාපෘතියේ මොඩියුල/අදියර මත සිදු කරන ලද ගෙවීම් (බැංකුව සහ සැපයුම්කරු අතර ඇති ගිවිසුමට අනුව, බැංකුව විසින් දැරිය යුතු බදු සංරචකය.) - රු.151,268,141/-<br>• වෙනස් කිරීමේ ඉල්ලීම් මත සිදු කරන ලද බදු සමග අතිරේක ගෙවීම් - රු.216,825,706/-<br>• ඉහත විස්තර කර ඇති දෘඩාංග ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා කරන ලද අතිරේක ගෙවීම්. (රු. 84,631,716/-)</td>
</tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවීම් සනාථ කිරීම සඳහා විශ්වාසදායක ලියකියවිලි නොමැති බව නිරීක්ෂණය විය. එබැවින් මෙම ව්‍යාපෘතිය සඳහා මෙම වියදමේ අදාළත්වය සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් නොමැත. තවද, බැංකුව විසින් දැරිය යුතු බවට කොන්දේසියක් ඇතුළත් කරමින් දැනටමත් ගිවිසුම අත්සන් කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස, 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 94 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාවෙන් ලබාගත් ලාභය / ආදායම මත සිල්වර්ලේක් සමාගම විසින් ගෙවිය යුතු වන සියයට 10 ක බද්ද මෙම අතිරේක ගෙවීම් තුළ ඇතුළත් විය. මෙය ඔවුන්ගේ ගෙවීමෙන් අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු මුදල වන අතර එය ඇත්ත වශයෙන්ම බැංකුවට වගකීමක් නොවේ. අපගේ ගණනය කිරීම් වලට අනුව, 2019 අගෝස්තු 26 දිනට ව්‍යාපෘතිය සඳහා ගෙවන ලද අතිරේක මුදල රු. 452,725,561 ක් (වාර්ෂික නඩත්තු ගාස්තු හැර) විය. | | | |
| 08 | 2018 ජුලි 17 වන දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී හිටපු ප්‍රධාන විධායක නිලධාරියාගේ සේවා කාලය වයස අවුරුදු 60 න් පසු දීර්ඝ නොකරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිළධාරී/ ගණන්දීමේ නිළධාරී වෙත උපදෙස් දී තිබුණද, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු බැංකුව විසින් ඔහුට අමතර මාස හයක සේවා කාලයක් දීර්ඝ කර තිබුණි. මාස හයක සේවා කාලය දීර්ඝ කිරීමත් සමඟ බැංකුව විසින් ඔහුගේ වැටුප ලෙස රු. 15, 410,266.45 ක පිරිවැයක් දරා තිබුණි. | අදාළ රෙගුලාසි පිළිපැදීම අවශ්‍ය වේ. | කරුණාකර වත්මන් තත්ත්වයට සඳහා ලබා දී ඇති ප්‍රතිචාරය බලන්න. | අනාගතයේදී බැංකුව අදාළ රෙගුලාසිවලට දැඩි ලෙස අනුගත වනු ඇත. |

| **2020** වර්ෂය |
|---|
| |

| අනු අංකය | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| **01** | අවිනිශ්චිත ගිණුම - අපේක්ෂිත ලැබීම් මත සැපයුම්කරුවන්ට ගෙවූ මුදල<br>රු.මිලියන1,643 ක සමුච්චිත වූ ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව වසර දෙකකටත් වඩා හිඟව පැවතුණි. | එම ශේෂ පිළිබඳ නිසි තක්සේරුවක් කිරීම හා හැකි ඉක්මනින් නිරවුල් කිරීම අවශ්‍ය වේ. | මෙම කරුණය 2022 සැප්තැම්බර් 30 දිනට පෙර විසඳා ගැනීමට ඉලක්ක කර ඇත. | |
| **02** | අවිනිශ්චිත ගිණුම - ඉදිකිරීම් ගිවිසුම් මත රඳවාගත් මුදල්<br>එකතුව රු.මිලියන 56.3 ක් වූ ශේෂයෙන් රු. මිලියන 22.6 ක් හෙවත් සියයට 40 ක් වසර 3 වඩා කාලයක් තිස්සේ නොපියවා පැවතුණි. | හැකි ඉක්මනින් නිරවුල් කිරීම අවශ්‍ය වේ. | | කොන්ත්‍රාක්කරුවන් දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. 2022 දෙසැම්බර් 31 දිනට පෙර නිරවුල් කිරීමට ඉලක්ක කර ඇත. |
| **03** | බැංකුව සමාලෝචන වර්ෂය තුළදී ව්‍යාපෘති 2 ක් වෙනුවෙන් සිල්වර් ලංකා ස්ට්‍රක්චර්ස් සර්විසස් සමාගම වෙත රු. 486,202 හා රු. 795,121 බැගින් අත්තිකාරම් මුදල් ගෙවා තිබුණ ද එම ව්‍යාපෘති අත්හැර දමා තිබුණි. | ගනුදෙනු ආර්ථික බවකින් යුක්ත විය යුතුය. | | 2022 සැප්තැම්බර් 30 දිනට පෙර මෙම කාරණය විසඳීමට ඉලක්ක කර ඇත. |
| **04** | බැංකුවේ අලාභ සිදුවීම් සංඛ්‍යාව අඩු වුවද, "බාහිර වංචා" සහ "ගනුදෙනුකරු, නිෂ්පාදන හා ව්‍යාපාර පරිචයන්" යටතේ වර්ගීකරණය කරන ලද පිළිවෙලින් රු.මිලියන. 718.395 ක හා රු.මිලියන. 25.384 ක ප්‍රධාන වංචා දෙකක් හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව අලාභ සිදුවීම්වල වටිනාකම සියයට 812 කින් වැඩි විය. | වංචා අධීක්ෂණය කිරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම හා වැළැක්වීමේ පියවර ලෙස අභ්‍යන්තර පාලන පද්ධතියට දැඩිව අනුගතවීම අවශ්‍ය වේ. | | කඩිනම් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගෙන තිබේ. වීසා/මාස්ටර් කාඩ් අයකිරීම් ක්‍රියාවලියට අනුව, පාරිභෝගික ගිණුම්, රක්ෂණය හා වීසා/ මාස්ටර් කාඩ් සහායක සේවා ගනුදෙනුවලින් රු. මිලියන 713 ක් අයකර ගෙන ඇති අතර ශුද්ධ අලාභය රු. මිලියන 5 ට ආසන්න වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | • ජපානයේ ස්වයංක්‍රීය ඉන්ධන බෙදාහරින්නකු (AFD) හරහා විශේෂිත වෙළඳ වර්ගීකරණ කේතවලින් (MCC) ආරම්භ වූ විදේශීය හරපත් ගනුදෙනු සැලකිය යුතු ප්‍රමාණයක් ඇතුළත් වන ඉහත දක්වන ලද වංචාව අදාල ගනුදෙනුකරුගේ ගිණුම්වලට හරකර නොමැති අතර ගිණුමේ පවතින ශේෂයට වඩා වැඩියෙන් ගනුදෙනු කිරීමට හැකිවිය. කාඩ්පත් පද්ධතියේ ඇති යම් යම් දුර්වලතා හා අභ්‍යන්තර පාලනයන් අනුගමනය නොකිරීම හේතුවෙන් මෙම වංචාසහගත ගනුදෙනු වළක්වා ගැනීමට හා අනාවරණය කර ගැනීමට බැංකුවට නොහැකි විය. | | | |

| | | | | |
|---|---|---|---|---|
| | • . "ගනුදෙනුකරු, නිෂ්පාදන හා ව්‍යාපාර පරිචයන්" යන කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලද ඉහත සඳහන් අලාභ සිදුවීම, සහල් මෝලක නිශ්චිත ජංගම ගිණුමක එකතුව රු. මිලියන 25.384 කට අදාල අවස්ථා 5 කදී භෞතිකව ඉදිරිපත් නොකළ චෙක්පත් එකතු කිරීමකට සම්බන්ධ වේ. විනිමය බිල්පත් ආඥාපනතට අනුව, චෙක්පතක හෝ චෙක්පත වෙනුවට අදාල කළ හැකි යමක පිළිබිඹුවකට (image) එරෙහිව එකතුකිරීමට/ගෙවීමට බාරගැනීම පනත උල්ලංගණය කිරීමක් ලෙස සැලකේ. තවද, බැංකුව පිළිබඳව තබා ඇති විශ්වාසය කඩකිරීම හේතුවෙන් බැංකුවේ ප්‍රතිරූපයට හානි විය. ඒ අනුව, ලංකා සතොස ලිමිටඩ් මෙම සිදුවීම පිළිබඳව පැමිණිලි කර තිබීම හා බැංකුවේ පරිචය පිළිබඳව ඔවුන්ගේ දැඩි සැකය ප්‍රකාශ කර තිබීම මගින් එය පැහැදිලි වේ. එබැවින්, විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධව කරන ලද නීත්‍යානුකූල ක්‍රියාවන්ගේ මගහැරීම හා නොසැලකිල්ල මින් ප්‍රකාශ කරයි. | | | |

| | | | | |
|---|---|---|---|---|
| | • රජය සතු ව්‍යාපාරවලට අයත් ණය හා අත්තිකාරම් හිඟ ශේෂය රු. බිලියන 845 ක් වූ අතර එය බැංකුවේ මුළු ණය හා අත්තිකාරම්වලින් සියයට 49.02 ක් නියෝජනය විය. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 244 ක් හෙවත් සියයට 40.50 ක වැඩිවීමක් පිළිබිඹු විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ වත්කම් පදනම රු.බිලියන 2,230 දක්වා රු. බිලියන 357 කින් හෙවත් සියට 19.04 කින් වැඩි වුවද, සියයට 37.88 ක් රජය සතු ව්‍යාපාරවලට දුන් ණයවලින් නියෝජනය විය. | | | |

| | | | | |
|---|---|---|---|---|
| | • 2020 දෙසැම්බර් 31 දිනට අක්වෙරළ බැංකු ඒකකවල ණය හා අත්තිකාරම් හිඟ ශේෂය රු. මිලියන 374,821 ක් වූ අතර ඉන් රු. මිලියන 329,445 ක් හෙවත් සියයට 87.89 ක් රජය සතු ව්‍යාපාරවලට අයත් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 76,501 ක හෙවත් සියයට 30.24 ක වැඩිවීමකි. එකතුව රු. මිලියන 9,086 ක් හෙවත් සියයට 2.42 ක් අක්‍රීය ණය ශේෂය ලෙස පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී මුළු අක්‍රීය ණය ශේෂය රු. මිලියන 524 කින් හෙවත් සියයට 6.12 කින් වැඩි විය. 2020 දෙසැම්බර් 31 දිනට අක්වෙරළ බැංකු ඒකකවල ඉහළම අක්‍රීය ණය හා අත්තිකාරම් ශේෂ 10 හි වටිනාකම, ප්‍රාග්ධනය රු. මිලියන 4,652 ක් හා පොලිය රු. මිලියන 4,382 ක් සමඟ රු.මිලියන 9,034 ක් වූ අතර එය ඉහත සඳහන් මුළු අක්‍රීය ණය වලින් සියයට 99 ක් නියෝජනය විය. | අක්‍රීය ණය සම්බන්ධයෙන් අඛණ්ඩ පසුවිපරම් කිරීම් අවශ්‍ය වේ. | | පහත හේතුවල ප්‍රතිඵලයක් ලෙස, අක්වෙරළ බැංකු ඒකකවල රජය සතු ව්‍යාපාරවල ණය නිරාවරණය (exposure) 2021 දෙසැම්බර් 31 දිනට සියයට 64 ට අඩු විය.<br>අ. 2021 වර්ෂය තුළදී ඇමෙරිකානු ඩොලර් මිලියන 471 (රු. මිලියන 94,553) ක භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ (DST) විදේශීය මුදල් ණය නිරවුල් කිරීම. මෙමඟින් 2020 දෙසැම්බර් 31 දිනට පැවති ඇමෙරිකානු ඩොලර් මිලියන 650 වැඩි භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ විදේශීය මුදල් ණයදීම්, ඇමෙරිකානු ඩොලර් මිලියන 200 දක්වා අඩු කර ඇත.<br>ආ. 2021 ඔක්තෝබර් 7 දිනැති වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ තීරණය පරිදි, ඇමෙරිකානු ඩොලර් මිලියන 716 ක ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිඟ ණය ප්‍රාග්ධනය අක්වෙරළ බැංකු ඒකකවල සිට දේශීය බැංකු ඒකක වෙත මාරු කිරීම. මෙය වඩා හොඳ ද්‍රවශීලතා කළමනාකරණ අරමුණු වෙනුවෙන් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිශ්කාශනයෙන් පසුව සිදු කරන ලදි. |
| | | | | ඇ. 2021.12.31 දිනට මුළු හිඟ අක්‍රීය ණය, ඇමෙරිකානු ඩොලර් මිලියන 39.68 (රු.මිලියන 7,967) ක් විය. අක්‍රීය ණය තත්ත්වය/තත්ත්වයන් කල් ඇතිව හා හැකිතරම් ඉක්මනින් අයකර/අඩුකර ගැනීමට අයකිරීම් දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ප්‍රයත්නයන් ගනිමින් සිටියි. |

| | | | | |
|---|---|---|---|---|
| **5** | 2020 දෙසැම්බර් 31 දිනට ඉහළම අක්‍රීය ණය 10 හි මුළු හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු.මිලියන 21,902 ක් හා පොලිය රු.මිලියන 25,463 ක් සහිතව රු.මිලියන 47,366 ක් වූ අතර එය මුළු දළ අක්‍රීය ණය හා අත්තිකාරම් ශේෂයෙන් සියයට 40.75 ක් විය. එම ශේෂයෙන් රු.මිලියන 26,568 ක් හෙවත් සියයට 56.1 ක් සඳහා කිසිදු සුරැකුමක් නොමැති අතර රු. මිලියන 2,235 ක් හෙවත් සියයට 4.7 ක් සඳහා ප්‍රමාණවත් සුරැකුම් නොමැත. | | | |

| අංකය | ගනුදෙනුකරුගේ | ප්‍රාග්ධන ශේෂය රු. මි | පොලිය රු. මි | මුළු ශේෂය රු. මි |
|---|---|---|---|---|
| 1 | CML සමූහය | 3,596 | 1,084 | 4,680 |
| 2 | ගෘන්ඩ් මවුන්ටන් ගෲප් | 3,136.9 | 427 | 3,563.9 |
| 3 | සීමාසහිත ඩබ්ලිව් එම් මෙන්ඩිස් සහ සමාගම | 3,063 | 812.7 | 3,875.7 |
| 4 | යශෝධා සමූහය | 3,030.4 | 20,950.2 | 23,980.6 |
| 5 | මිහින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,500.5 | 1.5 | 2,502 |
| 6 | සීමාසහිත හුරවී ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම | 1,785 | 3 3.8 | 2,179 |
| 7 | දයා ඇඟලුම් සමූහය | 1,159.8 | 783.4 | 1,943.2 |
| 8 | නවලෝක සමූහය | 1,577.4 | 121.8 | 1,699.3 |
| 9 | ගුඩ් ෆෙලෝස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1032.5 | 872.7 | 1905.3 |
| 10 | සීමාසහිත නගර ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් (පුද්ගලික) සමාගම | 1,020.9 | 15.5 | 1,036.5 |

| | | | | |
|---|---|---|---|---|
| **06.** | ප්‍රසිද්ධ කරන ලද මූල්‍ය ප්‍රකාශනවල විශ්ලේෂණයට අනුව, බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස සේවක මණ්ඩල වියදම් සියයට 32.79 ක් වූ අතර එය, ලංකා බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව හා හැටන් නැෂනල් බැංකුව වැනි වෙනත් වාණිජ බැංකුවල වාර්තා කළ සියයට 27.24 සිට සියයට 29.72 ක පරාසය සමඟ සැසඳීමේදී ඉහළම අගය නියෝජනය විය. එය, එක් සේවකයකු ලාභයට දක්වන දායකත්වය අඩුවීමට හේතු විය. | සේවකයන් ගේ කාර්යක්ෂම තාවය වැඩිකරන අතරතුර බැංකුවේ අරමුදල් සඵලදායීව භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. | | අදහස් දක්වා නැත. |
| **07.** | 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 03/2016 හි 2 වන ඡේදය ප්‍රකාරව, රජයට අයත් ව්‍යාපාරවල සේවකයන් ඇතුළුව රාජ්‍ය නිලධාරීගේ උපයන විට ගෙවිය යුතු බද්ද, බදු සඳහා යටත් සේවක ඉපයීම්වලින් අඩුකළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව සහ මහජන බැංකුවේ සේවක සංගමය අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම මඟින් සේවකයින්ගේ ආදායම් බදු වගකීම සේවකයින්ගේ වැටුප්වලින් අඩු නොකර බැංකුව විසින් ගෙවීමට නියම කර ඇත. ඒ මත පදනම්ව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා රු. මිලියන 26 ක් උපයන විට ගෙවිය යුතු බදු ලෙස සේවකයන්ගේ ඉපයීම්වලින් අඩු නොකර සේවකයන් වෙනුවෙන් බැංකුව ගෙවා ඇත. | අදාල රෙගුලාසිවල ට අනුගතවීම අවශ්‍ය වේ. | | දශක දෙකකට වඩා වැඩි කාලයක් පුරා රාජ්‍ය බැංකු හා අදාල වෘත්තීය සංගම් අතර ඇතිකර ගත් සාමූහික ගිවිසුම අනුව බැංකුව විසින් දරනු ලබන උපයන විට ගෙවිය යුතු බදු ස්ථිර නියමකිරීමක් වී ඇත. |

## 3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

**1.** ආයතනයේ නම - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

**2.** වර්ෂ සඳහා මතය

| වර්ෂය | මතය |
|---|---|
| 2018 | කරුණක් අවධාරණය කිරීම සහිත තත්ත්වාගණනය නොකළ මතය |
| 2019 | තත්ත්වාගණනය නොකළ මතය |
| 2020 | කරුණක් අවධාරණය කිරීම සහිත තත්ත්වාගණනය නොකළ මතය |

3. අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| **ලාභදායිත්වය** | | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 4.12 | 1.81 | 1.66 |
| ශුද්ධ පොලී ආන්තිකය | 7.07 | 6.85 | 5.39 |
| පොලී ආදායම මත ශුද්ධ පොලී ආදායම | 47.88 | 47.25 | 46.97 |
| මුළු ආදායමට පොලී නොවන ආදායම | 4.62 | 4.18 | 4.81 |
| පොලී ආදායමට පොලී වියදම | 52.12 | 52.75 | 53.03 |
| මෙහෙයුම් වියදම් තුළ කාර්ය මණ්ඩල පිරිවැය | 75.01 | 74.55 | 77.54 |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ | 0.62 | 0.26 | 0.19 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ | 7.30 | 3.33 | 2.67 |
| උත්තෝලන ද්‍රවශීලතාවය | 7.57 | 6.87 | 6.31 |
| | | | |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය | 24.27 | 32.38 | 29.3 |

4. ශුද්ධ වත්කම් තත්ත්වය

| වර්ෂය | රු. |
|---|---|
| 2018 | 14,710,114,630 |
| 2019 | 14,965,321,578 |
| 2020 | 15,114,316,941 |

5. 2018, 2019 සහ 2020 යන වර්ෂයන් සඳහා රජයට ලබා දුන් දායකත්වය

| වර්ෂය | ලාභාංශ (රු.) |
|---|---|
| 2018 | - |
| 2019 | 193,546,847 |
| 2020 | - |

6. කාර්ය මණ්ඩල තත්ත්වය

<table>
<tr><th>ශ්‍රේණිය</th><th colspan="2">2020.12.31 දිනට සේවක සංඛ්‍යාව</th><th>2020.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව</th></tr>
<tr><td>5-I ශ්‍රේණිය</td><td>63</td><td rowspan="7">1352</td><td rowspan="7">1382</td></tr>
<tr><td>5-I ශ්‍රේණිය (අභ්‍යාසලාභියා)</td><td>326</td></tr>
<tr><td>5-II ශ්‍රේණිය</td><td>429</td></tr>
<tr><td>5-III ශ්‍රේණිය</td><td>517</td></tr>
<tr><td>6-I ශ්‍රේණිය</td><td>5</td></tr>
<tr><td>6-II ශ්‍රේණිය</td><td>5</td></tr>
<tr><td>6-III ශ්‍රේණිය</td><td>7</td></tr>
<tr><td>7-I ශ්‍රේණිය</td><td>23</td><td rowspan="3">65</td><td rowspan="3">69</td></tr>
<tr><td>7-II ශ්‍රේණිය</td><td>23</td></tr>
<tr><td>7-III ශ්‍රේණිය</td><td>19</td></tr>
<tr><td>8-I ශ්‍රේණිය</td><td>13</td><td rowspan="6">81</td><td rowspan="6">44</td></tr>
<tr><td>8-II ශ්‍රේණිය</td><td>23</td></tr>
<tr><td>8-III ශ්‍රේණිය</td><td>27</td></tr>
<tr><td>9-I ශ්‍රේණිය</td><td>6</td></tr>
<tr><td>9-II ශ්‍රේණිය</td><td>5</td></tr>
<tr><td>9-III ශ්‍රේණිය</td><td>7</td></tr>
<tr><td>3-I නිළධාරී ශ්‍රේණිය</td><td>424</td><td rowspan="4">1005</td><td rowspan="4">1014</td></tr>
<tr><td>3-II නිළධාරී ශ්‍රේණිය</td><td>196</td></tr>
<tr><td>3-III නිළධාරී ශ්‍රේණිය</td><td>261</td></tr>
<tr><td>IV නිළධාරී ශ්‍රේණිය (කළමනාකරණ අභ්‍යාසලාභියා)</td><td>124</td></tr>
<tr><td>I නිළධාරී ශ්‍රේණිය</td><td>48</td><td>48</td><td>59</td></tr>
<tr><td>II නිළධාරී ශ්‍රේණිය</td><td>74</td><td>74</td><td>102</td></tr>
<tr><td>II විශේෂ ශ්‍රේණිය</td><td>4</td><td>4</td><td>8</td></tr>
<tr><td>III විශේෂ ශ්‍රේණිය</td><td>8</td><td>8</td><td>12</td></tr>
<tr><td>IV විශේෂ ශ්‍රේණිය</td><td>21</td><td>21</td><td>25</td></tr>
<tr><td>එකතුව</td><td>2658</td><td>2658</td><td>2715</td></tr>
</table>

7. පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස පරිපාලන වියදම්

| **විස්තර** | **2020.12.31 දිනට** |
|---|---:|
| පුද්ගල වියදම් | 5,983,362,037 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | 616,792,758 |
| වෙනත් වියදම් | 1,115,987,925 |
| මුළු වියදම් | 7,716,142,720 |
| දළ ආදායම | 24,354,246,869 |
| පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස පරිපාලන වියදම් | 31.7 |

8. ප්‍රධාන විගණන නිරීක්ෂණ

| **1. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම** | | | | |
|---|---|---|---|---|
| **යොමුව** | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ පියවර** | **වර්තමාන තත්ත්වය** |
| 2020 | ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ රු. 11,106,023 ක තොගය සහ රු. 952,007 ක මාර්ගස්ථ තොග සෘණ ශේෂය තහවුරු කිරීම සඳහා සාක්ෂි නොවීය. | තොග වටිනාකමේ නිවැරදිතාවය පරීක්ෂා කිරීම හා අවශ්‍ය ගැලපුම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්න. | සඳහන් කළ තොගය සත්‍යාපනය කිරීම සඳහා GM/CEO විසින් කමිටුවක් නම් කර ඇත. | සත්‍යාපන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. |

<table>
<tr><td colspan="5">2. ලැබිය යුතු මුදල්</td></tr>
<tr><td>යොමුව</td><td>විගණන නිරීක්ෂණය</td><td>විගණකාධිපතිගේ නිර්දේශය</td><td>ආයතනය විසින් ගනුලැබූ පියවර</td><td>වර්තමාන තත්ත්වය</td></tr>
<tr><td>2020 I</td><td>2020 වර්ෂය තුළදී බැංකුව විසින් රු. මිලියන 65,043 වටිනාකමක ණය 704,048 සංඛ්‍යාවක් ලබා දී ඇත. ලබා දුන් මුළු ණය ප්‍රමාණයෙන් ණය 569,819 සංඛ්‍යාවක්</td><td>ණය කළඹ විවිධාංගීකරණය කිරීමට සහ අක්‍රීය ණය අනුපාත මට්ටම අවම වශයෙන් කර්මාන්තයේ සම්මත අනුපාත මට්ටම දක්වා අඩු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.</td><td>ප්‍රාදේශීය සංවර්ධන බැංකුව Covid 19 වසංගතයත් සමඟ ණය කළඹෙහි 2020.12.31 දිනට හිඟ ශේෂය වූ රු. බිලියන 164.50 ට සාපේක්ෂව 2021.12.31 දිනට හිඟ ශේෂය රු. බිලියන 187.05 ක කැපී පෙනෙන</td><td><u>2021 තුළ ණය දීමේ කළඹ</u><br>
<table>
<tr><td>ණය කාණ්ඩය</td><td>ගිණුම් ගණන</td><td>%</td><td>රු. මිලියන</td><td>%</td></tr>
<tr><td>උකස් කිරීම</td><td>573,835</td><td>62</td><td>35,058.48</td><td>30</td></tr>
<tr><td>තැන්පතු වලට එරෙහිව ණය</td><td>32 031</td><td>3</td><td>9,724.01</td><td>8</td></tr>
<tr><td>අනෙකුත්</td><td>313,011</td><td>35</td><td>73,466.38</td><td>62</td></tr>
<tr><td>එකතුව</td><td>918,877</td><td></td><td>118,248.87</td><td></td></tr>
</table></td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | හෝ සියයට 80.9 ක වටිනාකම රු.මිලියන 26,153.4 ක් උකස් අත්තිකාරම් වේ. තවද, මුළු ණය සංඛ්‍යාවෙන් තවත් සියයට 5.1 ක් හෝ ණය 35,697 සංඛ්‍යාවක් තැන්පතු එරෙහි ණය වශයෙන් රු.මිලියන 9,308.6 ලෙස බෙදා දී ඇත. එම නිසා, මුළු ණය ප්‍රමාණයෙන් සියයට 14 ක් හෝ ණය 98,532 සංඛ්‍යාවක් පමණක් වටිනාකම රු.මිලියන 29,580.9 ක් වශයෙන් අනෙකුත් ණය ලෙස බෙදාහැර ඇත. | | වර්ධනයක් වාර්තා කර ඇත. අනෙක් අතට, බැංකුවට 2021 වසර තුළදී රු. බිලියන 118.24 ක ණය මුදලක් ලබා දීමට හැකි වී ඇත. සංවර්ධන බැංකුවක් ලෙස, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව රජයේ සාර්ව ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජයට සහය දක්වයි. | |

| | | | | |
|---|---|---|---|---|
| II. | බැංකුවේ දළ අක්‍රිය ණය අනුපාතය 2016 වසරේ රු. බිලියන 3 ක් හෝ සියයට 2.85 සිට 2020 වසර අවසානයේ දී රු. බිලියන 16.7 ක් හෝ සියයට 10.11 දක්වා අඛණ්ඩව වැඩි වී ඇත. කෙසේ වෙතත්, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා බැංකු අංශයේ සාමාන්‍ය අක්‍රිය ණය අනුපාතය 2020 දෙසැම්බර් 31 වන විට පිළිවෙලින් සියයට 6.8 ක් සහ සියයට 4.9 ක් විය. | | ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ , උපදෙස් වලට අනුකූලව මෙම අක්‍රීය ණය අනුපාතය අඩු කිරීමට කටයුතු කර ඇත. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ගණුදෙනුකරුවන් විවිධ පදනම්වලට වර්ග කළ හැක; එනම්: ආන්තික ගොවීන්, කුඩා වෙළඳුන්, පශු සම්පත් සහ කිරි ගොවීන්, ධීවරයින්, සැලුන් ඇතුළුව රූපලාවන්‍ය, මල් වගාව, ගෙවතු වගාව, ගෘහස්ථ හා ගෘහ කර්මාන්ත, සංචාරක හා සංචාරක ආශ්‍රිත කුඩා පරිමාණ ව්‍යාපාර, MSME සහ ජංගම වෙළඳාම යනාදිය.<br>අපගේ මුළු ණය කළඹට අනුව, ටිකට් ප්‍රමාණය රු. 300,000 ක් පමණ වේ. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් Covid 19 වසංගතයට ගොදුරු විය. එබැවින්, අක්‍රීය ණය අනුපාතය මිණුම් ප්‍රමිති අනුපාතයට වඩා තරමක් ඉහළ මට්ටමක පැවතුනි. 2021.12.31 දිනට අක්‍රීය ණය අනුපාතය සියයට 8.72 කි. |

| **3.** ගෙවිය යුතු ගිණුම් | | | | |
|---|---|---|---|---|
| යොමුව | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ පියවර | වර්තමාන තත්ත්වය |
| 2020 I. | 2006 ඔක්තෝම්බර් 27 දින එස්එම්ඊ බැංකුව සහ මහා භාණ්ඩාගාරය අතර අත්සන් කරන ලද ගිවිසුම සහ එල්ඩීබී සාමාන්‍යාධිකාරීගේ 2019 ජනවාරි 31 දිනැති අංක එල්ඩීබී/අයිඑන්එෆ්/19/035 දරණ ලිපිය අනුව මහවැලි ණය යෝජනා ක්‍රමයේ III අදියර අඛණ්ඩව කරගෙන යාම සඳහා 2009 නොවැම්බර් 12 දින මහවැලි අධිකාරිය විසින් එල්ඩීබී වෙත රු. මිලියන 50 ක් ලබා දී තිබුණි. ඉහත ගිවිසුමේ 2 (අ) සහ (ආ) වගන්තියට අනුව, එල්ඩීබී ණය සියයට 4 ක වාර්ෂික පොලියත් සමඟ වසරක සහන කාලයක්ද ඇතුළුව වසර 5 ක් තුළ වාර්ෂික වාරික 4 කින් ණය ගෙවිය යුතුය. කෙසේ වෙතත්, බැංකුව මේ සම්බන්ධයෙන් අනුකූල නොවී ඇති අතර 2019.04.01 දිනසිට බලපැවැත්වෙන පරිදි ආර්ඩීබී සහ එල්ඩීබී ඒකාබද්ධ කිරීමත් සමඟ වසර 11 කටත් වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශන වල ණය ශේෂය රු. මිලියන 50 ක් ගෙවිය යුතු ශේෂයක් ලෙස පවතී. | අත්සන් කළ ගිවිසුම් වල කොන්දේසි වලට අනුකූලව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | මේ සම්බන්ධයෙන් මහවැලි අධිකාරියේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර අතර හිටපු LDB වෙතින් ලැබිය යුතු ශේෂයන් ඔවුන්ගේ පොත්වල ලැබිය යුතු මුදල් ලෙස දක්වා ඇති බව සහ එබැවින් මහා භාණ්ඩාගාරයට කොටස් නිකුත් කිරීමේ අපගේ සැලසුම මහවැලි අධිකාරිය විසින් මහා භාණ්ඩාගාරය වෙත යොමු කරන බව වාචිකව දන්වා ඇත. | මහවැලි අධිකාරියෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටී. |

| | | | | |
|---|---|---|---|---|
| II. | ණය යෝජනා ක්‍රම/චක්‍රීය අරමුදල් 12 කට අදාළව රු.117,613,802 ක ප්‍රාග්ධන ශේෂයක් සහ රු.72,248,586 ක පොලී ශේෂයක් පියවීමට පියවර ගැනීමකින් තොරව දීර්ඝ කාලයක් තබාගෙන තිබුණි. | තවදුරටත් ප්‍රමාද නොවී ගෙවිය යුතු ගෙවීම් පියවීමට අවශ්‍ය පියවර ගැනීම. | ණය හිඟ ශේෂයන් යොදා ගනිමින් පොදු චක්‍රීය අරමුදලක් නිර්මාණය කිරීම පිළිබඳව සොයා බැලීම සඳහා ALCO ආයතනයේදී පසුගියදා මෙම කරුණ සාකච්ඡා කෙරිණි. | ALCO තීරණය ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| 2018 | ණය ඇපකර වන්දි ශේෂයේ සංයුතිය, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලැබුණු සහ ගෙවන ලද ණය ඇපකර මුදල සහ අයකර ගත් වාරික මුදල් පිළිබඳ විස්තර ලබා ගත නොහැක. 2015 සිට 2019 මාර්තු දක්වා වාරික අයකර නොගැනීම් හේතුවෙන් CG 1 සහ CG 2 ආපසු ගෙවීම් ලෙස මහ බැංකුවට රු. 25,371,311 ක් ගෙවා ඇත. | සුදුසු සැසඳුම් සකස් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති අදාල උපදෙස් වලට අනුගත වීම අවශ්‍ය වේ. | මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන් ට අනුකූලව මෙම ගැටළුව සමථයකට පත් කිරීමට කටයුතු කරමින් පවතී | 2022.02.22 දිනට රු.22,777,998.58 ක ශේෂයක් පවතී. |

| **4.** අත්තිකාරම් | | | | |
|---|---|---|---|---|
| **යොමුව** | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ පියවර** | **වර්තමාන තත්ත්වය** |
| 2020 I (i) | වසා දැමූ ඇඟලුම් කම්හල වසා දැමූ ඇඟලුම් කම්හල සඳහා ලැබුණු රු. 700,000,000 ක මුදලින්, එල්ඩීබී විසින් බෙදාහැර තිබුණේ රු.580,865,369 ක් පමණක් වූ අතර රු.119,134,631 ක් බෙදාහැරීමකින් හෝ භාණ්ඩාගාරයට ආපසු | ණය හිඟ ශේෂයන් අයකර ගැනීමට සහ එකතු කළ මුදල් මහා භාණ්ඩාගාරයට යැවීමට අවශ්‍ය පියවර ගැනීම. | ට්‍රයි ස්ටාර් ඇඟලුම් කම්හල සඳහා ලැබුණු මුදලින් රු. මිලියන 700 න්, පෙර පැවති එල්ඩීබී විසින් මූලිකව රු. මිලියන 550 ක් සහ රජයේ වාණිජ බැංකුවක් හරහා මුදල් බෙදාහැරීමක් | මහ භාණ්ඩාගාරයේ එකඟතාවයට යටත්ව මහා භාණ්ඩාගාරයට සාමාන්‍ය කොටස් නිකුතුවක් යෝජනා කරමින් මෙම කරුණ සමඟ යා යුතු මහවැලි අධිකාරියේ පොරොත්තු කාරණයද ඇතුළත් මණ්ඩල පත්‍රිකාවක් 2022 පෙබරවාරි මාසයේදී ඉදිරිපත් කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවීමකින් තොරව බැංකුව තුළ පවතී. | | සිදුනොවන රු.මිලියන 150 ක් වූ චක්‍රීය වෙළඳ මූල්‍ය පහසුකමක් (ණයවර ලිපි පහසුකම් ද ඇතුළත්ව) ලබාදී තිබුණි. එම සමාගම වෙළඳ මූල්‍ය පහසුකමෙන් රු. මිලියන 30.87 ක් භාවිතා කර ඇති අතර පියවීම නියමිත වන විට පැහැර හැර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු. මිලියන 30.87 ක් ද එම සමාගමට මුදල් බෙදාහැරීමක් ලෙස සැලකූ අතර එම පහසුකම හරහා තවදුරටත් ගනුදෙනු සිදු නොවීය. එම නිසා, ඉතිරි මුදල වූ රු. මිලියන 119.13 එම සමාගමට ලබාදීමට අවශ්‍ය නොවේ. | |
| (ii) | තවද, ඉහත කැබිනට් සංදේශයේ 7 වන වගන්තියට පටහැනිව, වසා දැමූ ඇඟලුම් කම්හලෙන් රු.25,500,000 ක් වූ මුළු එකතුකිරීම් වලින් රු.5,500,000 ක් භාණ්ඩාගාරයට නොගෙවා එල්ඩීබී විසින් රඳවාගෙන තිබුණි. | | පෙර පැවති එල්ඩීබී විසින් ට්‍රයි ස්ටාර් ඇඟලුම් කම්හලෙන් එකතු කර ගත් රු.මිලියන 20 ක් මහා භාණ්ඩාගාරයට යවන ලදි. ඊට අමතරව, ණය කාලය තුළදී වාරික වශයෙන් සමාගමෙන් එකතු කරන ලද තවත් රු. මිලියන 5.5 ක් මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතුය. එකඟ වූ පරිදි සමාගමෙන් තවදුරටත් ගෙවීම් අපේක්ෂා කල අතර | |

| | | | | |
|---|---|---|---|---|
| | | | පෙර පැවති එල්ඩීබී විසින් එම මුදල සුළු මුදලක් බැවින් තාවකාලිකව රඳවාගෙන තිබූ අතර එම මුදල පොත්වල මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලෙස පෙන්වා ඇත. | |
| II. (i) | වෙනත් කර්මාන්ත ශාලා අනෙකුත් කර්මාන්තශාලා සඳහා ලැබුණු මුදල වූ රු. 50,000,000 න්, අනුමත පහසුකම රු.49,000,000 කි. කෙසේ වෙතත්, එල්ඩීබී හි ගණුදෙනුකරුවන්ගේ ණය ප්‍රකාශනවලට අනුව සමාගම් සඳහා බෙදා දී ඇත්තේ රු. 25,354,516.92 ක් පමණි. | | ලැබුණු රු.මිලියන 50 න් රු. මිලියන 49 ක මුදලක් ලබා දීමට නියමිතව තිබුණද යෝජිත ඇතැම් පහසුකම් වල අසතුටුදායක ණය සුදුසුකම් හේතුවෙන් රු.25,354,516.92 ක් පමණක් ලබා දෙන ලදී. | |
| (ii) | ඉහත කැබිනට් සංදේශයේ 7 වන වගන්තියට පටහැනිව, වෙනත් කර්මාන්ත ශාලා වලින් එකතු කරන ලද රු. 16,000,481.92 ක මුදල් භාණ්ඩාගාරයට ආපසු ගෙවීමකින් තොරව බැංකුව විසින් තබාගෙන තිබුණි. | | අයකර ගැනීමේ ක්‍රියාවලිය මඟින් රු. 16,000,482 ක් අයකර ගෙන ඇති අතර කෙසේ වෙතත් ආපසු අයකර ගත් මුදල් මහා භාණ්ඩාගාරය වෙත ලබා දී නොමැත. මෙම මුදල ද ආර්ඩීබී ගිණුම්වල මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු වශයෙන් දක්වා ඇති අතර වසා දමා ඇති ඇහලුම් කම්හල් නැවත විවෘත කිරීම යටතේ, මහා භාණ්ඩාගාර පොත්වලට අනුව පෙර පැවති එල්ඩීබී වෙතින් කිසිදු මුදලක් ගෙවිය යුතු නැති බව හෙළිදරව් විය. | |

| | | | | |
|---|---|---|---|---|
| | | | එබැවින් ගෙවිය යුතු ශේෂයන් සඳහා මහා භාණ්ඩාගාරයට සාමාන්‍ය කොටස් නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ඇත. | |

| **5. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම** | | | | | |
|---|---|---|---|---|---|
| **යොමුව** | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ පියවර** | **වර්තමාන තත්ත්වය** |
| 2020 I. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව 2.1.1 සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ පීඑෆ් /429 (i) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව බැංකුව විසින් සංවර්ධිත ප්‍රසම්පාදන අත්පොතක් භාවිතා කර ඇත. | අදාල මාර්ගෝපදේශ පිළිපැදීමට අවශ්‍ය පියවර ගැනීම. | | සතියක් ඇතුළත රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යැවිය යුතුය. |

| **6. බදු රෙගුලාසි වලට අනුකූල නොවීම** | | | | |
|---|---|---|---|---|
| **යොමුව** | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ පියවර** | **වර්තමාන තත්ත්වය** |
| 2020 | උපයන විට බදු /ඒපීඅයිටී සෑම සේවායෝජකයෙක්ම ආදායම් බදු ගෙවීමට බැඳී සිටින සෑම සේවකයෙකුගේම කැමැත්ත ඇතිව රැකියාවෙන් ලැබෙන | අදාල නියමයන් වලට අනුගත වීමට අවශ්‍ය පියවර ගන්න. | සේවායෝජකයා විසින් උපයන විට බදු ගෙවීමේ වාසිය, 2010 දී එක් ආයතනයකට සම්බන්ධ වීමට පෙර පළාත් බැංකු හයේ ස්ථිර සේවකයින් විසින් භුක්ති විඳ ඇත. තවද, 2008 අංක 41 | |

| | | | | |
|---|---|---|---|---|
| | ඉපයීමෙන් සහ ලාභයෙන් ආදායම් බදු අඩු කළ යුතුය. 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 03/2016 ට පටහැනිව, බැංකුව අදාළ සේවකයින්ගේ වැටුප් වලින් අඩු කිරීම වෙනුවට සිය සේවකයින් වෙනුවෙන් 2020 වර්ෂය සඳහා රු. 10,064,824.89 ක ඒපීඅයිටී බද්දක් ගෙවා ඇත. | | දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 45(2)(ඩී) වගන්තියේ සඳහන් වන්නේ කලින් ඔවුන් භුක්ති විඳි කොන්දේසිවලට වඩා අවාසිදායක නොවූ කොන්දේසි යටතේ බැංකුව අත්පත් කර ගැනීම සමඟ සේවා නියුක්තිය පිරිනමන බවයි. මෙම පදනම මත සේවකයින්ගේ උපයන විට බදු ගෙවීම වගකීම ආර්ඩීබී බැංකුවේ වියදමක් ලෙස අඛණ්ඩව දරමින් සිටී. මීට අමතරව, බොහෝ රාජ්‍ය බැංකුවලට සේවකයන්ගේ උපයන විට ගෙවීමේ බදු වගකීම අදාළ බැංකුවල වියදමක් ලෙස දැරීමේ ප්‍රතිපත්තියක් තිබෙන බව අපට නිරීක්ෂණය වී ඇත. | |

| **7. කළමනාකරණ අකාර්යක්ෂමතා** | | | | |
|---|---|---|---|---|
| **යොමුව** | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ පියවර** | **වර්තමාන තත්ත්වය** |
| 2020 I (i) | සාමාන්‍යාධිකාරී පත්වීම මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2020.10.26 දිනැති අංක එම්එෆ් 1/බීඔඩී/පීඑස්බී ලිපියට අනුව, වැඩබලන සාමාන්‍යාධිකාරීවරයා ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා පත් කර පීඑස්බී පනතට | තවදුරටත් ප්‍රමාද නොවී සාමාන්‍යාධිකාරී තනතුර සඳහා සුදුසු අයෙකු තෝරා ගැනීම. | | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 පෙබරවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පීඑස්බී හි සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී පත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුකූලව ස්ථිර සේවකයකු බඳවා ගන්නා ලෙස ඉහත ලිපියේ පිටපතක් සහිතව සභාපතිවරයාට දැනුම් දී ඇත. තවද, පීඑස්බී පනතේ 26.1 වගන්තියට අනුව සාමාන්‍යාධිකාරීවරයා පත් කිරීමේ වගකීම මණ්ඩලයට ඇත. කෙසේ වෙතත්, ඉහත වැඩ බලන පත්වීම ලැබී මාස 10 ක් ගතවී ඇතත්, සාමාන්‍යාධිකාරී තනතුර සඳහා සුදුසු සේවකයෙකු බඳවාගෙන නොතිබුණි. | | | |
| (ii) | 2019.12.19 දිනැති 2019 අංක 09 සීබීඑස්එල් විධානයට අනුව, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරීයකු ඔහුගේ/ඇයගේ සේවය නැවැත්වූ දින සිට මාස 6 ක කාලය ඉකුත්වීමට පෙර, වෙනත් බැංකුවක අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් නොකළ යුතුය. කෙසේ වෙතත්, මෙයට පටහැනිව ඉහත වැඩ බලන සාමාන්‍යාධිකාරිවරයා පත් කර තිබුණි. | අදාළ නියමයන්ට අනුකූල වීම සඳහා හැකි සෑම පියවරක්ම ගැනීම. | | වැඩබලන සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී මුදල් අමාත්‍යාංශය විසින් පත් කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලද 2019.12.19 දිනැති 2019 අංක 01 බැංකු පණතේ නිර්ණනය අනුව, බලපත්‍රලාභී බැංකුවල විධායක කටයුතු සිදු කරන ප්‍රධාන විධායක නිලධාරී සහ අනෙකුත් නිලධාරීන් යෝග්‍ය හා උචිත පුද්ගලයින් විය යුතුය. කෙසේ වෙතත්, වැඩබලන සාමාන්‍යාධිකාරීවරයා ගේ යෝග්‍යතාවය සහ උචිතබව විගණනය කළ දින වන විටත් සීබීඑස්එල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, වැඩ බලන සාමාන්‍යාධිකාරීවරයා ගේ පත්වීම 2008 අංක 41 දරන පීඑස්බී පනතේ 26 වන වගන්තියට පටහැනි ය. | අදාළ නිතී සහ රේගුලාසීවලට අනුකූල වීම සඳහා හැකි සෑම පියවරක්ම ගැනීම. | | එවැනි සිදුවීම් වැලැක්වීම සඳහා අවශ්‍ය විධිවිධාන ක්‍රියාත්මක කර ඇති අතර ඉදිරියේදී ආයතනික රාජ්‍ය පිළිවෙත්වලට අනුගත වනු ඇත. |
| (iv) | ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.5.4 වගන්තියට අනුව, ස්ථිර තනතුර සහ වැඩබලන තනතුර යන දෙකෙහිම රාජකාරි කරන නිලධාරියෙකුට වැඩ බලන තනතුරේ මූලික වැටුපෙන් සියයට 25 ක් ගෙවිය යුතුය. ඉහත සඳහන් කරුණු වලට පටහැනිව, 2020.11.25 දිනැති බීඑච්ආර්ආර්සී/2020/එම් -06 /පී 10 හි තීරණය අනුව සාමාන්‍යාධිකාරී තනතුරේ මූලික වැටුපෙන් 1/3 ක් සහ | | | 2015 මාර්තු 25 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව අදාළ දීමනා තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. ඒ අනුව වැඩ බලන සාමාන්‍යාධිකාරී තනතුර සඳහා දීමනා ගෙවීම BHRRC විසින් තීරණය කර ඇති අතර පීඑස්බී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර |

| | | | | |
|---|---|---|---|---|
| | සංග්‍රහ දීමනාවලින් සියයට 50 ක් බැංකුවෙන් ගෙවා ඇත. | | | ඇත. |
| 2020 I (i) | සේවා අංක 1906 ට එරෙහි පරීක්ෂණය වසර 6 ක් පුරා පවත්වා ඇත. පහත දැක්වෙන නිරීක්ෂණ සිදු කෙරේ. ඉහත සේවකයාගේ පරීක්ෂණ සඳහා රු. 357,580 ක (ආසන්න වශයෙන්) පිරිවැය දරා ඇත. මුළු කැඳවීම් 43 න් නිලධාරීන් නොපැමිණීම සහ කල් දැමීම හේතුවෙන් 19 ක්ම කල් ගොස් ඇත. | බැංකු අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව යොදා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. | | මේ වන විට අනවශ්‍ය ප්‍රමාදයන් වැලැක්වීම සඳහා පරීක්ෂණ කාලීනව ලෙස සිදු කෙරේ. |
| (ii) | ඉහත සේවකයා විසින් ඉදිරිපත් කරන ලද රිට් අයදුම්පත සම්බන්ධයෙන් බැංකුව රු.2,203,940 (ආසන්න වශයෙන්) වියදම් කර තිබුණි. කෙසේ වෙතත්, බැංකුව විසින් කරන ලද වියදම් ගෙවන ලෙසට කළ නියෝග කරමින් අභියාචනාධිකරණය එය නිෂ්ප්‍රභ කළ අතර, උසාවියේ අභියාචනයේදී අධිනීතිඥවරයාට සහ ලියාපදිංචි නීතිඥයින්ට ගෙවිය යුතු ගාස්තු පරිමාණය මත පදනම්ව අය කර ගනු ලැබුවේ රු. 40,000 ක් පමණි. තවද, සාමාන්‍ය කාර්යාල වේලාවෙන් පරිබාහිරව වරලත් ගණකාධිකාරීවරයෙකු ලෙස පෞද්ගලික සේවය සඳහා වයඹ සංවර්ධන බැංකුවෙන් ලැබුණු විශේෂ මණ්ඩල | | | බැංකුව නීති උපදෙස් අනුව කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුමැතිය සහ සේවකයාගේ ඉල්ලීම මත, සිදු කෙරෙන පරීක්ෂණ ඉල්ලා අස් කර ගැනීමට මණ්ඩලය තීරණය කර තිබුණි. එම නිසා ඒ සඳහා දැරූ පිරිවැයට කිසිදු අගය එකතු කිරීමක් නොවීය. | | | |

**8. මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| යොමුව | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 2018 | 2018 දෙසැම්බර් 31 දිනට රු.95,664,238ක වටිනාකමක් සහිත ස්ථාවර තැන්පතු මධ්‍යම බැංකු පද්ධතියට ඇතුළත් නොකර මැනුවල් ක්‍රමයට පවත්වා ගෙන තිබුණි. | පද්ධතිය හරහා සියලුම ගනුදෙනු පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. | | බොහෝ තැන්පතු සහතිකවල මුහුණත වටිනාකම නොසැලකිය යුතු තරම් වන අතර බොහෝ තැන්පතු සඳහා ආකර්ෂණීය පොලියක් පවා නොමැති අතර අදාළ ශාඛාවලට පොලිය ලැබේ. මෙම කළඹ ක්‍රමයෙන් පියවෙමින් පවතින අතර 2021.01.31 දිනට පවතින හිඟ ශේෂය රු. 88,420,423.05 කි. පියවීමේ ක්‍රියාවලිය ප්‍රධාන කාර්යාලයේ මුදල් දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලැබේ. |

**9. මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| යොමුව | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| 2020 I. (i) | ණය අනුමත කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකුට සියයට 5 ක පොලියට රු. 4,750,000 ක කාර්ය මණ්ඩල වාහන ණයක් සහ රු.1,536,858.79 ක කාර්ය මණ්ඩල නිවාස ණයක් පිළිවෙලින් 2020.04.23 සහ 2020.02.18 දින බැංකුව විසින් ලබා දී ඇත. පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.<br>2010.12.27 දිනැති අංක 2010/40 දරණ කාර්යාලීය උපදෙස් චක්‍රලේඛයේ (සංවර්ධන ණය) 8 වන වගන්තියට අනුව, සමාන මාසික වාරික වශයෙන් ණය ආපසු ගෙවිය යුතුය. කෙසේ වෙතත්, 2020.04.23 දිනැති ණය ගිවිසුමට අනුව, රු.76,498.43 ක් වන ණය වාරික 39 ක් සහ අවසානයේ එක් වාරිකයක් රු. 2,430,507.77 ක් වශයෙන් වාහන ණය ආපසු ගෙවිය යුතුය. කෙසේ වෙතත්, ඉහත චක්‍රලේඛයට අනුව මාසික වාරිකය රු. 129,167 (ආසන්න වශයෙන්) විය යුතුය. | 2017.11.29 දිනැති අංක 2013-84 දරන චක්‍රලේඛයේ VI වන පරිශිෂ්ටය මඟින් අංක 2013-84 දරණ චක්‍රලේඛයේ II වන පරිශිෂ්ටය අවලංගු කර තිබේ. එම නිසා අදාළ වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අවශ්‍ය පියවර ගෙන චක්‍රලේඛ වලට අනුව ණය වාරික අයකර ගැනීම. තවද බැංකුවේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. | | 2010.12.27 දිනැති අංක:2010-40 චක්‍රලේඛය අනුව; 08 වගන්තිය, සමාන මාසික වාරික ක්‍රමය (EMI) භාවිතා කර ණය අයකර ගත යුතුය. කෙසේ වෙතත්, මෙම ණය මුදල මාස 40 කින් ලබා දී ඇති අතර ණය අයකර ගැනීම පහත පරිදි වේ.<br>සමාන වාරික 39 ක් හරහා මසකට රු. 76,798.43 ක් අයකර ගන්නා අතර ණය කාලය අවසානයදී රු. 2,430,507.77 ක් බැලූන් ගෙවීමක් ලෙස අයකර ගනු ලැබේ.<br>තවද, අවම විශ්‍රාම වයසට අනුකූලව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, අවශ්‍ය නම්, ණය පහසුකම් ගත් සේවකයින් සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමට 2022.01.27 දිනැති අංක 2013-84 (XV) දරන ණය චක්‍රලේඛයක් බැංකුව විසින් නිකුත් කරන ලදි.<br>එබැවින්, මෙම සේවකයා ණය පහසුකම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ඉල්ලීමක් කර ඇති අතර එය බැලූන් ගෙවීමේ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ක්‍රමය සැලකිල්ලට නොගෙන EMI භාවිතයෙන් සිදු කරනු ඇත. මෙම අවස්ථාවෙහිදී, මෙම ඉල්ලීම අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත අතර චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ii) | 2015.04.06 දිනැති අංක 2013-84 දරණ කාර්යාල උපදෙස් චක්‍රලේඛයේ (සංවර්ධන ණය) පරිශිෂ්ටය II හි 4 වන වගන්තිය අනුව, විශේෂ කොන්දේසියක් ලෙස ණය ශේෂය සහ අදාළ පොලී සේවකයාගේ විශ්‍රාම යාමේදී අය කර ගත යුතුය. කෙසේ වෙතත්, මෝටර් රථ ණය ගිවිසුමේ ඉහත කොන්දේසිය සඳහන් වී නොමැති අතර පොලී අනුපාතය සියයට 5 සිට 20 දක්වා වෙනස් කිරීමේ විශේෂ කොන්දේසිය ගැන පමණක් සඳහන් විය. | | | |
| (iii) | අංක 2013/84 දරණ චක්‍රලේඛයේ පරිශිෂ්ටය II හි 5 වන වගන්තිය හා අංක 2011/51 දරණ චක්‍රලේඛයේ පරිශිෂ්ටය IV හි 2-II වන වගන්තිය සඳහන් කරමින් 2020.02.18 දින අළුත් දේපලක් මිලදී ගැනීම සඳහා සියයට 5 පොලී අනුපාතය යටතේ | | | නිවාස ණයක් ලබාගැනීමේ අරමුණ එම නිවසේ ජීවත්වීම මිස වෙනත් අරමුණක් නොවේ. ලබාගත් ණය මුදලින් මිලදී ගත් නිවසේ ඔහු ජීවත් වේ. මුලින් ඉදිකරන ලද නිවස අලුත්වැඩියා කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| | සේවක නිවාස ණය මුදල රු.1,536,858.79 ක් ලබා දී ඇත. කෙසේ වෙතත්, පලාත් බැංකු ඒකාබද්ධ කිරීම හේතුවෙන් පදිංචිය වෙනස් වීම සහ ගංවතුර, භූමිකම්පා හේතුවෙන් වාසස්ථාන සඳහා නුසුදුසු වීමේදී ණය ලබා දීමට ඒවා අදාල වේ. පළාත් බැංකු ඒකාබද්ධ කිරීමට පෙර රු. 1000,000 ක නිවාස ණය තුනක් සහ ඒකාබද්ධ වීමෙන් පසු රු.500,000 තවත් නිවාස ණයක් ඉහත සේවකයා විසින් ලබාගෙන තිබුණි. බැංකුවේ චක්‍රලේඛයන්ට අනුව, මුලින්ම ඉදිකරන ලද නිවසේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා පමණක් අතිරේක ණයක් තක්සේරු කළ හැකිය. | | | සඳහා අමතර ණය මුදලක් ලබා ගන්නේ නම් ඔහුට කාර්යාලය අසල ජීවත් විය නොහැක. මෙය මනුෂික කාරණයක් වන අතර චක්‍රලේඛ මගින් සපයනු ලබන්නේ මාර්ගෝපදේශ පමණි. |
| (iv) | තවද, ඉහත දේපල සඳහා ලියාපදිංචි උකස් බැඳුම්කරය නොතිබුණි. | කෙසේ වෙතත්, ඊට අදාළ ලියාපදිංචි උකස් බැඳුම්කරය ලබා දී නැත. | | ලිපිගොනුව ශාඛාවේ ඇති බැවින් උකස් බැඳුම්කරය ලබා ගැනීමට ඔහුට හැකියාවක් නැත. සටහන් - උකස් කිරීම සඳහා ගිවිසුම පමණක් ලබා ගත හැකිය. |
| 2020 II. | බැංකුවට එරෙහිව සේවකයෙකු ගොනු කළ නඩුවක් සඳහා 2019.08.15 දින සිට බලපැවැත්වෙන පරිදි නැවත සේවයේ පිහිටුවීම සහ රු. 3,720,000 ක හිඟ වැටුප් ගෙවීමට 2019.08.09 දින | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | කම්කරු අධිකරණය විසින් නියෝග කරන ලදී. කම්කරු අධිකරණයේ නියෝගයට එරෙහිව අභියාචනා පෙත්සම 2019.09.12 දින බැංකුව විසින් කර ඇති අතර රු. 5,115,000 බැඳුම්කරයක් ලෙස තැන්පත් කර ඇත. පහත දැක්වෙන නිරීක්ෂණ සිදු කෙරේ.<br><br>අභියාචනයේදී ඉහත නියෝගය අභියෝගයට ලක් කළ හැකි බව නීති අංශයේ අදහස වූ අතර, ඒ අනුව, කම්කරු විනිශ්චය මණ්ඩලයේ නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට සහ නීති උපදේශකගේ නිර්දේශය මත නඩුවේ අභියාචනය ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකුට භාර දීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. කෙසේ වෙතත්, පසුව ප්‍රධාන නීති නිලධාරී සහ නීති උපදේශක සඳහන් කළේ බැංකුවට නව සාක්ෂි ඉදිරිපත් කළ නොහැකි බැවින් සාර්ථක වීමේ අවස්ථා ආන්තික හෝ ඉල්ලුම්කරුට වාසිදායක වීමේ සම්භාවිතාව වැඩි විය හැකි බවයි. එම නිසා, වරින් වර නීති අංශය මගින් විවිධ මත ඉදිරිපත් කිරීම ගැටලුකාරී ය. | ආර්ඩීබී සහ එල්ඩීබී ඒකාබද්ධ කිරීම 2019.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි සිදු කර ඇති අතර එම නිසා නීති අංශයට සියලුම ලිපි ලේඛන සඳහා ප්‍රවේශය ඇත. එම නිසා වරින් වර විවිධ මත පළ කිරීම මණ්ඩලය නොමඟ යැවීමට හේතු විය හැක. නෛතික පසුබිම පිළිබඳව වැඩිදුර විමර්ශනය කිරීම සහ මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව පියවර ගැනීම අවශ්‍ය කෙරේ. | | මෙම නිලධාරියා යළි සේවයේ පිහිටුවන ලෙස LT නියෝග කර ඇත. LT පරීක්ෂණයේදී බැංකුව විසින් ඉදිරිපත් කරන ලද කරුණු සහ නීතිමය ඉදිරිපත් කිරීම්, ඒවා තහවුරු වී නොමැති බැවින් LT විසින් පිළිගෙන නොතිබූ නිසා මෙම නියෝගයට අනුකූල වීම හැර වෙනත් විකල්පයක් බැංකුවට නොතිබුණි. නීතියේ කාල සීමාවන් නිසා අභියාචනා පෙත්සම ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා සමඟ මෙම කරුණු අධ්‍යයනය කළ අවස්ථාවේදී, කරුණු සහ නීතිය මත පදනම්ව අභියාචනයේදී බැංකුව සාර්ථක නොවිය හැකි බව ඔහුගේ අදහස විය. එබැවින් නැවත සේවයේ පිහිටුවීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | ජ්‍යෙෂ්ඨ නීතිඥවරයාට නීති උපදේශක විසින් ඉදිරිපත් කළ ලිපියේ සඳහන් කර ඇත්තේ ඉහත සේවකයා නව සභාපතිවරයා හමු වූ බවත් සභාපතිවරයා මෙම නඩුව සමථයකට පත් කිරීමේ හැකියාව පිළිබඳව නීති අංශයත් සමඟ ඉතා රහසිගතව සාකච්ඡා කළ බවත් ලිපියක් ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයා නීති උපදේශකවරයාට දැනුම් දුන් බවත්ය. ඉහත සඳහන් ලිපියට පිළිතුරක් වශයෙන් සමථයකට පත් වීම ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා විසින් සඳහන් කර තිබුණි. | | | මෙම අදහස් දැක්වීමට අදාළව, නීති උපදේශකවරයාගේ ලිපිය ප්‍රවේශමෙන් අර්ථකථනය කළ යුතු බව බැංකුව අදහසයි. එය ජ්‍යෙෂ්ඨ නීතිඥවරයාට තමාගේම තීරණයක් ගැනීමට මාර්ගෝපදේශයක් ලෙස LT ක්‍රියාදාමයේ ඇතැම් අංශ ඉස්මතු කරයි. ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා සම්පූර්ණ ලිපිගොනුව අධ්‍යයනය කර ස්වාධීනව සිය අවසන් මතය ඉදිරිපත් කර තිබුණි. |
| (iii) | අංක. බීසී/685/2016 යටතේ වෙන්නප්පුව ශාඛාවේ ඉහත කී සිද්ධියට අදාළ ගනුදෙනුව ගැන අල්ලස් කොමිසමට පැමිණිල්ලක් කර තිබූ අතර අනවශ්‍ය ගැටලු වළක්වා ගැනීම සඳහා අල්ලස් කොමිසමෙන් නිශ්කාශන සහතිකයක් ලබා ගන්නා ලෙස මණ්ඩලයෙන් උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත්, එවැනි නිෂ්කාශනයක් ලබා ගත් බවට සාක්ෂි නොවීය. | අදාළ සේවකයා සමඟ එකඟතාවයකට පැමිණීමට පෙර අල්ලස් කොමිසමෙන් අවසරය ලබා ගන්නා ලෙස මණ්ඩලය උපදෙස් ලබා දී ඇත. එම නිසා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව වැඩිදුර පරීක්ෂණ සහ පියවර ගැනීම අවශ්‍ය වේ. | | මණ්ඩල රැස්වීම් සටහන් අංක 2020/2150 හි දෙවන ඡේදය මෙසේය, “මේ සියලු කරුණු සලකා බලා රණතුංග මහතා බැංකුවේ සේවයට ආපසු කැඳවීමට කළමනාකාරීත්වය තීරණය කරන්නේ නම් අනවශ්‍ය විගණන විමසීම් සහ අල්ලස් කොමිසමේ මැදිහත්වීම් ආදියෙන් වළකීම සඳහා එය කිසිදු ගෙවීමකින් තොරව සිදු කළ යුතු බවට නීති |

| | | | | |
|---|---|---|---|---|
| | | | | දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලද අතර අනවශ්‍ය ගැටලු මගහරවා ගැනීම සඳහා මේ සම්බන්ධයෙන් අල්ලස් කොමිසමෙන් නිෂ්කාශන සහතිකයක් ලබා ගන්නා ලෙස ද උපදෙස් දෙනු ලැබේ." ඉන්පසු රණතුංග මහතා පියවීම් කොන්දේසි මත බඳවා ගැනීමට මණ්ඩලය තීරණය කළ අතර මේ අවස්ථාවේදී මණ්ඩලය නිෂ්කාශන සහතිකය පිළිබඳ ගැටලුවක් මතු කර නැත.<br><br>LT තීරණයට අනුකූල වීමට බැංකුව බැඳී සිටින බව අපගේ අදහසයි. තවද මෙම නිලධාරියාට එරෙහිව අල්ලස් චෝදනාවක් ඇති බව කොමිසම දක්වා නොතිබූ අතර නිෂ්කාශන සහතිකයක් ඉල්ලා සිටීම නැවත සේවයේ පිහිටුවීමට කිසිදු බලපෑමක් නැත. අල්ලස් චෝදනා තහවුරු කළ හැකි නම් මෙම නිලධාරියාට |

| | | | | |
|---|---|---|---|---|
| | | | | අධිචෝදනා ඉදිරිපත් කිරීමට කොමිසමට දැන්ද අයිතියක් ඇත. |
| 2019 I. (i) | 2018 මැයි 01 දින සිට 2018 අගෝස්තු 31 දක්වා වූ කාලය තුළ සේවය කළ සභාපතිවරයා විසින්, අනුමත සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 1,358.10 ක් හා රු.319,150 ක පිරිවැය යටතේ මහල් නිවසක් භාවිතා කර ඇත . මෙම කාලය තුලදී අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොතිබුණ බැවින් අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය ලබාදී නොතිබුණ අතර ඉහත හිඟය අයකර ගැනීමට උපදෙස් දී තිබුණි. කෙසේවෙතත්, විගණිත දිනය වන විටද බැංකුව විසින් මෙම හිඟය අයකර ගෙන නොතිබුණි. | කිසිදු ප්‍රමාදයකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව වියදම අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | ඉදිරි පියවර සඳහා නීති දෙපාර්තමේන්තුවෙන් නීති උපදෙස් ලබා ගනී. | |
| 2018 (ii) | 2018 ජූලි සිට සැප්තැම්බර් දක්වා වූ මාස තුනක කාලය සඳහා රු. 73,250 ක මාසික කුලියකට නිවාසයක් ලබා දී තිබූ අතර ඉල්ලා අස්වීම හේතුවෙන් මාසයක් සඳහා වූ හිඟ කුලිය බැංකුව විසින් ගෙවා ඇත. | කිසිදු අනුමත ලිපියක් ලැබී නොමැති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පිළිපැදීමට අවශ්‍ය පියවර ගැනීම. | | එවැනි සිදුවීම් වැලැක්වීම සඳහා අවශ්‍ය විධිවිධාන ක්‍රියාත්මක කර ඇති අතර ඉදිරියේදී සියලුම සභාපතිවරුන් සඳහා දීමනා ගෙවීම සඳහා PED චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කරනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | සභාපතිවරයාට ලබා දී ඇති දීමනා සහ වෙනත් පහසුකම් ගෙවීම සඳහා රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගෙන් අනුමැතිය ලබා ගන්නා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම් දී තිබේ. කෙසේ වෙතත්, එවැනි අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය. | | | එවැනි සිදුවීම් වැලැක්වීම සඳහා අවශ්‍ය විධිවිධාන ක්‍රියාත්මක කර ඇති අතර ඉදිරියේදී සියලුම සභාපතිවරුන් සඳහා දීමනා ගෙවීම සඳහා PED චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කරනු ඇත. |
| 2019 I. (i) | 2018 ඔක්තෝම්බර් 01 සිට පත්කර තිබූ හිටපු සභාපතිවරයා සඳහා, රියදුරු සමඟ රාජකාරී වාහනයක්, සභාපතිවරයාගේ කාර්යාලය සඳහා රියදුරු සමඟ තවත් වාහනයක් සහ ඉහත වාහන දෙකෙන් එකක් සේවා කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට යැවූ විට වාහන සංචිතයේ වාහන දෙකක් ලබාදී තිබුණි. 2018 ඔක්තෝම්බර් සිට 2019 සැප්තැම්බර් දක්වා වූ මාස 12 ක කාලය සඳහා රු. 1,115,289 ක් පිරිවැය වූ ඉන්ධන ලීටර් 8,436.10 ක සභාපතිවරයා විසින් භාවිතා කර තිබුණි. 2015 මැයි 25 දිනැති පීඊඩී චක්‍රලේඛ අංක 1/2015 හි වගන්ති 3.1 අනුව සභාපතිවරයා සඳහා මාසික ඉන්ධන හිමිකම ලීටර 170 ක් වන අතර, ඉහත චක්‍රලේඛයේ සීමාව | අදාල මාර්ගෝපදේශ වලට අනුගත වීමට අවශ්‍ය පියවර ගැනීම. | | එවැනි සිදුවීම් වැලැක්වීම සඳහා අවශ්‍ය විධිවිධාන ක්‍රියාත්මක කර ඇති අතර ඉදිරියේදී සියලුම සභාපතිවරුන් සඳහා දීමනා ගෙවීම සඳහා **PED** චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කරනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉක්මවා ලීටර 6,396.10 ක් ඉහත සභාපතිවරයා විසින් භාවිතා කර තිබුණි. | | | |
| (ii) | පීඊඩී චක්‍රලේඛ අංක 2/2015 හි වගන්ති 2 අනුව, රාජකාරී හා ගෘහස්ථ දුරකථන ඇතුළු සියළුම සන්නිවේදන බිල්පත් මාසික සීමාවට යටත්ව සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා ගෙවනු ලබයි. කෙසේවෙතත්, සභාපති සහ ඒ හා සමාන පහසුකම් හිමිකමැති අනෙකුත් නිලධාරීන් සඳහා කාර්යාල දුරකථන බිල්පත් ඉහත සීමාවෙන් ඉවත් කර බැංකුවේ වියදමක් ලෙස ගෙවා තිබුණි. තවද, සභාපතිවරයා වෙනුවෙන් වෙනත් පුද්ගලයකුගේ දුරකථන බිල්පත් ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. | | | |
| 2018 | 2016 ඔක්තෝබර් 25 දින කැබිනට් තීරණයට අනුව රු. මිලියන 500 ක අරමුදලකින් සවිය ණය යෝජනා ක්‍රමය වයඹ පළාතේ ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, ඉහත යෝජනා ක්‍රමය රජයේ බැංකු සමඟ ක්‍රියාත්මක කිරීමට වූ කැබිනට් තීරණයට පටහැනිව බැංකුව 2017 මාර්තු 10 වන දින වයඹ සංවර්ධන සමුපකාර සමිතිය සමඟ අතිරේක ගිවිසුමක් | කැබිනට් තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලට අනුකූලව ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | නීතිපතිවරයාගේ තීරණයට අනුකූලව ණය යෝජනා ක්‍රමයක් පිහිටුවීමෙන් දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර හැකි ඉක්මනින් අවසන් කිරීමට නියමිතය. | නීතිපතිවරයාගේ නීති මතය අනුව සියලුම පරිපාලන වියදම් අඩුකර අයකිරීමේ අංශයට ලැබෙන මුදල් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවට ලබාදිය යුතු බව දැනුම් දී ඇත. තවද, වයඹ සංවර්ධන සමුපකාර සමිතිය සහ බැංකුව ඇති කර ගත් ගිවිසුම නීත්‍යානුකූල ගිවිසුමක් නොවන |

| | | | | |
|---|---|---|---|---|
| | අත්සන් කර තිබුණි. තවද, ඉහත ගිවිසුම මගින් සියයට 7 ක පොලී ආදායමෙන් 5 ක් ප්‍රේෂණය කිරීමට එකඟ වී ඇති අතර බැංකුව විසින් රාජ්‍ය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජෙනරාල්ගේ 2016 නොවැම්බර් 25 දිනැති ලිපියට පටහැනිව 2019 මාර්තු 31 දක්වා වයඹ සංවර්ධන සමුපකාර සමිතියට රු.22,892,254 ක් ගෙවා ඇත. | | | බවද ඔවුන් දන්වා ඇත. නීත්‍යානුකූල ගිවිසුමක් නොතිබුනේ නම්, සියලුම අරමුදල් චක්‍රීය අරමුදලකට බැර කිරීමට ඉඩ තිබුණි. එබැවින් වයඹ සංවර්ධන සමූපකාර සමිතියේ ගිණුමෙහි හි තබා ඇති සියලුම මුදල් චක්‍රීය අරමුදලකට මාරු කළ යුතුය. |
| 2019 | 2019 මැයි 15 දිනැති සභාපතිවරයාගේ ඉල්ලීම අනුව, සවිය ණය යෝජනා ක්‍රමයේ ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපති නීතිඥවරයෙකුගෙන් රු. 490,000 ගෙවා නීති උපදෙස් ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, 2019 අප්‍රේල් 10 දින නීතිපතිතුමාගේ මතයේ පිටපතක් බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය හරහා ඒ වනවිටත් ලැබී තිබුණ අතර බැංකුවේ නීති උපදේශකවරයෙක්ද සිටී. ජනාධිපති නීතිඥවරයා වෙත සියළුම ලේඛණ ලබා නොදීම හේතුවෙන්, දෙන ලද උපදෙස් ඇතැම් නිරීක්ෂණ හා ගණනය කිරීම්වලට යටත් කර තිබුණි. | අරමුදල් ඵලදායීව යොදා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. | | මෙම මතය විමසා බැලීමේදී කළ විමසීමේදී බැංකුවට සහ එහි නිලධාරීන්ට එරෙහිව අහිතකර ප්‍රකාශ එල්ල වී ඇති බැවින් බැංකුවේ සහ එහි නිලධාරීන්ගේ වැරදි සහ මෙම තත්ත්වයට පිළියම් යෙදීමේ ක්‍රමවේදයක් හඳුනා ගැනීමට නීතිමය මතයක් ලබා ගත යුතු බව සභාපතිවරයාගේ අදහස විය. බැංකුවේ නීති උපදේශකවරයා 2019 අප්‍රේල් 19 දින සිට මාසයක කාලයක් සඳහා අනුමත විදේශ නිවාඩු මත සිටියේය. ඔහු නොමැති අවස්ථාවක නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින් රැස්වීමක් කැඳවා |

| | | | | |
|---|---|---|---|---|
| | එමනිසා, ඉහළ පිරිවැයකට අමතර නීති උපදෙස් ලබා ගැනීම විගණනයට ගැටළු සහගත වේ. | | | තිබූ අතර එහිදීද මේ සම්බන්ධයෙන් බැංකු නිලධාරීන්ට චෝදනා එල්ල විය. |

**10.** හඳුනාගත් පාඩු

| යොමුව | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 2018 | ගන්දර සහ දෙව්නුවර ශාඛාවන්හි රන් භාණ්ඩ උකස් නිලධාරී ලෙස රාජකාරී කටයුතු කරන අතර තුර සේවකයෙකු විසින් රු.7,580,500 ක ප්‍රාග්ධන අලාභයක් සිදු කර තිබුණි. 2015 අගෝස්තු 03 දිනැති ආර්ඩීබී/එස්පී/අයිඑන්වී/ ඒඑල්එස්/ජීඑම්/13/30 විනය නියෝගය අනුව 2013 අගෝස්තු 12 සිට ක්‍රියාත්මක වන පරිදි චූදිත සේවකයා සේවයෙන් ඉවත් කොට තිබුණි. කෙසේ වෙතත්, සිදු වූ පාඩුව අයකර ගැනීම පිළිබඳ ඉහත නියෝගයෙහි සඳහන් කර නොතිබුණි. | චූදිත සේවකයා නිසා බැංකුවට සිදු වූ අලාභය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අදාල විනය නියෝගයෙහි සඳහන් කර නොතිබූ බැවින් බැංකුවට සිදුවූ අලාභය අය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. | | අනුගමනය කළ යුතු ඉදිරි පියවර සඳහා නීති දෙපාර්තමේන්තුවෙන් නීති උපදෙස් ලබා ගනී. |

**11.** මානව සම්පත් කළමනාකරණය

| යොමුව | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 2020 I. (i) | බැංකුවේ වැටුප් සංශෝධනය තීරණය කිරීමේදී අනෙකුත් රාජ්‍ය බැංකුවල වැටුප් සංශෝධනය සලකා බලා ඇත. කෙසේ වෙතත්, වත්කම් පදනම, ලාභ මට්ටම්, සේවක | සේවකයින්ගේ කාර්යක්ෂමතාව ඉහළ නංවමින් බැංකු අරමුදල් ඵලදායීව භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | | පීඑස්බී කළමනාකාරිත්වය සහ වෘත්තීය සමිතිය අතර 2021-2023 සඳහා සාමූහික |

| | | | | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව සහ ශාඛා ගණන සමාන නොවන බැවින් එම බැංකුවල වැටුප් සංශෝධනයන් ආර්ඩීබී සමඟ සෘජුවම අදාළ කරගත නොහැක. බැංකුව වසරකට එක් සේවකයෙකු සඳහා රු. මිලියන 2.25 ක් දරා තිබුණද, 2020 වර්ෂය සඳහා එක් සේවකයෙකුගෙන් උපයා ඇති ලාභය රු. මිලියන 0.15 ක් පමණක් බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අනෙකුත් රජයේ බැංකු විසින් එක් සේවකයෙකුට රු. මිලියන 1.12 සිට රු.මිලියන 2.1 දක්වා ලාභයක් වාර්තා කර ඇත. | | | ගිවිසුම දැනටමත් අත්සන් කර ඇත. විය හැකි පිරිවැය වර්ධක සැලකිල්ලට ගනිමින් PSB මණ්ඩලය සහ මුදල් අමාත්‍යාංශය විසින් වැටුප් සංශෝධනය සහිත මෙම සාමූහික ගිවිසුම අනුමත කරන ලදි. |
| (ii) | ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් පිරිස් පිරිවැය 2020 වර්ෂය සඳහා ඉහළම අගය නියෝජනය කරමින් බැංකුවේ සියයට 61 ක් වූ අතර අනෙකුත් රජයේ බැංකු සියයට 28.56 සිට සියයට 34.72 දක්වා වූ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස පිරිස් පිරිවැය වාර්තා කළහ. | | | |
| 2019 I | **බැංකුවේ වැටුප් සංශෝධන**<br>බැංකුව හා ලංකා බැංකු සේවක සංගමය සමඟ අත්සන් කර ඇති සාමූහික ගිවිසුමට අනුව සෑම අවුරුදු තුනකට | සේවකයින්ගේ කාර්යක්ෂමතාව ඉහළ නංවමින් බැංකු අරමුදල් ඵලදායීව භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | | පීඑස්බී කළමනාකාරිත්වය සහ වෘත්තීය සමිතිය අතර 2021-2023 සඳහා සාමූහික ගිවිසුම දැනටමත් අත්සන් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | වරක් බැංකුවේ වැටුප් සංශෝධනය කරනු ලැබේ. 2015 හා 2018 වැටුප් සංශෝධන දෙකද සමඟ 2014 වර්ෂය අවසානය හා සැසඳීමේදී 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කාර්යමණ්ඩල වියදම් සියයට 97.5 කින් වැඩි වී තිබුණි. | | | විය හැකි පිරිවැය වර්ධක සැලකිල්ලට ගනිමින් PSB මණ්ඩලය සහ මුදල් අමාත්‍යාංශය විසින් වැටුප් සංශෝධනය සහිත මෙම සාමූහික ගිවිසුම අනුමත කරන ලදි. |
| 2019 II. (i) | **සාමාන්‍යාධිකාරීවරයාගේ පත්වීම**<br>ඡන්ද කාලපරිච්ඡේදය තුළදී පත්වීම් සිදු කිරීම තහනම්ව තිබියදී, සැලසුම්කරගත් පරිදි සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට හා සාමාන්‍යාධිකාරීවරයාගේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා සභාපතිවරයා විසින් මැතිවරණ කොමිසම වෙත ඉල්ලීමක් කර තිබුණි. පිළිතුරට අනුව, සැලසුම්කරගත් පරිදි සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සඳහා විරුද්ධත්වයක් නොමැති බව මැතිවරණ කොමිසම විසින් දන්වා තිබුණි. මෙම ලිපිය සැළකිල්ලට ගෙන පත්වීම අනුමත කිරීමක් ලෙස සළකා, 2019 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සාමාන්‍යාධිකාරීවරයා පත්කර තිබුණි. | පවත්නා රෙගුලාසි පිලිපැදීමට අවශ්‍ය පියවර ගැනීම. | | බැංකුව යහපාලන පිළිවෙත්වලට වර්තමානයෙදී අනුගත වේ. |
| (ii) | 2017 පෙබරවාරි 27 දිනැති අංක 2017/92 | ඕනෑම තනතුරකට අයදුම්පත් කැඳවීමෙන් | | බැංකුවේ ජොෂ්ඨ කළමනාකාර |

| | | | | |
|---|---|---|---|---|
| | දරණ චක්‍රලේඛය මඟින් සන්නිවේදනය කරන ලද අනුප්‍රාප්තික සැලසුම් ප්‍රතිපත්තිය අනුව, සහකාර සාමාන්‍යාධිකාරී සහ ඉහළ තනතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම ලෙස අර්ථ දක්වා ඇත. කෙසේවෙතත්, නීතිපති දෙපාර්තමේන්තුවේ මතය අනුව, වර්තමාන සහ පෙර රැකියා ආයතන වල කළමනාකරණ ව්‍යුහය, ප්‍රාග්ධනය සහ සේවක සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැළකිල්ලට ගෙන තිබුණි. ඒ අනුව, ඉහත චක්‍රලේඛයට පටහැනිව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසු ප්‍රධාන කළමනාකරු තනතුර ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පළපුරුද්දක් ලෙස සලකා තිබුණි. | පසු බැංකුවේ පවතින චක්‍රලේඛයට වෙනස්කම් කිරීම තෝරා ගැනීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය පිළිබඳව සැක සහිතවේ. එමනිසා, තෝරා ගැනීමේ මිණුම්දඬු නිතර වෙනස් කිරිමකින් තොරව තෝරා ගැනීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය පියවර ගැනීම. | | මට්ටමේ පළපුරුද්ද සහකාර සාමාන්‍යාධිකාරී සහ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී සහ නියෝජ්‍ය කළමණාකාර මට්ටම් සඳහා ඉහළ තනතුරු ලෙස අර්ථ දැක්වේ. 2021 සැප්තැම්බර් 23 දින මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. |
| (iii) | 2016 අගෝස්තු 08 දිනැති එච්.ආර් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2016/03/03 අනුව සහකාර සාමාන්‍යාධිකාරී හා ඉහළ ශ්‍රේණි සඳහා ලකුණු දීමේ යෝජනා ක්‍රමය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 40 ද අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සඳහා ඉතිරි ලකුණු 60 ද වශයෙන් වෙනස් කර තිබුණි. කෙසේවෙතත්, ඉහත ලකුණු දීමේ යෝජනා ක්‍රමය සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් 8 දෙනෙකු කෙටි ලැයිස්තු | | | සෑම බඳවා ගැනීම් සඳහාම සහ අදාළ ලකුණු පත්‍ර සඳහා මණ්ඩල අනුමැතිය ලබා ගනී. |

| | | | | |
|---|---|---|---|---|
| | ගත කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 60 හා අදාළ සුදුසුකම් සඳහා ලකුණු 40 ද වශයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වෙනස් කර තිබුණි. තවද, තෝරාගත් අයදුම්කරුහට සම්මුඛ පරීක්ෂණය සඳහා ඉහළම ලකුණු ලබාදී තිබූ අතර අනෙකුත් අයදුම්කරුවන් හට ලකුණු 28.33 සිට ලකුණු 32.83 දක්වා පමණක් ලබාදී තිබුණි. | | | |
| 2020 | අනුප්‍රාප්තික සැලැස්ම නිසි ලෙස සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හිස්ව පවතී. | සේවකයින්ගේ නිපුණතා සලකා බලා යාවත්කාලීන අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කිරීමට අවශය පියවර ගැනීම. | | දැනටමත් 2021 දී සමාලෝචනය කර ඇති අතර 2022 දී නැවත සමාලෝචනය කෙරේ. |

## 4. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (එච්.ඩී.එෆ්.සී බැංකුව)

1. **ආයතනයේ නම: ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (එච්.ඩී.එෆ්.සී බැංකුව)**

2. **මතය**

| වර්ෂය | මතය |
|---|---|
| 2018 | තත්ත්වාගණනය නොකළ මතය |
| 2019 | තත්ත්වාගණනය නෙකළ මතය |
| 2020 | තත්ත්වාගණනය නෙකළ මතය |

3. අනුපාත විශ්ලේෂණය

| **ලාභදායිත්වය** | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය | 7.92 | 5.88 | 9.01 |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ | 1.14 | 0.90 | 1.21 |
| සාමාන්‍ය කොටස් හිමියන්ගේ අරමුදල් මත ප්‍රතිලාභය | 12.56 | 9.63 | 12.99 |
| උත්තෝලන | | | |
| ස්කන්ධයට ණය අනුපාතය | 1.39 | 1.34 | 0.96 |
| ද්‍රවශීලතාය | | | |
| ද්‍රවශීල වත්කම් අනුපාතය | 20.56 | 26.07 | 37.2 |
| ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය | | | |
| ස්ථර **i** | 16.41 | 19.14 | 20.20 |
| ස්ථර **ii** | 16.41 | 19.14 | 20.67 |
| ශුද්ධ වත්කම් තත්ත්වය | | | |
| මුළු වත්කම් | 49,285,291,088 | 55,954,646,348 | 61,029,785,590 |
| (මුළු වගකීම්) | (44,528,678,713) | (50,835,538,592) | (55,247,772,835) |
| ශුද්ධ වත්කම් | **4,756,612,375** | **5,119,107,756** | **5,782,012,755** |
| කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම | 73.51 | 79.11 | 89.35 |

4. ශුද්ධ වත්කම් තත්ත්වය

| | | | |
|---|---|---|---|
| මුළු වත්කම් | 49,285,291,088 | 55,954,646,348 | 61,029,785,590 |
| (මුළු වගකීම්) | (44,528,678,713) | (50,835,538,592) | (55,247,772,835) |
| ශුද්ධ වත්කම් | **4,756,612,375** | **5,119,107,756** | **5,782,012,755** |

5. රජයට ලබා දුන් දායකත්වය

| විස්තර | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| ලාභාංශ | -- | -- | -- |

* ලාභාංශ ගෙවා නැත.

6. කාර්ය මණ්ඩල තත්ත්වය

| විස්තරය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව | 638 | 638 | 634 |
| තත්‍ය සේවක සංඛ්‍යාව | 633 | 647 | 640 |

7. පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස පරිපාලන වියදම්

| | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| පරිපාලන වියදම් | 159,295,429 | 76,279,538 | 75,738,535 |
| ආදායම | 2,679,559,629 | 3,307,230,031 | 3,381,152,806 |
| අනුපාතය | **.059** | **.023** | **.022** |
| | | | |

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| **2019 වර්ෂය** | | | | |
| | | | | |
| **නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම** | | | | |
| | | | | |
| බැංකුවේ ණය අයකර ගැනීමේ අත්පොතේ 4.1.1 වගන්තිය | 2019 දෙසැම්බර් 31 දින වන විට පවරාගත් දේපලයටතේ වර්ගීකරණය කර ඇති පොලියත් සමඟ ප්‍රාග්ධනයේ හිඟණය ශේෂය රු.161,951,448කි .එයින් රු. 31,864,980 ක් හෝ සියයට 20 ක් වසර පහක කාලයක් තුළ පැවතුනි. | උකස් ණය ලබා දීමට පෙර දේපලවල ඉඩම් වටිනාකම නිසි ලෙස ඇගයීමට ලක් කළ යුතු අතර හිඟ මුදල අය කර ගැනීමට පියවර ගත යුතුය. | ඉහළ ඉල්ලුමක් ඇති 1995 සිට බැංකුව විසින් පවරා ඇති දේපල දැනටමත් විකුණා ඇත.එහෙත් අවට ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කර නොමැති නිසා දුර්වල ඉල්ලුමක් ඇති වෙනත් දේපල තිබේ, එසේම ඉල්ලුම් කරන මිල ගණන් බැංකු හිඟ මුදල් ආවරණය නොකරයි.කෙසේ වෙතත්, අවම වශයෙන් බැංකු හිඟ මුදල් පියවා ගත හැකි අර්පණයන් අපේක්ෂාවෙන් සිටී. | 2021 දෙසැම්බර් 31 වන දිනට රු. 380,454,546.34 ක පොලිය සමඟ හිඟ ප්‍රාග්ධන ශේෂයන්ට අදාළ දේපල 112 ක් ඇත.<br>අපි රු. 21,346,209.16 ක පොලිය සමඟ හිඟ ප්‍රාග්ධන ශේෂයන්ට අදාළ දේපල 22 ක් විකුණා ඇති අතර එම දේපල අතුරින් රු.3,209,086.19 ක් වූ දේපල 20 ක් වසර පහකට වැඩි කාලයකට අදාලව විය.<br>මායිම් ආරවුල් නිසා දේපල හඳුනා ගැනීම අපහසු වීම හා දේපල ග්‍රාමීය ප්‍රදේශවල පිහිටීම, වසර පහකට වැඩි කාලයක් දේපල පැවතීමට හේතු වී ඇත. |
| **කළමනාකරණ අකාර්යක්ෂමතාව** | | | | |
| අ | වසරක කල්පිරීමේ කාල සීමාවක් සහිතව 2018 ඔක්තෝබර් 01 වන දින එම්ටීඩී වෝකර්ස් පීඑල්සී හි සියයට 11.75 ක අනුපාතයකින් බැංකුව ණයකර සඳහා රු.මිලියන 50.95 ක් ආයෝජනය කර ඇත.කෙසේ | අනාගතයේ දී මෙවැනි තත්වයන් ඇති නොවීමට සුදුසු තීරණ ගත යුතුය. | ලංකා බැංකුව, මහජනබැංකුව සහ අනෙකුත් වාණිජ බැංකු ඇතුළු කර්මාන්තයේ සෙසු බැංකු එම්ටීඩී වෝකර්ස් ණයකර සඳහා ආයෝජනය කර ඇති හෙයින්, එම බැංකු සමඟ සාමූහිකව ආයෝජනය අය කර ගැනීමට HDFC සහභාගී වේ.කෙසේ වෙතත්, HDFC හි, අපි සියයට 100 ක්ම හානිකරණය කර ඇත. | මෙය පැහැර හරින ලද ආයෝජනයක් වන අතර නැවත සකස් කිරීමක් සිදු කර නොමැත. කෙසේ වෙතත්, භාරකාර බැංකුව (BOC) විසින්අයකර ගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. තවද, SLFRS අනුව, ගිවිසුම්ගත පොලිය බැංකුව විසින් හඳුනාගත යුතු අතර, හානිකරණ බලපෑම් හේතුවෙන්, අදාළ උපචිතයන් සම්පූර්ණයෙන් [illegible] හානිකරණය |

| | | | | |
|---|---|---|---|---|
| | වෙතත්, විගණිත දිනය වන විටරු.50,956,700 ක ප්‍රාග්ධනය සහ රු.7,512,188 ක පොළිය සමාගම විසින් ආපසු ගෙවා නොමැත.තවද, නිකුත් කරන සමාගමේ ශ්‍රේණිගත කිරීම 2019 දී පහත හෙලා ඇති අතර 2018 සහ 2019 දී පිළිවෙලින්සෘණ මූල්‍ය තත්ත්වයන් වාර්තා විය.මෙම ආයෝජනයේ අයකර ගැනීමේ හැකියාව සැක සහිත ය.කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 වන විට බැංකුව සියයට සියයක්ම හානිකරණය කර ඇත. | | | කර ඇත. එබැවින්, මෙය මූල්‍ය ප්‍රකාශනවල වැඩි/අඩු දැක්වීමක් නොවේ. |
| ආ | 2016 සැප්තැම්බර් 28 දිනැති අංක ජීසීඑල්/2016/210 චක්‍රලේඛයට අනුව බැංකුව විසින් ඉතා වැදගත් වෘත්තිකයන්ට (VIP) නිවාස ණය පහසුකම් හඳුන්වා දී ඇති අතර රු.282,985,000 ක් වටිනා ණය 140 ක් මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇත.රු.42,255,020 ක් හෝ සියයට | අනාගතයේ මෙවැනි තත්වයන් ඇති නොවීමට අවශ්‍ය වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම ණය යෝජනා ක්‍රමය පළමු වරට 2016 සැප්තැම්බර් මාසයේදී හඳුන්වා දෙන ලදී.සේවාදායකයින්ගෙන් බහුතරයක් නීතිඥයන් විය.ණය ලබා දෙන අවස්ථාවේ දී, නීතිඥයන්ගේ ආදායම අදාළ ප්‍රදේශයේ ශ්‍රී ලංකා නීතිඥයන්ගේ සංගමය විසින් සනාථ කර ඇති අතර, එහිදී නීතිඥයන්යින් සේවය කරමින් සිටි අතර මෙම තහවුරු කිරීම් මත පදනම්ව ණය ලබා දෙන ලදී. බොහෝ නීතිඥයන්යින් ණය | අපි සිවිල් නඩු විධාන අධිකරණය යටතේ සමහර ගනුදෙනුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අදාළ නීතිඥ සංගම්වල සහාය ලබා ගැනීමට නොහැකි නම් අපි එම ක්‍රියාමාර්ගයම ගනු ලැබේ. අපි මේ වන විට මෙම ණය යෝජනා ක්‍රමය තාවකාලිකව අත්හිටුවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | 12 ක් වන ණය දඟහතරක් අක්‍රියව පවතින බව වර්ගීකරණය කර ඇත. සුරැකුම් නොමැති නිසා බැංකුවට ද්විතියික අයකර ගැනීමේ විකල්පයක් නොමැත. | | නොගෙවා ඇත්තේ ඔවුන්ගේ ආදායම නිසා නොව හිතාමතා ය. ගනුදෙනුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පෙර ශ්‍රී ලංකා නීතිඥයන්ගේ සංගමයේ සහාය ලබා ගැනීමෙන් මෙම ණය අය කර ගැනීමට අපි උපරිම උත්සාහයක් දරමු. නමුත් අපි සිවිල් නඩු විභාගය යටතේ සමහර ගනුදෙනුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අපට අදාළ ශ්‍රී ලංකා නීතිඥයන්ගේ සංගම්වල සහාය ලබා ගත නොහැකි නම් අපි එම ක්‍රියාමාර්ගයම ගනිමු. අපි මේ මොහොතේ මෙම ණය යෝජනා ක්‍රමය තාවකාලිකව අත්හිටුවා ඇත. | |
| **මෙහෙයුම් අකාර්යක්ෂමතාව** | | | | |
| ජා-ඇල ශාඛාව මගින් හමුදා නිලධාරීන්ට ලබා දී ඇති ණය | සේවා යෝජකයාගෙන් අදාළ බලතල ලබා නොගෙන පාරිභෝගිකයාගේ ආපසු ගෙවිය හැකි ධාරිතාවය තහවුරු කර නොගෙන ජා-ඇල ශාඛාව හමුදා නිලධාරීන් සඳහා රු.110,700,000 ක් වටිනා ඇපකර ණය 101 ක් ලබා දී ඇත.එමනිසා, මෙම ණය අක්‍රීය කාණ්ඩයට හරවා ඇති අතර 2019 දෙසැම්බර් 31 වන විට මුළු ප්‍රාග්ධන හිඟ ශේෂය රු.98,464,8 | මෙම ණය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. | සමහර හමුදා නිලධාරීන් විසින් සිදු කරන ලද අක්‍රමිකතා හේතුවෙන්, එකඟ වූ පරිදි වැටුප් ප්‍රේෂණ මාරු කර නොමැත.එබැවින් ණය ආපසු අයකර ගැනීමට ප්‍රධාන කළමනාකරු ණය, ප්‍රාදේශීය කළමනාකරු, ශාඛා කළමනාකරු සහ ජෝෂ්ඨ කළමනාකාර අයකර ගැනීම් යන අයගේ අධීක්ෂණය යටතේ පියවර ගෙන තිබේ. | ප්‍රධාන කළමනාකරු ක්‍රෙඩිට්, ප්‍රාදේශීය කළමනාකරු, ශාඛා කළමනාකාර සහ ජොෂ්ඨ කළමණාකරු අයකර ගැනීම් යන අයගේ අධීක්ෂණය යටතේ ණය අයකර ගැනීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | 70 ක් වූ අතර එය ලබා දුන් මුල් ණය ප්‍රමාණයෙන් සියයට 89 කි. ඇපකරුවන්ගෙන් හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා තවදුරටත් සතුටුදායක අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | | |
| කල් බදු පහසුකම් සඳහා අත්තිකාරම් | 2019 දෙසැම්බර් 31 දින වන විට කල්බදු සඳහාවූ මුළු අත්තිකාරම් ශේෂය රු.1,312,448,256 ක් වූ අතර, ඒ වන විට කල්බදු සඳහා අක්‍රීය අත්තිකාරම් ශේෂය රු.167,496,981 ක් හෝ කල්බදු සඳහා වූ අත්තිකාරම් ශේෂයෙන් සියයට 13ක් විය. රු. 221,859,148 ක් වටිනා කල්බදු පහසුකම්174 ක් Watch තත්ත්වය යටතේ වර්ගීකරණය කර ඇති අතර පසුව එය අක්‍රීය තත්වයට පත්වීමේ අවදානමක් ඇති බව නිරීක්ෂණය විය. රු.62,623,507 ක් හෝ සියයට 28 ක් වටිනා කල්බදු පහසුකම් 36 ක් ඇඹිලිපිටිය ශාඛාව නියෝජනය කරයි. | අක්‍රීය ණය ශේෂය අඩු කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. | 2016/12/31 දිනට පහසුකම් 36 කින් මුළු Watch තත්ත්වය යටතේ ප්‍රාග්ධන හිඟය රු.60,586,078.50 කි. එබැවින් 2019 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 60.57 ක Watch තත්ත්වයක් තිබුණද මෙම පහසුකම්වලින් වැඩි ප්‍රමාණයක් අක්‍රීය ණය වෙත මාරු කිරීමේ ප්‍රවණතාවක් නොමැති බව නිරීක්ෂණය කෙරේ.කෙසේ වෙතත් අපි ඇඹිලිපිටිය ශාඛාවට ඔවුන්ගේ Watch කාණ්ඩය අඩු කර එය අධීක්ෂණය කරන ලෙස දැඩි ලෙස උපදෙස් දී ඇත. | Covid 19 වසංගතයේ බලපෑම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට මුළු ලීසිං කළඹ රු. 936,365,592. ක් දක්වා අඩු වී ඇත. ගනුදෙනුකරුවන් විසින් අපරිනත පියවීම් රාශියක් සිදු කළ තිබූ අතර අවදානම සැලකිල්ලට ගනිමින් නව ණය ප්‍රදානය කිරීම සිදු කළ නොමැත. 2021 දෙසැම්බර් 31 වන විට Watch කාණ්ඩය රු. 128,510,686 සහ අක්‍රීය ලීසිං ණය රු. 159,698,619 ක් විය. Watch සහ අක්‍රීය ණය කාණ්ඩ දෙකම 2019 දෙසැම්බර් 31 දිනට සාපේක්ෂව වටිනාකම අනුව අඩු විය. Watch කාණ්ඩය ප්‍රතිශතය අනුව සියයට 14 (2019-17%) දක්වා අඩු විය. අක්‍රීය ණය අනුපාතය 2019 දෙසැම්බර් 31 හා සසඳන විට 2021 දෙසැම්බර් 31 වන විට සියයට 17 දක්වා වැඩි විය. මුළු කල්බදු කළඹ අඩුවීම හේතුවෙන් මෙම වැඩිවීම සිදු විය.<br>කෙසේ වෙතත් මෙය 2021 ජූනි 31 දිනට අක්‍රීය ණය අගය එනම් සියයට 27 හා සසඳන විට අඩු වීමකි. අක්‍රීය ණය අනුපාතය තවදුරටත් අඩු කිරීමට බැංකුව අඛණ්ඩව සෑම |

| | | | | |
|---|---|---|---|---|
| | | | | උත්සාහයක්ම ගනිමින් සිටී. නීතිමය ක්‍රියාමාර්ග සඳහා CBSL සීමාවන් ඉවත් කළ පසු අක්‍රීය ණය තවදුරටත් පහත හෙලීම සඳහා වත්කම් නැවත ලබා ගැනීම ආරම්භ කරනු ඇත. ඇඹිලිපිටිය ශාඛාව 2019 දෙසැම්බර් 31 දිනට සාපේක්ෂව 2021 දෙසැම්බර් 31 වන විට ඔවුන්ගේ Watch ලැයිස්තුව රු. 35,594,231 ක් (අවස්ථා 27) දක්වා අඩු කර ගෙන ඇත. |
| **2020 වර්ෂය** | | | | |
| **නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම** | | | | |
| 1997 අංක 07 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ iv කොටසේ 16 (2) වගන්තිය | බැංකුවේ නිකුත් කල (ප්‍රකාශිත) ප්‍රාග්ධනය රු.මිලියන 1,000 ක් විය යුතුය. කෙසේ වුවද, 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 962 ක් විය. ඉතිරි ප්‍රාග්ධනය සපුරාලීමට බැංකුව කටයුතු කර නොතිබුණි. | අදාළ පනතට අනුකූලවීම සඳහා අවශ්‍ය පියවරගත යුතුය. | මේ පිළිබඳව භාණ්ඩාගාර නිලධාරීන් සමඟ පැවති රැස්වීම් කිහිපයකදී සාකච්ඡාකර ඇති අතර,වාසිදායක පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටි. | මේ පිළිබඳව භාණ්ඩාගාර නිලධාරීන් සමඟ පැවති රැස්වීම් කිහිපයකදී සාකච්ඡාකර ඇති අතර,වාසිදායක පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටි. |
| ශ්‍රී ලංකා මහ බැංකුව (සීබීඑස්එල්) නිකුත් කල 2017 ඔක්තෝම්බර් 26 දිනැති අංක 05 දරන බැංකු පනත් වාධානයේ 02 | 2020 දෙසැම්බර් 31 දින සිට බැංකුවේ අවම ප්‍රාග්ධනය රුපියල් මිලියන 7,500 ක් විය යුතුය. ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා විසින් නිකුත් කරන ලද 2020 මාර්තු 16 දිනැති ලිපියේ 3 වැනි ඡේදයට අනුව, මෙම අවශ්‍යතාවය 2022 අවසානය දක්වා ප්‍රමාද කර තිබුණි. | අදාළ විධානයන්ට අනුකූල වීම සඳහා අවශ්‍ය පියවරගත යුතුය. | අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය වූ රු. මිලියන 7500 සපුරා ගැනිම සඳහා, ලබා දී තිබූ කාලය දීර්ඝ කරගැනීමට බැංකුව ඉල්ලීමක් කර තිබුණි. එසේ වුවද, 2020 මාර්තු 27 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ලිපිය මගින් (අමුණන ලද) නියමිත කාලය 2022 අවසානය දක්වා දීර්ඝ කර ඇත. | අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය වූ රු. මිලියන 7500 සපුරා ගැනිම සඳහා, ලබා දී තිබූ කාලය දීර්ඝ කරගැනීමට බැංකුව ඉල්ලීමක් කර තිබුණි. එසේ වුවද, 2020 මාර්තු 27 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ලිපිය මගින් (අමුණන ලද) නියමිත කාලය 2022 අවසානය දක්වා දීර්ඝ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| වගන්තිය | කෙසේවෙතත්, 2020 වසර අවසාන වන විට රු. මිලියන 5,957 දක්වා පමණක් ප්‍රග්ධනය රැස්කර ගැනීමට බැංකුවට හැකි වී තිබුණි. | | | |
| ශ්‍රී ලංකා මහ බැංකුව (සීබීඑස්එල්) නිකුත් කරන ලද උකස් කිරීමේ නියෝග යේ 15 (7) වගන්තිය | උකස් වෙන්දේසියෙන් ලැබුණු රු. 1,520,408 ක අතිරික්ත මුදල් අදාළ ගනුදෙනුකරුවන් වෙත ආපසු නොදී වසරකට වැඩි කාලයක් සිට පවතින බව නිරීක්ෂණය විය. | අදාළ විධානයන්ට අනුගත වීම අවශ්‍ය වේ. | බැංකුව විසින් අඛණ්ඩව පියවීම් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, 2021 දී ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට අපි බලාපොරොත්තු වේ. | බැංකුව විසින් අඛණ්ඩව පියවීම් ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| **ණය අයකර ගැනීමේ අත් පොත** | | | | |
| 4.1.1 වගන්තිය | බැංකුව විසින් පවරාගෙන ඇති දේපළ කෙටි කාලයක් තුළ වෙන්දේසියකින් විකුණා හිඟ ණය ශේෂය අයකර ගත යුතුය. එයට පටහැනිව, 2020 දෙසැම්බර් 31 දින වන විට පවරා ගත් දේපළ යටතේ වර්ගීකරණය කර ඇති පොලියත් සමඟ ප්‍රාග්ධනයේ හිඟ ණය ශේෂය රු.178,297,149 ක් වූ අතර, ඉන් රු. 36,731,157 ක් හෝ සියයට 20.60 ක් වසර පහකට වැඩි | උකස් ණය ලබා දීමට පෙර දේපලවල ඉඩම් වටිනාකම නිසි ලෙස ඇගයීමට ලක් කළ යුතු අතර හිඟ මුදල අය කර ගැනීමට පියවර ගත යුතුය. | අපගේ වාර්තා වලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට පවරාගත් දේපළ 135 කට අදාළව පොළියත් සමඟ ප්‍රාග්ධනයේ හිඟණය ශේෂය රු.154,856,755.38 කි. පවරාගත් දේපළ විකිණීමේ නව ප්‍රතිපත්තියට අනුව, ප්‍රාග්ධන සමග පොළී ඇතුළත් හිඟ ශේෂයන් රු.21,194,390.35 වටිනාකම ඇති දේපළ 21 ක් අපි විකුණා තිබීම සහ එම දේපළ වලින් රු.3,057,267.38 ක් වටිනා දේපළ 19 ක් වසර පහකට වැඩි කාලයකට අදාළ වේ. තවද, ඉහත සඳහන්රු.178,297,149 ප්‍රාග්ධන, පොළී සහ ප්‍රමාද දඩ මුදල් ද ඇතුළත් වේ. | අපි රු. 21,346,209.16 ක පොලිය සමඟ හිඟ ප්‍රාග්ධන ශේෂයන්ට අදාළ දේපල 22 ක් විකුණා ඇති අතර එම දේපල අතුරින් රු.3,209,086.19 ක් වූ දේපල 20 ක් වසර පහකට වැඩි කාලයකට අදාලව විය. මායිම් ආරවුල් නිසා දේපල හඳුනා ගැනීම අපහසු වීම හා දේපල ග්‍රාමීය ප්‍රදේශවල පිහිටීම, වසර පහකට වැඩි කාලයක් දේපල පැවතීමට හේතු වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාලයක් තිස්සේ පැවතී. | | | |
| 4.1.5 වගන්තිය | පවරා ගත් දේපළ නැවත අගය කිරීම අවම වශයෙන් බාහිර තක්සේරුකරුවෙකු විසින් සෑම වර්ෂ හතරකට වරක් හෝ අභ්‍යන්තර තක්සේරුකරුවෙකු විසින් සෑම වර්ෂ දෙකකට වරක් සිදු කළ යුතුය. කෙසේවුවද, පවරාගත් දේපළ වලට අදාළව පොළිය සමග ප්‍රාග්ධනය හිඟ ශේෂය රු.12,453,423 ක් වර්ෂ 2 සිට 8 දක්වා කාලයක් නැවත තක්සේරු කිරීමකින් තොරව පැවතුණි. | අදාළ අත් පොත (Manual) සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුයි. | අනවශ්‍ය වියදම් වලින් වැළකිම සඳහා, විකිණිය හැකි දේපළ සඳහා ටෙන්ඩර් ලැබීමෙන් පසු පවරා ඇති දේපළ නැවත තක්සේරු කිරීම පසුව සිදු කෙරේ. | අනවශ්‍ය වියදම් වළක්වා ගැනීම සහ දේපලෙහි සීමා මායිම් හඳුනා ගැනීමට අපහසු වීම නිසා ටෙන්ඩර් ලැබීමෙන් පසු පවරා ඇති දේපල නැවත තක්සේරු කිරීම සිදු කෙරේ. |
| 4.1.9 වගන්තිය | ටෙන්ඩරය ලබාගන්නා අවස්ථාවේදී අවම වශයෙන් රු.10,000 ක් ආපසු ගෙවන තැන්පතුවක්ද (Refundable Tender Deposit ), රු.500 ක ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතුවක්ද (Non refundable Tender Deposit) ලබාගතයුතුය. යම් අවස්ථාවකදී ටෙන්ඩර් මණ්ඩලය විසින් ටෙන්ඩර්කරුට | අතිරික්ත මුදල් අදාළ ගනුදෙනුකරුවන්ට ආපසු ගෙවීමට කටයුතු කළ යුතුය. | මේවා අනුමත කිරීමේ ක්‍රියාවලිය යටතේ පවතින අතර, අනුමැතිය ලැබීමෙන් පසු, අවම වශයෙන් 2021 දී බැංකුව විසින් ආපසු ගෙවිය යුතු තැන්පතු අදාළ ගනුදෙනුකරුවන්ට ලබා දෙනු ඇත. | වෙන්දේසි දේපළ සඳහා ලද අත්තිකාරම්වල ඇති බොහෝ ගනුදෙනු හඳුනා ගෙන නොමැති අතර එම මුදල දිගු කාලයක් තිස්සේ පවතී. නව පවරාගත් දේපල ප්‍රතිපත්තියට අනුව, අපි ටෙන්ඩර් තැන්පතු අදාළ ගනුදෙනුකරුවන්ට වහාම ආපසු ගෙවනු ලබයි. |

| | | | | |
|---|---|---|---|---|
| | ටෙන්ඩරය අනුමත නොකළහොත්, සාධාරණ කාලයක් තුළ ටෙන්ඩර් මුදල අදාළ තැන්පත්කරුවන් වෙත ආපසු ලබාදිය යුතුය. කෙසේවුවද, බැංකුව එම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. වෙන්දේසි දේපළ සඳහා වූ අත්තිකාරම් වල (Advanced Received on Auction Properties) රු.7,051,817 ක අතිරික්ත මුදලක් වර්ෂයකට වැඩි කාලයක්, අදාළ ගනුදෙනුකරුවන්ට ආපසු ගෙවීමෙන් තොරව පැවතුණි. | | | |
| **තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම** | | | | |
| භාවිතා නොකළ පරිශීලක ගිණුම් | පොලාරිස් කෝර් බැංකු පද්ධතිය (Polaries - Core Banking System ) තුළ පරිශීලක ගිණුම් 37 ක් දීර්ඝ කාලයක් තුල භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය. එම පරිශීලක ගිණුම් අක්‍රිය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට බැංකුව අපොහොසත් වී තිබුණි. | දිගුකාලයක් භාවිතා නොකළ පරිශීලක ගිණුම් අක්‍රිය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කළමනාකරණ තීරණය මත පදනම්ව, අදාළ පරිශීලකයන් අක්‍රිය කිරීම කරනු ලැබේ. | කළමනාකරණ තීරණයට අනුව, දැනට සිටින සේවකයින් සඳහා පරිශීලක නාම අනාගත භාවිතය සඳහා තිබිය යුතුය. |
| පරිණත විශ්ලේෂ | 2020 දෙසැම්බර් 31 දිනට ඇති මූල්‍ය | අනාගතයේ පරිණත | මෙයට හේතුවී ඇත්තේ වත්කම් සහ බැරකම්වල අදාළ ගිවිසුම් | ඉතිරි වත්කම් සහ බැරකම්වල කල්පිරීම ඒවායේ තත්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| ණය | වත්කම් හා මූල්‍ය වගකීම්වල එකඟ වූ කල්පිරීම්, විශ්ලේෂණය කිරීමෙන් මාස 3 සිට 12 දක්වා වූ මූල්‍ය වගකීම් මුළු වත්කම් වලට වඩා විශාල අතිරික්තයක් පෙන්නුම් කිරීම හා ද්‍රවශීලතා පරතරය රු.මිලියන 7,272 ක් බව අනාවරණය විය. | පරතරය අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | ගත කල්පිරීමයි. | කල්පිරීමේ කාලසීමාව අනුව ඉදිරිපත් කෙරේ. |
| **මෙහෙයුම් සමාලෝචනය** | | | | |
| **හඳුනාගත් පාඩු** | 2018 වර්ෂයේදී ශාඛාවක් විසින් ආයතනයක කාර්ය මණ්ඩලයට වංචනික ණය හතක් ලබාදී තිබූ අතර, පසුව එය ක්‍රියාකාරී නොවන ණය කාණ්ඩයට මාරු කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.8,250,131 වි තිබුණි. | අනාගතයේ දී මෙවැනි තත්ත්වයන් වැළැක්වීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | 801650000408 දරන ණය අංකය හැර, ණයදෙනුකරුවන්ට එරෙහිව පැමිණිල්ලක් තෙල්දෙණිය විශේෂ අපරාධ කොට්ඨාශයට ඉදිරිපත් කිරීම සහ මේ සම්බන්ධයෙන්, මහියංගනය දිසා අධිකරණයේ නඩුව විභාග වේ. | විගණකවරුන්ගේ අදහස් පිළිගනු ලැබේ, මෙම ණය අක්‍රිය වෙත මාරු කිරීමෙන් පසු ණය "වංචනික ණය" බව අපට දැන ගැනීමට හැකි විය. |
| කළමනාකරණ අකාර්යක්ෂමතා | ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා පරිශ්‍රයේ පිහිටි බැංකුව සතු රු. මිලියන 759.5 ක ආයෝජන දේපළ, 2008 දෙසැම්බර් 31 දින දේපළෙහි අයිතිය බැංකුවට පවරා තිබුණද, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව (BMC) විසින් ඉඩමේ හිස් භුක්තිය පවරා නොතිබු බැවින් | ඉඩමේ හිස් භුක්තිය බැංකුවට ලබාගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | සාමාන්‍යාධිකාරී/ප්‍රධානවිධායක නිළධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(නීති) සහ සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී හමුවීමට ගිය අතර ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා දේපළෙහි වර්තමාන තත්ත්වය සාකච්ඡා කරන ලදී. ඉඩමේ හිස් භුක්තිය බැංකුවට ලබාදෙන ලෙස ඉල්ලා ගොඩනැගිලි ද්‍රව්‍ය | BMC ඉඩමේ හිස් භුක්තිය භාරදීම සම්බන්ධයෙන් BMC වෙතින් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බැවින්, රිට් (writ) ක්‍රියාත්මක කිරීමට 2021/12/20 දින අධිකරණ නියෝගය ලබා ගන්නා ලදී. රිට් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් උසාවියේ රෙජිස්ට්‍රාර්වරයා සහ තවත් අධිකරණ නිලධාරීන් 04 දෙනෙක් 2022/01/21 දින BMC දේපල වෙත ගියහ. නමුත් BMC හා සම්බන්ධ |

| | | | | |
|---|---|---|---|---|
| | භුක්තිය ලබා ගැනීම සඳහා බැංකුව විසින් රිට් නියෝග තීරණය ලබාගැනීමට තීරණය කර තිබූ අතර, ඒ අනුව 2017 අගෝස්තු 15 දින රිට් පත්‍රිකාව සම්පූර්ණ කරන ලදී. 2018 මැයි 31 දිනැති අංක 18/විවිධ/(019) දරන අමාත්‍ය මණ්ඩල තීරණ පත්‍රිකාවේ 75 (i) (අ) සහ (ආ) වගන්තියට අනුව, රාජ්‍ය ආයතන අතර ආරවුල් වේ නම්, රාජ්‍ය ආයතන අතර ආරවුල් විසඳීමේ අරමුණින් අනෙකුත් රාජ්‍ය ආයතන වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් වළකින ලෙස සිය විෂය පථය යටතට ගැනෙන ආයතන වල සියලු ප්‍රධානීන්ට නියම කිරීම සහ අනෙකුත් අදාළ බලධාරීන්ගේ සහාය ඇතිව සාකච්ජා සම්මුති ක්‍රමවේදයක් මගින් ආරවුල් නිරාකරණය පිණිස සෑම ප්‍රයත්නයක් දැරිය යුතුය. එසේ වුවද, සාකච්ජා සම්මුති ක්‍රමවේදයක් මගින් හිස් භුක්තිය ලබාගැනීමට 2020 වර්ෂය අවසානය තෙක්ම බැංකුව | | සංස්ථා සභාපතිවරයාට ලිපියක් යවා ඇතත් ප්‍රතිචාරයක් ලැබී නැත. තවද, අපගේ සභාපතිවරයා විසින් අග්‍රාමාත්‍ය කාර්යාලයට තවත් ලිපියක් යවා ඇත. BMC ඉඩමේ වත්මන් තත්ත්වය දන්වා අතිරේක ලේකම් නිවාස අමාත්‍යාංශය (නිවස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ, බැංකු අධ්‍යක්ෂ) වෙත ලිපියක් යවන ලදී. ප්‍රතිචාරයක් බලාපොරොත්තුවෙන් සිටි. | ජාතික සේවක සංගමයේ සේවකයින්ගේ සහ සාමාජිකයින්ගේ දැඩි විරෝධය හේතුවෙන් රෙජිස්ට්‍රාර්වරයාට රිට් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. 2022/12/19 දිනට පෙර බැංකුව විසින් රිට් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | අපොහොසත් වී තිබුණි. | | | |
| | 2016 සැප්තැම්බර් 28 දිනැති අංක ජීසීඑල්/2016/210 චක්‍රලේඛයට අනුව බැංකුව විසින් ඉතා වැදගත් වෘත්තිකයන්ට (VIP) නිවාස ණය පහසුකම් හඳුන්වාදී තිබූ අතර, රු.282,985,000 ක් වටිනා ණය 140 ක් මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දී තිබුණි. රු.52,777,346 ක් හා සියයට 18.65 ක් වන ණය තිස් තුනක් 2020 දෙසැම්බර් 31 දිනට අක්‍රීයව පවතින බව වර්ගීකරණය කර තිබුණි. කෙසේවුවද, සුරැකුම් නොමැති නිසා බැංකුවට ද්විතියික අයකර ගැනීමේ විකල්පයක් නොමැති වී තිබුණි. | අනාගතයේ දී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | 2016 සැප්තැම්බර් මාසයේදී මෙම ණය යෝජනා ක්‍රමය ප්‍රථම වරට හඳුන්වා දී තිබුණි. බොහෝ නීතීඥවරුන් ණය නොගෙවීම හිතාමතා සිදු කරන අතර, එය ඔවුන්ගේ ආදායම මත පදනම් වී නැත. ගනුදෙනුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පෙර අදාළ නීතීඥ සංගමයේ සහය ලබාගෙන මෙම ණය අයකර ගැනීමට අපි උපරිම උත්සාහයක් දරන නමුත්, අපි සිවිල් නඩු විධාන අධිකරණය යටතේ සමහර ගනුදෙනුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, අදාළ නීතීඥ සංගම්වල සහය ලබාගත නොහැකි වේ නම් ඉහත ක්‍රියාමාර්ගයම අපි ඒ සම්බන්ධයෙන් ගනු ලැබේ. අපි මේ වන විට මෙම ණය යෝජනා ක්‍රමය තාවකාලිකව අත්හිටුවා තිබේ. | අපි සිවිල් නඩු විධාන අධිකරණය යටතේ සමහර ගනුදෙනුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, අදාළ නීතීඥ සංගම්වල සහය ලබාගත නොහැකි වේ නම් ඉහත ක්‍රියාමාර්ගයම අපි ඒ සම්බන්ධයෙන් ගනු ලැබේ. අපි මේ වන විට මෙම ණය යෝජනා ක්‍රමය තාවකාලිකව අත්හිටුවා තිබේ. |
| | වසරක කල්පිරීමේ කාල සීමාවක් සහිතව 2018 ඔක්තෝබර් 01 වන දින එම්.ටී.ඩී.වෝකර්ස්.පී එල්සී හි සියයට 11.75 ක අනුපාතයකින් බැංකුව ණය කර සඳහා රු.මිලියන 50.95 ක් ආයෝජනය කර | අනාගතයේ දී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙය පැහැර හරින ලද ආයෝජනයක් වන අතර නැවත ප්‍රතිලේඛනගත කර නොමැත. කෙසේවුවද, භාරකාර බැංකුව (ලංකා බැංකුව) විසින් අයකරගැනිමේ ක්‍රියාවලියේ නිරත වෙමින් සිටියි. තවද, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට (SLFRS) අනුව, ගිවිසුම් ගත පොළිය බැංකුව විසින් හඳුනාගත යුතු අතර, හානිකරණ බලපෑම් හේතුවෙන්, අදාළ උපචිතයන් | මෙය පැහැර හරින ලද ආයෝජනයක් වන අතර නැවත ප්‍රතිලේඛනගත කර නොමැත. කෙසේවුවද, භාරකාර බැංකුව (ලංකා බැංකුව) විසින් අයකරගැනිමේ ක්‍රියාවලියේ නිරත වෙමින් සිටියි. තවද, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට (SLFRS) අනුව, ගිවිසුම් ගත පොළිය බැංකුව විසින් හඳුනාගත යුතු අතර, හානිකරණ බලපෑම් |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. රු.50,956,700 ක ප්‍රාග්ධනය සහ රු.13,533,630 ක පොළිය සමාගම විසින් ආපසු ගෙවා නොතිබුණි. කෙසේවුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටද කිසිදු ප්‍රතිලාභයක් බැංකුවට ලැබී නොතිබුණි. | | සඳහා සම්පූර්ණයෙන්ම හානිකරණ සිදුකර ඇත. එබැවින්, මෙය මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් /අඩුවෙන් දැක්වීමක් නොවේ. | හේතුවෙන්, අදාළ උපචිතයන් සඳහා සම්පූර්ණයෙන්ම හානිකරණ සිදුකර ඇත. එබැවින්, මෙය මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් /අඩුවෙන් දැක්වීමක් නොවේ. |
| **මෙහෙයුම් අකාර්යක්ෂමතාව** | | | | |
| ණය සහ අත්තිකාර ම් - ක්‍රියාකාරී සහ අක්‍රීය ණය | 2020 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය ප්‍රාග්ධනය සහ අත්තිකාරම් ශේෂය, සේවක අර්ථසාධක අරමුදලට එරෙහිව ලබාදුන් ණය හැර රු.මිලියන 28,670 ක් සහ එම දිනට අක්‍රීය ණය හා අත්තිකාරම්, මුළු ණය හා අත්තිකාරම් වලින් රු.මිලියන 5,800 ක් හෙවත් සියයට 20.23 ක් සහ එය අංශික අනුපාතය වූ සියයට 6.8 ට වඩා වැඩි ප්‍රතිශතයක් වී තිබුණි. ශාඛා විගණනයේදී පහත දුර්වලතා නිරීක්ෂණය විය. | | | |
| | 2016 සැප්තැම්බර් 13 වැනි දින ශාඛාවක් විසින් ගනුදෙනුකරුවෙකුට සියයට 9 ක සහනදායී පොළි | උකස් ණය ලබා දීමට පෙර ව්‍යාපෘති යෝජනාව සහ | අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීමට අපොහොසත්වීම සහ අපේක්ෂිත අපනයන ආදායම ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් ණය ලබා දීමෙන් පසු සමාගම පාඩු | මෝල් පවත්වාගෙන යාමේදී සමාගම පාඩු ලබන බැවින් අධ්‍යක්ෂක සහ ඔහුගේ බිරිඳ වෙරළුපිටිය වත්තේ උකස් කළ ඉඩමේ සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් පිහිටුවීමට |

| | | | | |
|---|---|---|---|---|
| | අනුපාතයකට රු.මිලියන 50 ක ණයක් නිකුත් කර ඇති අතර, එය වසර 02 ක සහන කාලයක් ඇතුළුව වසර 05 කින් ගෙවිය යුතුය. 2020 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂය රු.56,969,235 කි. ඔවුන්ගේ ව්‍යාපෘති යෝජනාවට අනුව නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීමට සමාගම අපොහොසත් විම හේතුවෙන් ණය ලබාගැනීමෙන් පසු සමාගම 2018 වර්ෂයේදී රුපියල් මිලියන 23.14 ක පාඩුවක් වාර්තා කර තිබුණි. ශාඛාව මඟින් සහන කාලය දෙවතාවකින් දීර්ඝකර ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කර තිබුණ ද, ගනුදෙනුකරු ණය ආපසු ගෙවීමට අපොහොසත් වී තිබුණි. | පාරිභෝගික යාගේ ආදායම් මාර්ග නිසි ලෙස ඇගයීමට ලක් කළ යුතු අතර, හිඟ ශේෂය අයකර ගැනීමට පියවර ගත යුතුය. | ලබමින් සිටී. ගනුදෙනුකරුගේ ඉල්ලීම මත බැංකුව මෙම පහසුකම දෙවරක් ප්‍රතිලේඛන ගත කර ඇත. මහ බැංකුව විසින් ලබාදී ඇති ණය සහන කාලයෙන් පසු 2021 දෙසැම්බර් මාසයේදී සමාගමට එරෙහිව නීතිමය පියවර ගැනීමට සැලසුම් කර ඇත. මේ වන විටද එන්තරවාසියක් යවා ඇත. | පෞද්ගලික සමාගමක් සමඟ කොන්ත්‍රාත්තුවකට එළඹී ඇත. බැංකුව සමඟ කළ සාකච්ඡාවට අනුව ඔවුන් 2021 නොවැම්බර් 26 වැනි දින මූලික ගෙවීමක් ලෙස රු. මිලියන 1 ක මුදලක් තැන්පත් කර ඇත. තවද ඔවුන්ගේ 2021 නොවැම්බර් 26 දිනැති ලිපිය මගින් දැනට පවතින රබර් ගස් උදුරා දැමීම සම්බන්ධයෙන් වන විකුණුම් ආදායම සෘජුවම ණය ගිණුමට බැර කිරීමට එකඟ වී ඇති අතර ආදායම දළ වශයෙන් රු. මිලියන 5 ක් වේ. 2022-01-31 දිනට මුළු හිඟ ණය මුදල රු. 20,671,717.84 කි.<br>HDFC බැංකුව සමාගමෙන් පහත ඉල්ලීම් කර ඇත.<br>1. රු. මිලියන 15ක් ණය ගිණුමට තැන්පත් කිරීම.<br>2. සූර්ය බලශක්ති ව්‍යාපෘතියට අදාළව අත්සන් කිරීමට නියමිත ගිවිසුමට HDFC බැංකුව පාර්ශවකරුවෙකු වීමට නියමිත අතර සමාගමේ ණය මුදල සම්පූර්ණයෙන් පියවන තෙක් උපයන ආදායම සෘජුවම HDFC ගිණුමට බැර කිරීම.<br><br>ණය ආපසු ගෙවීමේ ප්‍රගතියක් නිරීක්ෂණය නොකළහොත් අනාගතයේදී සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා ගනුදෙනුකරුවෙකු විසින් ඉල්ලුම් කළ රු. මිලියන 350 ක ණය පහසුකමක් 2019 ජූනි 07 දින පැවති විශේෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී. පිළිවෙලින් 2019 ජූලි 8 සහ 2019 ඔක්තෝම්බර් 28 යන දිනයන් තුල එම සමාගමට රු. මිලියන 100 ක් සහ රු. මිලියන 150 ක ණය පහසුකම් ලබා දී තිබුණි. පසුව එය ප්‍රදානය කිරීමේ මුල් අදියරේදීම 2020 ජනවාරි 07 දින අක්‍රිය ණය යටතේ වර්ගීකරණය කර තිබූ අතර, 2020 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ මුදල රු.මිලියන 289.41 කි. තවද, ණය ලබා දීමේදී බැංකුව සමඟ ඇති කරගත් විශේෂ ගිවිසුමේ සඳහන් කොන්දේසි අනුගමනය කිරීමට ගනුදෙනුකරු අපොහොසත් වී තිබුණි. | අනාගතයේ දී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙය 1.7 viii ට ලබා දී ඇති පිළිතුරට අදාළ වේ. බොරළු නිස්සාරණ අලෙවියෙන් දළ වශයෙන් ලද මිලියන 21 ක් සහ සහන කාලයෙන් පසු මුල් මාස දෙක සඳහා මුදල් ගොඩනැගීමේ ගිණුම සඳහා රු.200,000 ක් සමාගම විසින් තැන්පත් කර ඇත. සමාගම මුහුණ දුන් ප්‍රධාන ගැටලුව වූයේ ණය ගෙවීම සඳහා කරන ලද ඉදිකිරීම් කටයුතු සඳහා රාජ්‍ය ආයතන වලින් මුදල් නොලැබීමයි. | ඉදිරිපත් කරන ලද අංක. 08/237/2020 (Doc 284) දරන මණ්ඩල පත්‍රිකාවට අනුව, 2020 පෙබරවාරි 28 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මණ්ඩලය විසින් ඉහත ණය සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බැංකුවට අනුමැතිය ලබා දී ඇත.<br>සමාගම සහ අධ්‍යක්ෂවරුන් සඳහා 2020/03/12 වැනි දින එන්තරවාසියක් යවා ඇති අතර සමාගම සහ අධ්‍යක්ෂවරුන් සඳහා 2020-11-11 වැනි දින එන්තරවාසිය සඳහා සහිකැඳවීම් යවා ඇත. 2020 නොවැම්බර් මාසයේදී පාරේට් බලතල (Parate powers) ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩල යෝජනාව සම්මත විය. 2021/03/24 දින අලවිවේදී වෙන්දේසිය සිදු කරන ලදි. රු. මිලියන 500 ට අඩු මිල ගණන් ලැබුණු නිසා වෙන්දේසියේදී සාර්ථක ලංසු ලැබී නැති අතර බැංකුව දේපල අත්පත් කර ගෙන ඇත. එම ටෙන්ඩරය කැඳවූ පසු, කෙසේ වෙතත් ලැබුණු අර්පණ ප්‍රමාණවත් නොවේ, ටෙන්ඩර් කමිටුව අර්පණය ප්‍රතික්ෂේප කර ලියාපදිංචි තැපැලෙන් ලංසුකරුට දන්වා ඇත.<br>එකී ණය අයකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත් අතර බැංකුවට උකස් කර ඇති දේපළ විකිණීම සඳහා පාරේට් ක්‍රියාත්මක කිරීමේ බලය බලාත්මක කර ඇත. ඇපකරුවන්ට එරෙහිව නඩුවක් ගොනු කර නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | 2015 සහ 2016 කාලපරිච්ඡේදය තුළදී ශාඛාව විසින් රු.12,950,000 ක් වටිනා කල් බදු පහසුකම් පහක් ලබා දී තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය ණය ශේෂය රු.22,989,757 ක් වූ අතර, ගනුදෙනුකරුගේ ආදායම පිළිබඳ නිසි ඇගයීමක් සිදු නොකිරීම, ණය අය කරගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය, අත්පත් කරගැනීමේ උත්සාහය අසාර්ථක වීම (led to fail the seizing attempt) ඊට හේතු වූ බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ශාඛාව විසින් ගනුදෙනුකරුවන්ගෙන් කල් බදු කුළිය අයකර ගැනිමට ගත් උත්සාහයන් කිහිපයකින් පසුව කල්බදු අවසන් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. අවසන් කිරීමේ නිවේදන, අවසන් කිරීම් සහ සීස් කර ගැනීමේ නියෝග පහත පරිදි නිකුත් කරන ලදි. මෙම ගනුදෙනුකරුවන් මෙම අයකර ගැනීම් ක්‍රියාමාර්ග කිසිවකට ධනාත්මකව ප්‍රතිචාර දැක්වූයේ නැත. කිහිපවරක් උත්සාහ කළත්, වාහනය නැවත ලබාගැනීමට සීසර්ස්ලාට නොහැකි විය. එන්තරවාසි යැවීමෙන් අනතුරුව නීතිමය කටයුතු ආරම්භ කර ඇත. | ශාඛාව විසින් ගනුදෙනුකරුවන්ගෙන් කල් බදු කුළිය අයකර ගැනිමට ගත් උත්සාහයන් කිහිපයකින් පසුව කල්බදු අවසන් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. අවසන් කිරීමේ නිවේදන, අවසන් කිරීම් සහ සීස් කර ගැනීමේ නියෝග පහත පරිදි නිකුත් කරන ලදි. මෙම ගනුදෙනුකරුවන් මෙම අයකර ගැනීම් ක්‍රියාමාර්ග කිසිවකට ධනාත්මකව ප්‍රතිචාර දැක්වූයේ නැත. කිහිපවරක් උත්සාහ කළත්, වාහනය නැවත ලබාගැනීමට සීසර්ස්ලාට නොහැකි විය. එන්තරවාසි යැවීමෙන් අනතුරුව නීතිමය කටයුතු ආරම්භ කර ඇත. |
| | ශාඛාව විසින් 2017 ඔක්තෝබර් 20 වන දින රු. 8,450,000 ක කල්බදු පහසුකමක් ලබාදී තිබුණු අතර, පසුව ගනුදෙනුකරුගේ ආදායම නුසුදුසු ලෙස ඇගයීම හේතුවෙන් 2018 දෙසැම්බර් 18 දින එය අක්‍රීය ණය යටතේ වර්ගීකරණය කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු. 11,573,229 ක් වී තිබුණි. | ලීසිං පහසුකම ලබාදීමට පෙර පාරිභෝගික ආදායම් මාර්ග නිසි ලෙස ඇගයීමට ලක්කළ යුතු අතර හිඟ ශේෂය අයකර ගැනීමට පියවර ගත යුතුය. | 2013 සිට අයදුම්කරු palmtop ගනුදෙනුකරුවකු වන අතර, පළමු ඇපකරුට 2010 සිට බැංකු සබඳතාවක් ද ඇත. ගනුදෙනුකරුගේ දෛනික ආදායම් වාර්තා පරීක්ෂා කිරීමෙන් පසු සහ ව්‍යාපාර ආදායම පිළිබඳ භෞතික නිරීක්ෂණ සලකා බලා ඇත. පාම්ටොප් තැන්පතු හැර වෙනත් කිසිදු ලේඛනමය සාක්ෂියක් ශාඛාව විසින් ලබාගෙන නොමැත. කෙසේවුවද, අනාගතයේදී සිදුවන සාවද්‍ය ආදායම් ඇගයීම් වළක්වා ගැනීම සඳහා බැංකුව විසින් පුහුණු කිරීම් හරහා ශාඛා ආදායම් ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත. | පුහුණු වැඩසටහන් කිහිපයක් සමඟ ඒකාබද්ධව ගණුදෙනුකරු නිසි ලෙස ඇගයීම සම්බන්ධයෙන් ශාඛා වෙත දැඩි උපදෙස් ලබා දී ඇත. තවද යාවත්කාලීන කරන ලද ගණුදෙනුකරු ඇගයීම් සහ වැඩබිම් චාරිකා වාර්තාවක් හඳුන්වා දී ඇත.<br>අදාළ සිද්ධීන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| **(i)** ණය සහ අත්තිකාරම් - සේවක අර්ථසාධක අරමුදලට එරෙහිව ණය (EPF) | 2020 දෙසැම්බර් 31 දින වන විට සේවක අර්ථසාධක අරමුදලට එරෙහිව ණය **(EPF)** ලබා දී ඇති මුළු ණයවල වටිනාකම රු. මිලියන 11,085 ක් වූ අතර එයින් රු. මිලියන 7,334 ක් අක්‍රීය ලෙස සලකනු ලැබූ අතර එය මුළු හිඟ මුදලෙන් සියයට 66.16 ක් නියෝජනය විය. කෙසේවුවද පෙර වසරට සාපේක්ෂව ඊපීඑෆ් ණය අක්‍රීය අනුපාතය සියයට 6.86 කින් වැඩි වී තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලට එරෙහිව ලබාදුන් ණය රු.176,074,165 ක් දින 540 කට වැඩි කාලයක් හිඟව පැවතුණි. | මෙම ණය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. | Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ සේවාලාභීන්ගේ ආදායම් මාර්ගවලට බලපෑම් එල්ල වී ඇත. කෙසේ වුවද, අපට අර්ථසාධක අරමුදල (EPF) හරහා හිමිකම් පෑමෙන් හිඟ මුදල් අයකර ගැනීමට හැකිවනු ඇත. තත්වය යථා තත්ත්වයට පත් වූ විට, අපි සාමාන්‍ය අයකර ගැනිමේ ක්‍රියාපටිපාටි සමඟ අයකර ගැනිම් සිදු කරනු ඇත. | සියලුම හිඟ මුදල් වාර්ෂිකව මහ බැංකුවෙන් අයකරගනු ලැබේ. මෙය බැංකුව අනුගමනය කරන සාමාන්‍ය පිළිවෙත වේ. ණය මුදල ලබා දෙන අවස්ථාවේදී EPF ණය නියමිත වේලාවට ගෙවීමේ වැදගත්කම සහ අක්‍රීය ණය අනුපාතය හැකිතාක් අඩු කරන ලෙස බැංකුව සෑම විටම ගනුදෙනුකරුවන්ට උපදෙස් දෙනු ලබයි. |

## 5. ශ්‍රී ලංකා මහ බැංකුව

**1.** ආයතනයේ නම ශ්‍රී ලංකා මහ බැංකුව

**2.** වර්ෂ සඳහා මතය

2018 තත්ත්වාගණනය නොකළ මතය

2019 තත්ත්වාගණනය නොකළ මතය

2020 තත්ත්වාගණනය නොකළ මතය

3. ශුද්ධ වත්කම් තත්ත්වය

| | **2018 (රු.'000)** | **2019 (රු.'000)** | **2020 (රු.'000)** |
|---|---|---|---|
| මුළු වත්කම් | 1,917,440,331 | 1,919,417,439 | 2,421,597,167 |
| මුළු වගකීම් | (1,678,671,932) | (1,615,232,047) | (2,074,431,595) |
| ශුද්ධ වත්කම් | 238,768,399 | 304,185,392 | 347,165,572 |

4. රජයට ලබා දුන් දායකත්වය

| **විස්තරය** | **2018 (රු.මිලියන)** | **2019 (රු.මිලියන)** | **2020 (රු.මිලියන)** |
|---|---|---|---|
| මුදල් නීති පනතේ 39 වැනි වගන්තිය අනුව ඒකාබද්ධ අරමුදලට බැර කළ මුදල (ලාභ බෙදා හැරීම) | බෙදා හැරීමක් නොමැත. | 24,000 | 15,000 |

*රජයට නිර්මාණය කළ අගය (ලාභාංශ+ බදු)

5. කාර්ය මණ්ඩල තත්ත්වය

| **විස්තරය** | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව | - | - | - |
| දෙසැම්බර් 31 වන දිනට තත්‍ය සේවක සංඛ්‍යාව | 1421 | 1366 | 1355 |

- දෙපාර්තමේන්තු ප්‍රධානියාට පහළ තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලක් නොමැත.

6. පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් වියදම්

| විස්තරය | 2018 | 2019 | 2020 |
|---|---:|---:|---:|
| මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම (රු.'000) | 152,565,259 | 69,507,019 | 74,636,550 |
| මුළු මෙහෙයුම් වියදම් (රු.'000) | 13,518,255 | 13,611,292 | 11,203,789 |
| මුළු ආදායමට ප්‍රතිශතයක් ලෙස මුළු මෙහෙයුම් වියදම් | 8.86 | 19.58 | 15.01 |

7. විගණන නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණ සිදු කළ වර්ෂය | නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| අ | **මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ වැඩ සටහන** | | | | |
| | ආර්ථිකයේ වැඩෙන ඉල්ලුමට සරිලන පරිදි අභ්‍යන්තර හා බාහිර කම්පනයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරන ශක්තිමත් බැංකු / බැංකු නොවන මූල්‍ය ආයතන අංශයක් සංවර්ධනය කිරීමේ අරමුණින් 2014 ජනවාරි 17 වන දින මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා බැංකුව විසින් ප්‍රධාන සැළැස්ම එළිදැක්විණි. ඒ අනුව, 2021 මැයි 12 වැනි දිනට රු. මිලියන 105.58 ක් වැය කරමින් බැංකු, මුදල් සමාගම් හා කල්බදු සමාගම් ඇතුළත් ඒකාබද්ධ කිරීමේ සැළසුම් 12 ක් සම්පූර්ණකර තිබුණි.<br><br>කෙසේ වෙතත්, ආයතන 4 ක් සම්බන්ධයෙන් බැංකුව රු.මිලියන 21.44 ක් වැයකර තිබුණ ද, ඒවයේ ඒකාබද්ධ සැළසුම් 2021 මැයි 12 දිනටම සම්පූර්ණ වී නොතිබුණි.<br><br>ඉහත වියදම්වලට අමතරව, ආයතන 19 ක් සම්බන්ධව තොරතුරු ලියවිල්ල, නිසි පරීක්ෂාව හා තක්සේරු වාර්තා | 2019, 2020 | ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය, කඩිනම් කිරීම අවශ්‍ය වේ. | මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ වැඩසටහන යටතේ, සුදුසු ඒකාබද්ධ කිරීමේ හවුල්කරුවන් සොයාගැනීමේ අදහසින් යුක්තව සියලු බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධව නිසි පරික්ෂා සිදුකරන ලදි.<br><br>බැංකුව විසින් පත්කරන ලද මණ්ඩලයේ බාහිර විගණකවරුන් විසින් ලබාදෙන ලද ඒකාබද්ධ කිරීම හා පවරාගැනීමේ වෘත්තීය සේවාවන් සම්බන්ධ පිරිවැය දැරීම මඟින් බැංකුව ඒකාබද්ධ කිරීමේ වැඩසටහන | බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන වැඩසටහන - 2020 හි අදියර 1 යටතේ, ශක්තිමත් හා ස්ථාවර බැංකු නොවන මූල්‍ය ආයතන සමඟ ඒකාබද්ධ කිරීම සඳහා ඉලක්කගත ආයතන ලෙස බැංකු නොවන මූල්‍ය ආයතන 11 ක් ( ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සමඟ නියාමන අනුකූලනොවීම් පදනම මත) බැංකුව හඳුනාගෙන ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පිළියෙල කිරීම සහ අනෙකුත් කාරණා සඳහා බැංකුව විසින් රු. මිලියන 59.25 ක අමතර මුදලක් වැය කර තිබුණු අතර ඒවා 2021.12.31 වන විට සම්පූර්ණ වී නොතිබුණි.<br><br>ඉහත ඒකාබද්ධ කිරීමේ සැළසුමට අතිරේකව 2020 වර්ෂයේදී "බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රධාන සැළැස්මක්" බැංකුව විසින් ආරම්භ කර තිබුණු අතර, 2021 අප්‍රේල් 30 වන විට තොරතුරු ලියවිල්ල, නිසි පරීක්ෂාව හා තක්සේරු වාර්තා පිළියෙල කිරීම සඳහා රු. මිලියන 21.68 ක මුදලක් වැය කර තිබුණි.<br><br>2018 දී ආරම්භ කළ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ඒකාබද්ධ කිරීමේ (merge) ක්‍රියාවලිය 2021.12.31 දිනවන වටත් සම්පූර්ණ වී නොතිබුණි.<br><br>තවද, ආම්භයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පරිපාලිතයක් ලෙස පවත්වාගෙනයාමට යෝජනා කර අවසන් වූ ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමහම ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය (merge) ද 2021 දෙසැම්බර් 31 වන විට අවසන් වී නොතිබුණි. | | | සඳහා පහසුකම් සලසන ලදි.<br><br>බැංකු නොවන මූල්‍ය ආයතන 12 ක් ඒකාබද්ධ කිරීමේ ගනුදෙනු අවසන් කළ අතර ඒ වෙනුවෙන් බාහිර විගණකවරුන්ට නිසි පරීක්ෂා හා ගනුදෙනු ගාස්තු ලෙස රු. මිලියන 105.58 ක් බැංකුව දරන ලදි.<br><br>2015 දී රජය වෙනස්වීම හේතුවෙන්, ඒකාබද්ධ කිරීමේ වැඩසටහනට සම්බන්ධ ප්‍රතිපත්තිය ද සංශෝධනය කළ අතර බැංකු නොවන මූල්‍ය ආයතනවල කැමැත්ත මත කිරීමට (optional) ඉඩදෙන ලදි. මෙම තත්වය නිසා බැංකුවට ඒකාබද්ධ කිරීම් සහ අත්පත්කරගැනීම් බලගැන්වීම් කිරීමට නොහැකි විය. පවරාගනු ලබන්නන් විසින් මූලික කොටස් (initial stakes) පවරාගෙන තිබුණ ද, ප්‍රතිපත්තිය වෙනස්වීම හේතුවෙන්, ගනුදෙනු හතරක් අවසන් කිරීමට නොහැකි විය.<br><br>තවද, අපේක්ෂිත ගැණුම්කරුවන් නොමැතිවීම හේතුවෙන්, බැංකු නොවන මූල්‍ය ආයතන 19 ක | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ඒකාබද්ධ කිරීම අසාර්ථක විය. කෙසේ වෙතත්, මෙම බැංකු නොවන මූල්‍ය ආයතන 19 සම්බන්ධව බාහිර විගණකවරුන් හරහා නිසි පරීක්ෂා (තක්සේරු වාර්තා සහිතව) කිරීමට බැංකුව රු. මිලියන 59.25 ක් වැයකරන ලදි. | |
| ආ | **බැංකුව විසින් බලපත්‍ර අවලංගු කරන ලද මුදල් සමාගම් ගණන් බේරා වසා දැමීම.** | | | | |
| | 2018, 2019 හා 2020 වර්ෂවලදී බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කරන ලද මුදල් සමාගම් හතරෙහි ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය (ඈවරකරුවකු පත්කරීම) 2021 අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි. බලපත්‍රය අවලංගු කළ දින සිට වැඩකරන දින 30 ක් ඇතුළත ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා 2018 මාර්තු 05 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රය අවලංගු කරන ලද මුදල් සමාගමට නියෝගයක් කර ඇති අතර එම කාල සීමාව තුළ ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට එම සමාගම අපොහොසත් වී තිබුණි.<br>එසේම, බලපත්‍රය අවලංගු කළ දින සිට වැඩකරන දින 30 ක් ඇතුළත ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා 2018 ජූලි 25 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රය අවලංගු කරන ලද තවත් මුදල් සමාගමකට නියෝග කර ඇති අතර එම කාල සීමාව තුළ ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට එම සමාගම අපොහොසත් වී ඇත. | 2019, 2020 | ක්‍රියාවලිය වේගවත් කිරීම අවශ්‍ය වේ. | 2007 අංක 7 දරන සමාගම් පනතේ නවවැනි උපලේඛනයේ දක්වා ඇති වරණීය හිමිකම්පෑම් බලපත්‍රලාභී මුදල් සමාගම්වල ගණන් බේරා වසා දැමීමේ අවශ්‍යතා ඉටුකිරීමට ප්‍රමාණවත් නොවන බව බැංකුවේ අදහස වේ. එබැවින්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 33 වගන්තිය ප්‍රකාරව, බලපත්‍රලාභී මුදල් සමාගම් ගණන් බේරා වසා දැමීමේදී හිමිකම්පෑම්වල ප්‍රමුඛතාවය සම්බන්ධ නව නියෝගයක් නිකුත් කිරීමට තීරණය කරන ලදි.<br><br>පසුව, මුදල් ඇමතිවරයා විසින් 2019 අංක 1 දරන | 2018, 2019 හා 2020 වර්ෂවලදී බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කරන ලද මුදල් සමාගම් හතරෙහි ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය (ඈවරකරුවකු පත්කරීම) 2021 අවසන් වන දිනට අවසන් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | මුදල් ව්‍යාපාර (මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේදී හිමිකම්පෑම්වල ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් වන) නියෝග 2019 මාර්තු 31 දින ගැසට් කරන ලද අතර ඉන් පසුව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ප්‍රමාදයකින් තොරව බලපත්‍රලාභී මුදල් සමාගම් ගණන් බේරා වසා දැමීම සඳහා අයදුම්පත් ගොනුකිරීම ආරම්භ කර තිබුණි. | |
| ඇ | **ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය** | | | | |
| | ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය, 2016 ජුලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි 2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. තැන්පතු භාර ගන්නා සහ ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් (ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර) මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගත යුතුය. ඒ අනුව, මෙම පනත බලපැවැත්වෙන දින සිට 2021 ජුනි 30 දක්වා ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යාම සඳහා සමාගම් හතරක් පමණක් බලපත්‍ර ලබාගෙන තිබුණි. තැන්පතු භාර නොගන්නා නමුත් රට තුළ සිටින අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය | 2019, 2020 | පනත බලාත්මක කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. | ක්ෂුද්‍ර මූල්‍ය හා මුදල් ණය දෙන ව්‍යාපාරවල නියැලී සිටින ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත (යෝජිත පනත) නම් වූ පාර්ලිමේන්තු පනතක් මඟින් ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරියක් පිහිටුවීමට යෝජනා කර ඇත. බැංකුව මුදල් අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් සම්පාදක සමඟ කෙටුම්පත් පනත අවසන් කිරීමේ ක්‍රියාවලියේ යෙදී | බැංකුව මුදල් අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් සම්පාදක සමඟ කෙටුම්පත් පනත අවසන් කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටියි. යෝජිත පනත 2022 වර්ෂයේදී බලාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නොවේ. එබැවින් එවැනි සමාගම්, මෙම පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියාමනය හා අධීක්ෂණය නොකරනු ලබයි.<br>2019 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට ප්‍රතිචාර වශයෙන්, ක්ෂුද්‍ර මූල්‍ය හා මුදල් ණය දෙන ව්‍යාපාරවල නියැලී සිටින ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ණය නියාමන අධිකාරියක් වෙනම පනතක් හරහා ස්ථාපිත කරන බවත් එම යෝජිත පනතෙහි කෙටුම්පත 2019 නොවැම්බර් 26 දින මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කරන ලදි. කෙසේ වෙතත්, 2021 වර්ෂය අවසාන වන විටත් එය බලාත්මක කර නොතිබුණි. | | | සිටියි. යෝජිත පනත 2022 වර්ෂයේදී බලාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. | |
| ඇ | **රාජ්‍ය ණය කළමනාකරණය** | | | | |
| i | මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව රාජ්‍ය ණය කළමනාකරණය හා සම්බන්ධ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ණය යන්නට අතුළත් වන්නා වූ ණය වර්ගයන් හෙවත් රාජ්‍ය ණය සඳහා නිර්වචනයක්, රාජ්‍ය ණය කළමනාකරණයේ අරමුණු සහ කාර්යයන් පිළිබඳව මුදල් නීති පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක සඳහන් වී නොමැත. | 2019, 2020 | රාජ්‍ය ණය යන්නට අතුළත් වන්නා වූ ණය වර්ගයන්, රාජ්‍ය ණය සඳහා නිර්වචනය ක්, රාජ්‍ය ණය කළමනාක රණයේ අරමුණු සහ කාර්යයන් නිර්වචනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | මුදල් නීති පනතේ 113 වගන්තිය අනුව බැංකුව රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධයෙන් නියෝජිත කාර්යයක් කිරීම අවශ්‍ය වේ. බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණයේ කාර්යයන් හා අරමුණු සම්බන්ධව මුදල් නීති පනතේ ප්‍රමාණවත්ව පැහැදිලි කර නොමැති බව හඳුනාගෙන ඇත. ණය කළමනාකරණයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ඇතැම් නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින් බැංකුව හා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර | බැංකුව වෙත පවරා ඇති ණය කළමනාකරණයේ අරමුණු සහ කාර්යයන් සම්බන්ධව තවදුරටත් පැහැදිලිබවක් ඇතිකිරීම සඳහා අලුත් සංවාදයක් අදාල පාර්ශවයන් අතර ආරම්භකළ හැකි බව බැංකුව දැනුම් දී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ජාත්‍යන්තර නියෝජිත ආයතනයක තාක්ෂණික සහයෝගයෙන් තනි ණය කළමනාකරණය කාර්යාලයක් පිහිටුවීමේ උත්සාහයක් වසර කිහිපයකට ඉහතදී ආරම්භ කළ ද එය ඉදිරියට නොයන ලදි. | |
| ii | රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම් සම්බන්ධ ණය තොරතුරු සහ රජය වෙනුවෙන් අදාළ පර්ශවයන් විසින් ලබා ගන්නා අනෙකුත් ණය පිළිබඳව මුදල් අමාත්‍යාංශයෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු මඟින් ලබා ගන්නා ණය තොරතුරු යොදා ගනිමින් බැංකුව විසින් නොපිය වූ මධ්‍යම රජයේ ණය වාර්තා කරනු ලබයි. කෙසේ වෙතත්, බැංකුව විසින් මධ්‍යම රජයේ හිඟ ශේෂය සම්පාදනය කිරීමේදී බැංකු අයිරා ශේෂයන්හි සහ නොපිය වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හැර අනෙකුත් නොපිය වූ විදේශ ණයවල නිර්වද්‍යතාවය තහවුරු කර ගන්නා බව නිරීක්ෂණය නොවීය. | 2019 | බැංකු අයිරා ශේෂයන්හි සහ නොපිය වූ ජාත්‍යන්තර ස්වෛරීත් ව බැඳුම්කර හැර අනෙකුත් නොපිය වූ විදේශ ණයවල නිර්වද්‍යතා වය තහවුරු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | බැංකුව රාජ්‍ය ණය පිළිබඳ තොරතුරු සෘජුවම ස්වකීය මූලාශ්‍රයන්ගෙන් සහ ද්විතීයික මූලාශ්‍රයන්ගෙන් සම්පාදනය කරයි. බැංකුව ප්‍රාථමික මූලාශ්‍රය වන ණයවල සියලු විස්තර සම්පාදනය කර කඩිනමින් අදාල පාර්ශවයන් සමඟ හුවමාරු කර ගනියි. මුදල් අමාත්‍යාංශය ප්‍රාථමික මූලාශ්‍රය වන හා කාලානුරූපීව මහබැංකුවට වාර්තාකරනු ලබන රාජ්‍ය ණය සංරචක කිහිපයක් ඇත. බැංකුවට දත්ත වාර්තා කරනු ලබන අනිකුත් ආයතන එම දත්ත නිවැරදිව වාර්තාකරනු ඇතැයි අපේක්ෂා කරන අතර මහ බැංකුව විසින් එම දත්ත සත්‍යාපනය කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවේ. | බැංකුව විසින් මධ්‍යම රජයේ හිඟ ශේෂය සම්පාදනය කිරීමේදී බැංකු අයිරා ශේෂයන්හි සහ නොපිය වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හැර අනෙකුත් නොපිය වූ විදේශ ණයවල නිර්වද්‍යතාවය තහවුරු කර ගන්නා බව නිරීක්ෂණය නොවීය. |
| iii | ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් සඳහා බැංකුව විසින් නිකුත් කරන ලද | 2019, 2020 | ක්‍රියාවලිය කඩිනම් | පනතක් හරහා සෘජුවම එවැනි දඩ මුදල් | බැංකුව විසින් මෙම කාරණය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලංකාසෙට්ල් පද්ධති නීති අනුවාදය 2.1 (2013) හි වගන්ති අංක 2.2 අනුව, ප්‍රාථමික අලෙවිකරුවෙකු අනුගමනය කළ යුතු නීති හා රෙගුලාසි උල්ලංඝනය කරන විටදී එම ප්‍රාථමික අලෙවිකරුට එරෙහිව දඩ මුදල් නියම කළ හැකිය. තවද, 2019 දෙසැම්බර් 20 දිනැති 2019 අංක 01 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත් සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත් විධානයේ 8 වන වගන්තියට අනුව (ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු), එම විධානයට අනුකූල නොවීම සම්බන්ධයෙන් අළෙවිකාර ඍජු සහභාගිකරුවන්ට එරෙහිව දඩ මුදල් නියම කළ හැකිය.<br><br>කෙසේ වෙතත්, බැංකුවට මෙම විධිවිධාන බලාත්මක කිරීමට නොහැකිවීමෙන් ප්‍රාථමික අලෙවිකරුවන්ට හෝ අළෙවිකාර ඍජු සහභාගිකරුවන්ට එරෙහිව දඩ මුදල් පනවා නොතිබුණි. | | කිරීම අවශ්‍ය වේ. | පැනවීමට පැහැදිලි බලයක් නොමැති අවස්ථාවක දී, යටත් නීති (පනත් මත පදනම්ව නිකුත් කරනු ලබන නියෝග හා විධානයන්) මඟින් දඩ මුදල් පැනවීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව බැංකුවේ නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව අවධානය යොමු කර ඇත. | විසඳීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව සලකා බලන බව බැංකුව විසින් දැනුම් දී ඇත. |
| iv | ගනුදෙනුකරුගේ යහපතට එරෙහිව කටයුතු කරන ප්‍රාථමික අලෙවිකරුවන්ට දඩ මුදල් පැනවීමට සුදුසු රාමුවක් සකස් කිරීම සඳහා 2015 සැප්තැම්බර් මාසයේදී මුදල් මණ්ඩලය විසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වුවද, 2020 වර්ෂය අවසන් වන විටත් එවැනි සුදුසු රාමුවක් සකස් කර නොතිබුණි. | 2019, 2020 | ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. | රජයේ සුරැක්ම්පත් වෙළඳපලේ දඩ මුදල් සම්බන්ධ ප්‍රතිපාදනවල වර්තමාන නියාමන රාමුව ශක්තිමත් කිරීමට, අළෙවිකාර ඍජු සහභාගිකරුවන්ගේ නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු සම්බන්ධව ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ 2019 අංක 1 දරන | බැංකුව දැනටමත් අදාල කාරණය විසඳීමට ප්‍රවේශ කිහිපයක් සලකා බලමින් සිටියි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | විධානය 2019.12.20 දින නිකුත් කරන ලදි. කෙසේ වෙතත්, නෛතික වශයෙන් දඬ මුදල් සම්බන්ධ ප්‍රතිපාදන වඩාත් බලාත්මක කිරීම සඳහා ඒවා ඇතුළත් කිරීමට අදාල පනත් සංශෝධනය කිරීම අවශ්‍ය වේ. | |
| v | 1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය ප්‍රකාරව, මෙම ආඥා පනත යටතේ ලබා ගත යුතු එක් එක් ණය (භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම) සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයකින් බලය ලබා දිය යුතුය. කෙසේ වෙතත්, 2018, 2019 සහ 2020 යන වර්ෂ සඳහා එවැනි නියෝගයක් 2020 දෙසැම්බර් මාසය අවසානය වන විටත් ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. තවද, ආඥා පනතේ 4 වන වගන්තියට පටහැනිව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ සත්‍ය ප්‍රතිඵල මත පදනම්ව, 2008 සිට 2017 දක්වා වූ වර්ෂ සඳහා වන නියෝග අදාළ වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේදී ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර තිබුණි. | 2018,20 19,2020 | ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. | මුදල් ඇමතිවරයාගේ අත්සන සඳහා 2018 හා 2019 වර්ෂවල නියෝග පත්‍ර (Order Papers) සහ ලේඛන මුදල් අමාත්‍යාංශයට යොමු කර ඇති අතර 2018 හා 2019 වර්ෂවල භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා වන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සඳහා බැංකුව නිසිපරිදි අත්සන් කළ නියෝග පත්‍ර අපේක්ෂාවෙන් සිටියි.<br><br>2020 වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා වන ගැසට්පත්‍ර, අදාල මුදල් ඇමතිවරයාගේ නියෝග සමඟ 2021 වර්ෂයේදී ලැබෙනු ඇත. | ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතට අදාළ සංශෝධන මුදල් අමාත්‍යාංශයට යෝජනා කර ඇත. |
| ඉ | **අභ්‍යන්තර අරමුදල් හසුරුවන බැංකුවේ දෙපාර්තමේන්තු විසින් කරන ලද ආයෝජනයන්** | | | | |
| | නිශ්චිත ප්‍රාථමික අළෙවිකරුවකු සමඟ ආරක්ෂණයන් නොමැති ප්‍රතිවිකුණුම් | 2019, 2020 | අලාභය අයකර | නිශ්චිත ප්‍රාථමික අළෙවිකරුගෙන් | නීතිමය කටයුතු සිදුවෙමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගනුදෙනුවල ආයෝජනයන් හේතුවෙන් බැංකුවේ දෙපාර්තමේන්තු හතරක් විසින් කළමනාකරණය කරන අරමුදල්වලට 2018.12.10 දිනට රු. මිලියන 2,586 ක අලාභයක් සිදුවිය. 2020 සැප්තැම්බර් 18 දිනට එම ප්‍රාථමික අළෙවිකරුගෙන් ලැබිය යුතු ලෙස නැවතවර්ගීකරණය කරන ලද ආයෝජනයේ වටිනාකම රු. මිලියන 2,953.6 ක් විය. | | ගැනීම අවශ්‍ය වේ. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට බැංකුව දැනටමත් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.<br><br>2016 වර්ෂයේ මුල්භාගයේ සිට ඉදිරියට, අභ්‍යන්තර ආයෝජන අරමුදල් ආයෝජනය කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට බැංකුවේ ආයෝජන දෙපාර්තමේන්තු පියවර ගෙන ඇත. | |

## 6. සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

1. **ආයතනයේ නම** – සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

2. **මතය**

| **වර්ෂය** | **මතය** |
|---|---|
| 2018 | තත්ත්වාගණනය නොකළ මතය |
| 2019 | තත්ත්වාගණනය නොකළ මතය |
| 2020 | තත්ත්වාගණනය නොකළ මතය |

3. අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| **ලාභදායිත්වය** | | | |
| වත්කම් මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඒ) | 5.22 | 7.09 | 4.62 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඊ) | 6.52 | 8.68 | 4.8 |
| ශුද්ධ පොලී ආන්තිකය | 11 | 11.48 | 7.94 |
| **උත්තෝලනය** | | | |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය- ස්ථර 1 | 90 | 83 | 82.04 |
| **ද්‍රවශීලතාවය** | | | |
| ද්‍රවශීලතා ආවරණ අනුපාතය | 110 | 514 | 511.32 |

4. ශුද්ධ වත්කම් තත්ත්වය

| 2020<br>රු. | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| 6,529,849,419 | 4,930,775,804 | 5,386,995,484 |

5. කාර්ය මණ්ඩල තත්ත්වය (අනුමත, තත්‍ය, අතිරික්තය / හිඟය)

| | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව | 183 | 183 | 183 |
| තත්‍ය සේවක සංඛ්‍යාව | 109 | 103 | 107 |

6. 2018, 2019 සහ 2020 යන වර්ෂ සඳහා රජයට ලබා දුන් දායකත්වය

අදාළ නොවේ.

7. පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස පරිපාලන වියදම්

| | වියදම Rs. | ආදායම Rs | ආදායමට ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| 2018 | 324,988,496 | 1,019,059,257 | 31.89 |
| 2019 | 249,325,315 | 1,019,645,665 | 24.45 |
| 2020 | 244,928,082 | 789,309,230 | 31.03 |

8. **ප්‍රධාන විගණන නිරීක්ෂණ**

| | **විගණන නිරීක්ෂණ** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 01 | අංක 02/19/319/0001/004 දරන 2021 ජනවාරි 05 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ, ලිපියට අනුව 2021 සැප්තැම්බර් 30 වන දින වන විට බැංකුව ඇවර කිරීමට හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුව(NSB) සමඟ ඒකාබද්ධ කිරීමට නියමිත වී තිබුණි. කෙසේ වෙතත්,<br><br>(i) **2020** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන වල අඛණ්ඩ පැවැත්ම මාතෘකාව යටතේ කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | ශේෂ පත්‍ර දිනයෙන් පසු කිසියම් සිද්ධියක් ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්මට බලපාන්නේ නම්,බැංකුව විසින් අඛණ්ඩ පැවැත්මේ ප්‍රතිපත්තිය යටතේ හෙළිදරව් කළ යුතුය. ඊට අමතරව, කළමනාකරණ නියෝජනය තුළ ඉහත කී නොපවත්වා ගැනීමේ අවදානම පිළිබඳව කළමනාකාරීත්වය දැනුම් දිය යුතුය. | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (SLSB) සම්පූර්ණයෙන්ම ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) සමඟ ඒකාබද්ධ කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බව 2021 ජනවාරි 05 දිනැති, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ ලිපියෙන් දන්වා ඇත.<br><br>ඒ අනුව,SLSB වෙත නව ණය ලබා දීම,නව තැන්පතු භාර ගැනීම,නව කාර්ය මණ්ඩලය බඳවා | ඒකාබද්ධය සිදුවන තෙක් ව්‍යාපාර මෙහෙයුම් නැවත ආරම්භ කිරීමේ අරමුණින් බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) සමඟ රැස්වීම් කිහිපයක් පවත්වා ඇත.<br><br>ඒ අනුව, ව්‍යාපාර නැවත ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා දීම සලකා බැලීම සඳහා පස් අවුරුදු උපාය මාර්ගික ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස CBSL බැංකුවෙන් ඉල්ලා ඇත. බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) සමඟ සාකච්ඡා කර පස් අවුරුදු උපාය මාර්ගික ව්‍යාපාර සැලැස්ම සකස් කර ඇත. අනුමැතිය සඳහා සැලැස්ම CBSL වෙත යොමු කර තිබුණි.<br><br>CBSL විසින් මෙම ඉල්ලීම හිතකර ලෙස සලකා බලනු ඇතැයි බැංකුව අපේක්ෂා කරන බැවින්, මේ දක්වා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට කිසිදු තර්ජනයක් අප |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) තවද කළමනාකරණ නියෝජනයට අනුව, "අඛණ්ඩව පවත්වාගෙන යාමට මණ්ඩලයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැක ඇති වන සිද්ධීන් හෝ තත්ත්ව සම්බන්ධව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා නොපැවතුණි."යන්න සඳහන් කර තිබුණි. | | ගැනීම සහ කිසිදු පාර්ශවයක් සමඟ නව ගිවිසුම් වලට එළඹීමෙන් වළකින ලෙස මුදල් මණ්ඩලය විසින් යෝජනාවක් සම්මත කර ඇත.මෙම ප්‍රතිපත්තිමය තීරණය ශේෂ පත්‍ර දිනයෙන් පසුව ගෙන ඇත.<br><br>උදා: 2020 දෙසැම්බර් 31වන දින නමුත් මෙම සිදුවීම වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු සිදු වීම් යටතේ<br><br>සටහන අංක 39 වාර්තා කර ඇත.<br><br>ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (SLSB**)** ජාතික ඉතිරි කිරීමේ බැංකුව(NSB) සමඟ සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කිරීමට කටයුතු කරන බව SLSBහි මව් ආයතනය වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව මහ බැංකුවට දන්වා ඇත. එමෙන්ම, ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තුරු SLSB හට සිය ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට අවසර දෙන ලෙස ජාතික ඉතිරි කිරීමේ බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීම් කර ඇත. | අපේක්ෂා නොකරයි. 2020 වාර්ෂික වාර්තාවේ අංක 39, "වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු සිදුවීම්" යටතේ බැංකුව මෙම ස්ථාවරය ප්‍රකාශ කර ඇත. කෙසේ වෙතත්, අවශ්‍ය යැයි හැඟේ නම් අඛණ්ඩ පැවැත්ම යටතේ අනාවරණයක් කිරීමට බැංකුව කටයුතු කරනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 02. | වසර කිහිපයක සිට අය නොවී පවතින රු.2,866,959 ක ලැබිය යුතු ශේෂ එකතුවේ රු.1,999,000 ක ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂයක් ඇතුළත් වී තිබුණි. | හිඟ ශේෂ පියවීමට පියවර ගත යුතුය. | PSDB ඉඩම SLSB වෙත පැවරීමේ දී ලැබිය යුතු රු. 1,999,000ක මුද්දර ගාස්තුව ගෙවා ඇත. ඉහත ඉඩම විකිණීමෙන් මෙය නැවත ලබා ගත හැකිය. අනෙකුත් අයිතම අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන්ගේ උපදෙස් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ඇත. | මුද්දර ගාස්තු මුදල හැර අනෙකුත් සියලුම ශේෂයන් නිවැරදි කර ඇත. මුද්දර ගාස්තු ශේෂය වූ රු. 1,999,000/-, ඉඩම් බැහැර කිරීමේදී පමණක් ආපසු ලබාගත හැක. |
| 03 | 2008 වර්ෂයේදී සේවකයින්ගේ විශ්‍රාම වැටුප් අරමුදල සඳහා අවකරණය කරන ලද රු.1,765,404 ක මුදල ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වා ඇත. කෙසේ වෙතත්, එම සේවකයින් විශ්‍රාම ගිය පසුවත් එම මුදල් ගෙවීමට බැංකුව කටයුතු කර නොතිබුණි. | අනාගතයේ දී විශ්‍රාම වැටුප් අරමුදල සඳහා නිසි වාර්තා සහ ලේඛන තබා ගත යුතුය. | 2008 වර්ෂය තුළ කුමන සේවකයෙකුගෙන් කොපමණ මුදලක් අවකරණය කර තිබේද යන්න හඳුනා ගැනීමට නිසි මූලාශ්‍රයක් නොමැති බැවින් එම අවකරණය කරන ලද මුදල ස්ථිර සේවකයන්ගේ යෝජිත විශ්‍රාම වැටුප් අරමුදලට පැවරීමට තීරණය විය. | 2008 වර්ෂය තුළ එක් සේවකයෙකුගෙන් කොපමණ මුදලක් අඩු කර තිබේද යන්න හඳුනා ගැනීමට නිසි මූලාශ්‍රයක් නොමැති බැවින් බැංකුව විසින් ඉදිරියේදී පිහිටුවීමට අදහස් කරන ස්ථිර සේවකයන්ගේ විශ්‍රාම වැටුප් අරමුදලට එම අඩු කළ මුදල මාරු කිරීමට තීරණය කරන ලදි. |
| 04. | ප්‍රජාමූල සංවිධාන 06 කින් අයකර ගත යුතුව තිබූ රු.99,992,620 ක හිඟ ණය ශේෂයන් 2015 සිට අය කර ගෙන නොතිබුණි. මෙම ණය ශේෂ සඳහා ණයකරුවන් විසින් කිසිදු ආරක්ෂිත ඇපයක් ලබා දී නොතිබුණි. එබැවින් අයකරගැනීමේ හැකියාව සැක සහිතය. | අදාල සංවිධානවලින් හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව හා ඒකාබද්ධ වීමට පෙර ජාතික සංවර්ධන භාර අරමුදල (NDTF) මගින් සමාජ සේවා සංවිධාන වෙත ණය ලබා දී ඇති අතර සමාගමේ ප්‍රතිපත්තිවලට අනුව ණය ලබා දීමේදී කිසිදු ඇපයක් | ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව හා ඒකාබද්ධ වීමට පෙර ජාතික සංවර්ධන භාර අරමුදල (NDTF) මගින් සමාජ සේවා සංවිධාන වෙත ණය ලබා දී ඇති අතර සමාගමේ ප්‍රතිපත්තිවලට අනුව ණය ලබා දීමේදී කිසිදු ඇපයක් ලබාගෙන නොමැත. කෙසේ වෙතත්, . ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ අයකර ගැනීමේ දෙපාර්තමේන්තුව විසින් මේ වන විට රු. 91,780,017/- ක ණය සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලබාගෙන නොමැත. කෙසේ වෙතත් දැනට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ අයකර ගැනීමේ දෙපාර්තමේන්තුව විසින් මෙම ණය සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| 05. | 2017 අංක 24 දේශීය ආදායම් පනතේ 11 වන වගන්තිය අනුව භාවිතා කිරීමට අයිතිය ඇති වත්කම් (right of use assets) සඳහා ගෙවා ඇති කුලී, ගලපා නොමැති අතර රු. 1,886,442 ක් වැඩියෙන් ඉල්ලුම් කර ඇත. | බැංකුව දේශීය ආදායම් පනතට අනුකූල විය යුතුය. | එකඟ වූ අතර 2019/2020 තක්සේරු වර්ෂය සඳහා වාර්ෂික ආදායම් බදු වාර්තාවෙන් නිවැරදි කරනු ලැබේ. | නිවැරදි කර ඇත. |
| 06. | බැංකුවේ මුළු ණය කළඹෙන් රු. මිලියන 1,226 ක් හෙවත් සියයට 32.6 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට ක්ෂුද්‍ර මූල්‍ය ණය නියෝජනය කරයි. එය 2018 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 1,319 ක් හෙවත් සියයට 33.3 ක් විය.<br><br>මුළු හිඟ ක්ෂුද්‍ර මූල්‍ය ණය මුදලින් රු.මිලියන 520 හෙවත් සියයට 42 ක් 2019 දී හා රු.මිලියන 568 හෙවත් සියයට 43 ක් 2018 දී ප්‍රජාමූල සංවිධාන 05 කට ප්‍රදානය කර තිබූ අතර, බැංකුවට මෙය සැලකිය යුතු සාන්ද්‍රණ අවදානමක් ඇති කරයි. මීට අමතරව, ප්‍රමාණවත් ආරක්ෂිත ඇපකර | ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීමේදී ප්‍රජා පාදක සංවිධාන කිහිපයක් මත යැපීම අඩු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | පහත සඳහන් අවදානම් අවම කිරීමේ සාධක බැංකුව විසින් අනුගමනය කර ඇත. පහත සඳහන් සාධක සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව මෙම ප්‍රජා මූල සංවිධාන වෙත ණය ලබා දී ඇත:<br>• ප්‍රජා මූල සංවිධානයේ මූල්‍ය කාර්ය සාධනය<br>• ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සමඟ ණය කටයුතුවලදී ප්‍රජා මූල සංවිධානවල | එම අවදානම් අවම කිරීමේ සාධක බැංකුව විසින් අනුගමනය කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොමැති නිසා 2019 දෙසැම්බර් 31 දිනට ඉහත ශේෂයන් අය කර ගැනීම දුෂ්කර විය හැකිය. | | අතීත කාර්ය සාධනය<br>• ප්‍රජා මූල සංවිධාන හි මුළු ණය කළඹෙන් ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ ණය ගැනීම්.<br>• ණය කළඹට එරෙහිව ණය ආරක්ෂණ තැන්පතු ප්‍රතිශතය.<br>• ප්‍රජා මූල සංවිධානයෙහි අක්‍රිය ණය තත්ත්වය<br>• ප්‍රජා මූල සංවිධානයෙහි CRIB තත්ත්වය | |
| 07. | බැංකුවේ ප්‍රධාන අරමුණ වනුයේ තිරසාර ආදායම් උපයන අවස්ථා හඳුනාගැනීම, සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය, උත්ප්‍රේරණය සහ සහාය ලබාදීම හා ඵලදායී ස්වයං රැකියා සඳහා ග්‍රාමීය කාර්යන් සඳහා මූල්‍ය සහයෝගය හා සේවා ලබාදීම තුලින් දුප්පත් ජනතාව සඳහා ඉහළ ජීවන තත්වයක් ලබාදීම වුවද ඊට පටහැනි ලෙස බැංකුව සිය මුළු වත්කම් වලින් සියයට 66 ක් පමණ ප්‍රතිමිලදී ගැනුම්,ස්ථාවර තැන්පතු, ණයකර සහ ස්කන්ධ | බැංකුවේ ප්‍රධාන අරමුණ ඉලක්ක කර කටයුතු කරන බව සහතික වීම. | සටහන් කරගෙන ඇත. | සටහන් කරගෙන ඇත.<br>2021.01.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි සිය ව්‍යාපාරික කටයුතු නතර කිරීමට මහ බැංකුව ගත් තීරණයත් සමඟ බැංකුවට ණය ප්‍රදානය කළ නොහැකි වූ බැවින්, අරමුදල් ආයෝජනය කිරීම මේ මොහොතේ එකම විකල්පය වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කොටස් වැනි විවිධ කෙටිකාලීන ආයෝජන වල ආයෝජනය කර තිබූ අතර ණය හා අත්තිකාරම් වල ආයෝජන කර තිබුණේ සියයට 26 ක් පමණි. | | | |
| 08. | 2014 සිට 2018 දක්වා කාලය තුළ බැංකුව සිය වත්කම් පදනමෙහි සියයට 6 ක වර්ධන අනුපාතයක් වාර්තා කර ඇති අතර එය එම කාලය තුළම බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ සියයට 31 ක වර්ධන අනුපාතයට වඩා පහළ මට්ටමක පැවතුණි. | බැංකුවේ වත්කම් පදනමේ වර්ධන අනුපාතය කර්මාන්තයේ වර්ධන අනුපාතයේ මට්ටමට වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | සටහන් කරගෙන ඇත. | සටහන් කරගෙන ඇත. |

## 7. ජාතික ඉතිරිකිරීමේ බැංකුව

**1.** **ආයතනයේ නම:** **ජාතික ඉතිරිකිරීමේ බැංකුව**

2. මතය

2018 තත්ත්වාගණනය නොකළ මතය

2019 තත්ත්වාගණනය නොකළ මතය

2020 තත්ත්වාගණනය නොකළ මතය

3. අනුපාත විශ්ලේෂණය

| අනුපාත | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| - ලාභදායිත්වය, | | | |
| - ස්කන්ධය මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඊ) | 10.87 | 15.32 | 20.67 |
| - වත්කම් මත ප්‍රතිලාභ (ආර්.ඕ.එ) | 0.78 | 0.95 | 1.24 |
| උත්තෝලනය | 4.86 | 5.13 | 6.64 |
| ද්‍රවශීලතාවය | 54.9 | 60.2 | 69.10 |

4. ශුද්ධ වත්කම් තත්ත්වය

| | **2018 (රු.'000)** | **2019 (රු.'000)** | **2020 (රු.'000)** |
|---|---|---|---|
| මුළු වත්කම් | 1,036,845,567 | 1,157,966,664 | 1,363,808,376 |
| මුළු වගකීම් | -993,750,308 | -1,112,041,403 | -1,311,910,879 |
| ශුද්ධ වත්කම් | 43,095,259 | 45,925,261 | 51,897,497 |

5. රජයට ලබා දුන් දායකත්වය

| | **2018 රු.'000** | **2019 රු.'000** | **2020 රු.'000** |
|---|---|---|---|
| ලාභාංශ/බදු | 500,000 | 2,000,000 | 1,000,000 |

6. කාර්ය මණ්ඩල තත්ත්වය

| | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| අනුමත | 4,978 | 5,407 | 5,408 |
| තත්‍ය | 4,512 | 4,715 | 4,641 |

7. පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස පරිපාලන වියදම්

| | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස පරිපාලන වියදම් | 12.59 | 12.85 | 12.12 |

8. ප්‍රධාන විගණන නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | 2020 දෙසැම්බර් 31 දිනටවංචනික ලෙස තැන්පතු ආපසු ලබා ගැනීම් වලින් බැංකුවට ලැබිය යුතු මුදල රු. මිලියන 134.4 කි.ඒ අතරින් රු.103,963,153 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟව පැවතුණි.තවද, රක්ෂණයෙන් හෝ වෙනත් අයකරගැනීමේ ක්‍රමයකින් අයකර නොගත් රු.77,292,906 ක ශේෂයක් පවතී. | කාර්ය මණ්ඩලය විසින් සිදුකර ඇති වංචා සඳහා විනය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු අතර , වංචා අවම කරගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය. | කළමනාකරණ අංශය විසින් වංචනික තැන්පතු ආපසු ගැණුම් ගිණුම සම්බන්ධව නොකඩවා පසු විපරම් කරමින් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර ඇත. තවද, බැංකුව විසින් චක්‍රලේඛ හඳුන්වා දෙමින් දැඩි පරීක්ෂා කිරීම් හා අභ්‍යන්තර විගණන සිදුකරමින් අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කර ඇත. | BI ප්‍රතිපත්තිය අලුත් කිරීමේදී ශ්‍රී ලංකා රක්ෂණ සමාගමෙන් ලැබුණු අමතර දීමනාව සලකා බැලීමෙන් පසු 2021.12.31 දිනට වංචනික ලෙස මුදල් ආපසු ගැනීම්වලින් සිදු වූ පාඩුව රු. 81,556,657 ක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| 02. | 2008 වර්ෂයේදී මහල් 18 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වෘත්තීය සේවාවන් ලබාගැනීම වෙනුවෙන් රු. මිලියන 35.23 ක මුදලක් වැය කර තිබුණි.කෙසේ වෙතත් මෙම ඉදිකිරීම් වැඩ අත්හැර දමා තිබු අතර ඒ වෙනුවෙන් දරා ඇති වියදම ඵල රහිත වියදමක් බවට පත් වීම සහ එම ශේෂය 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් යටතේ දක්වා තිබුණි. | මෙම ගනුදෙණුව හරහා බැංකුවට වන අලාභය අවම කරගැනීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගත යුතුය. | මහල් 18 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (සීඊසීබී) ඇතුලත්ව බාහිර වෘත්තීය ආයතන සමගින් වන අතර ඔවුන්ගේ වෘත්තීය සේවාවන් සඳහා ගෙවන ලද ගෙවීම් මෙම ප්‍රාග්ධන වියදම නියෝජනය කරයි.<br><br>ප්‍රධාන කාර්යාල බිමෙහි විශාල සංවර්ධන කටයුත්තක් සැලසුම් කිරීමට මෙයට යාබදව ඇති පර්චස් 106 ක ඉඩම දිගුකාලීන බදු පදනම මත ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කෙරෙමින් පවතී.<br><br>ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ සේවය ලබාගැනීමට ඇති | වත්මන් තත්ත්වයද එසේම වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | හැකියාව පිළිබඳ සොයා බලමින් හා ඒ අනුව ඔවුන් මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගනු ලැබුවහොත් නව ව්‍යාපෘතිය සඳහා සේවා ගාස්තු සුදුසු ලෙස අඩුකරගැනීම වෙනුවෙන් ඔවුන් සමග සාකච්ඡා කරනු ඇත. | |
| 03 | රු.900,000 ක වටිනාකමැති ණය මුදලක මුල් ලියකියවිලි ඇතුලත් ලිපි ගොනුව අස්ථානගත වී තිබුණි. මෙම ණය මුදල 2012 මැයි 11 දින ලබා දී 2012 ඔක්තෝබර් 31 දින අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණ අතර **2021** දෙසැම්බර් **31** දිනට මුළු හිඟ මුදල රු. **3,022,817** ක් විය. ණය ලිපිගොනු භාර නිලධාරියාට එරෙහිව කිසිදු පරීක්ෂණයක් සිදු කර නොතිබූ අතර බැංකුවේ ණය අයකර ගැනීමේ ප්‍රතිපත්තින්හි 8 සහ 9 වගන්තිවලට අනුව ඇපකරුවන්ගෙන් හෝ ණය ආපසු අයකර ගැනීම සඳහා හෝ කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අස්ථානගත ණය ලිපිගොනු සම්බන්ධව බැංකුවට ඉහල අවදානමක් ඇති අතර එම අවදානම අවම කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. | ණය ලබාදුන් කාලෙයදී සිටි ස්ථානයෙන් වෙනත් ස්ථානයකට ගොස් ඇති බැවින් ණයගැතියා සම්බන්ධ කර ගැනීමට බැංකුවට නොහැක. | වත්මන් තත්ත්වයද එසේම වේ. |
| 04. | 2021 ජනවාරි මාසයේදි අභ්‍යන්තර විගණන අංශය විසින් ශාඛා 258 ක සිදු කරන ලද පරීක්ෂණයකට අනුව හිඟ වටිනාකම රු.195,365,919 ක් වු ණය ලිපි ගොනු 390 ක් අස්ථාන ගත වී තිබුණි.<br>අ. අස්ථානගත වු ලිපි ගොනු අතරින් ණය වටිනාකම රු.29,846,707 ක් වු ලිපිගොනු 100 ක් අක්‍රීය ණය ලිපිගොනු වේ. එම අක්‍රීය ගණයේ අස්ථානගත ණය ලිපිගොනු 100 වටිනාකම පිළිවෙලින් රු.1,506,770, රු.19,032,365 සහ රු.9,307,572 ක් වන නීති ලිපි ගොනු 2 කින් , නිවාස ණය ලිපිගොනු 38 කින් හා පෞද්ගලික ණය ලිපිගොනු 60 කින් සමන්විත වේ.<br>ආ. වාර්තා කරන දිනය දක්වා අස්ථානගත ලිපිගොනු සම්බන්ධයෙන් වගකිව යුතු | ණය ලිපිගොනු පවත්වාගෙන යාම උදෙසා අභ්‍යන්තර වැඩපිළිවෙල ශක්තිමත් කළ යුතුය. | වර්ෂයකට දෙවතාවක් දෙසැම්බර් 31 හා ජුනි 30 දින හෝ අවට කාලය තුල තම ශාඛාවන්හි ණය ලිපිගොනු සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදු කරන ලෙස ශාඛා කළමනාකරුවන්/ ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත දැනටමත් උපදෙස් ලබා දී ඇත. එයට | වත්මන් තත්ත්වයද එසේම වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | පාර්ශවයන්ට එරෙහිව බැංකුව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | අමතරව ශාඛා වෙත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) ගේ අංක 469/2018 දරන උපදෙස් ලිපිය හා ජොෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ගේ අංක 535/2019 දරන උපදෙස් ලිපිය මගින් මෙම ණය ලිපිගොනුවල ආරක්ෂිත වැදගත්කම හා අදාල උපදෙස් වලට අනුගත වීම පිළිබඳ උපදෙස් තවදුරටත් නිකුත් කර තිබුණි.<br><br>ණය ලිපිගොනු වල වැදගත්කම හා ආරක්ෂාව පිළිබඳ යම් දෝෂ තිබුණහොත්, එම තත්වය පිළිබඳ යාන්ත්‍රණය ශාඛා කාර්ය මණ්ඩලය දැනුවත් කරමින් හා 2022 වර්ෂය සඳහා කාර්යමණ්ඩල පුහුණු සැසි පවත්වමින් අඩු කරගැනීමට කටයුතු කරනු ඇත.<br><br>බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය හරහා පවතින අභ්‍යන්තර පාලන | |

| | | | | |
|---|---|---|---|---|
| | | | පද්ධතියේ අඩුපාඩු හා දුර්වලකම් හඳුනා ගෙන ඔවුන්ගේ නිර්දේශ මත යෝජිත Core Banking පද්ධතිය සමගාමීව සුදුසු යාන්ත්‍රණයක් සැලසුම් කළ යුතුය. | |
| 05 | අනුරාධපුර, ඇල්පිටිය, ගල්නෑව, කතරගම, කිරිදිවැල, මොණරාගල, රත්නපුර, කැකිරාව යන ප්‍රදේශවල පිහිටී ඉඩම් අටක නෛතික අයිතිය ලබා නොගෙන බැංකුව විසින් එම ඉඩම්වල ඉදිකිරීම සඳහා රු. මිලියන 83.6 ක මුදලක් වැය කර තිබේ. මෙම විගණන නිරීක්ෂණය 2014 වර්ෂයේ සිට වාර්තා කර තිබූ අතර එම වර්ෂයට පෙර මෙම ගොඩනැගිලි ඉදිකර තිබුණි. ඒවායේ නෛතික අයිතිය ලබා ගැනීමට ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් නියෝගයක් නිකුත් කර ඇත. කෙසේ වෙතත් බැංකුව විසින් 2020 වර්ෂයේ අවසානය වන විටත් එම ඉඩම්වල නෛතික අයිතිය ලබා ගෙන නොතිබුණි. | බැංකුව විසින් 2014 වර්ෂයේ සිට බදු අයිතිය ලබාගැනීමට උත්සාහ කර ඇත.<br><br>මෙම ඉඩම් සඳහා බදු ගිවිසුම් ලබාගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. | බැංකුව කොමසාරිස්, අනුරාධපුර මහ නගර සභාව, දොම්පේ, මොනරාගල, ඇල්පිටිය, ගල්නෑව සහ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආදි අදාළ වගකිවයුතු පාර්ශ්ව සමඟ සන්නිවේදනය කිරීමෙන් දිගුකාලීන කල්බදු ගිවිසුම් ලබා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටී. | තවම නීත්‍යානුකූල අයිතිය ලබාගෙන නොමැත. |
| 06 | පර්චස් 38.8 ක ඉඩමක් 2008 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියෙන් වසර 50 ක කාලයක් සඳහා බදු පදනම මත ලබා ගෙන තිබුණ ද මෙම ඉඩම පසුගිය වසර 11 තුළ ඵලදායී අරමුණක් සඳහා භාවිතා කර නොතිබුණි. | බැංකුව විසින් විශේෂ අරමුණක් ඇතිව ඉඩමක ආයෝජනය කළයුතුය. | බැංකුවේ මෙහෙයුම් සඳහා භාවිතා කිරීමට මෙම පරිශ්‍රයේ නව ගොඩනැගිල්ලක් වැඩි දියුණු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. කෙසේ වෙතත් රජය විසින් නව | |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගොඩනැගිලි ව්‍යාපෘති 2022 වර්ෂය දක්වා නැවැත්වීමට තීරණය කර තිබීම හා එබැවින් මෙම ව්‍යාපෘතිය කල්දැමීමට ආයතනික කළමනාකරණ කමිටුව තීරණය කර තිබුණි. | |
| 07 | 2008-2019 කාලය තුළ බැංකුව විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) කාඩ්පත් 1,955,432 ක් නිකුත් කර ඇත. එයින් සියයට 81 ක් Mag Stripe කාඩ්පත් වන අතර සියයට 19 ක් EMV කාඩ්පත් විය. වාර්තා වූ සියලුම ATM ස්කිමිං වංචා Mag Stripe කාඩ්පත් හරහා සිදුවී ඇත. 2019 දෙසැම්බර් 31 දිනට ATM ස්කිමිං වංචාවල මුළු වටිනාකම රු. 2,300,290 කි. | අනාගතයේදී ATM ස්කිමිං වංචා වැළැක්වීම සඳහා දැනට සිටින Mag Stripe කාඩ්පත් හිමියන් සඳහා EMV කාඩ්පතක් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. | 2018 මැයි මාසයේ සිට බැංකුව ගණුදෙනුකරුවන්ට EMV කාඩ්පත් පමණක් නිකුත් කරයි. අවශ්‍ය EMV කාඩ්පත් තොග එකල නොතිබූ බැවින් දැනට පවතින Mag Stripe කාඩ්පත් EMV කාඩ්පත් වෙත මාරු කිරීම 2018 සිට ආරම්භ කළ නොහැකි විය. | 2021 ඔක්තෝබර් 01 සිට මේ දක්වා (මාස 6) අවම වශයෙන් එක් වරක් භාවිතා කරන කාඩ්පත් හැර අනෙකුත් කාඩ්පත් 2022 මැයි 30 වන විට ඉවත් කරනු ලැබේ. SMS සහ මාධ්‍ය වෙළඳ දැන්වීම් හරහා අවසන් දැනුම් දීමකින් පසු ඉතිරි සියලුම කාඩ්පත් 2022 මැයි 30 වන විට ඉවත් කරනු ලැබේ. |
| 08 | එක් එක් කාර්යය සඳහා නිශ්චිත කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා නොගෙන, බැංකුවේ අනුමත කාර්ය මණ්ඩලය වර්ෂයෙන් වර්ෂයට වෙනස් වේ. පසුගිය වර්ෂ 5 ඇතුලත විධායක මට්ටමේ සහකාර සාමාන්‍යාධිකාරි සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරුවල අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව පහත ආකාරයෙන් වෙනස් වී තිබුණි. | මිනිස් බල සැලැස්මට වාර්ෂිකව සිදු කරන වෙනස්කම් අනවශ්‍ය තනතුරු සෑදීමට හා අසාමාන්‍ය බඳවාගැනීම් | අංශ ප්‍රධානීන්ගෙන් ලබාගත් ව්‍යාපාර මෙහෙයුම් ක්ෂේත්‍රවල අවශ්‍යතාවය පදනම් කරගෙන බැංකුවේ මිනිස් | තත්ත්වය එසේමය. 2021 වර්ෂය සඳහා වන මිනිස් බල සැලැස්ම 2021.07.19 දින අධ්‍යක්ෂ |

<table>
<tr>
<td></td>
<td><table><tr><td>තනතුර</td><td>2020</td><td>2019</td><td>2018</td><td>2017</td><td>2016</td></tr><tr><td>ජේ.නි.සා.</td><td>02</td><td>02</td><td>02</td><td>02</td><td>02</td></tr><tr><td>නි.සා.</td><td>12</td><td>12</td><td>13</td><td>13</td><td>13</td></tr><tr><td>සහ.සා.</td><td>26</td><td>26</td><td>21</td><td>19</td><td>24</td></tr></table></td>
<td>සිදුකිරීමට හේතු විය හැක.එම නිසා බැංකුව මේ සම්බන්ධයෙන් ඵලදායි පාලන ක්‍රම පවත්වා ගත යුතුය.</td>
<td>බල සැලැස්ම වාර්ෂිකව වෙනස් කරනු ලබයි.<br><br>ඒ අනුව මිනිස් බල සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය වාර්ෂිකව ලබා ගනී.</td>
<td>මණ්ඩලය විසින් අනුමත කර ඇත.</td>
</tr>
<tr>
<td>09</td>
<td>2018 දෙසැම්බර් 31 දිනට උකස් පද්ධතියේ දැක්වෙන ලැබිය යුතු උකස් අත්තිකාරම් ශේෂය පොදු ලෙජරයේ ශේෂය සමඟ රු. මිලියන 637 කි න් වෙනස් වේ. ඉහත වෙනස පිළිබඳ විමර්ශන කටයුතු අවසන් නොකර හිමිකම් ශේෂය ගලපමින් ප්‍රතිපාදනයක් සිදුකර ඇත.</td>
<td>සාධාරණ හා පිළිගත හැකි පදනමක් මත ප්‍රතිපාදන සැපයිය යුතුය.</td>
<td>ලැබිය යුතු පොළී ලෙස පොදු ලෙජරයේ දැක්වෙන මෙම වටිනාකම පෙර වර්ෂවලට අදාළ විය. ලැබිය යුතු දෑ අතරින් විය හැකි අලාභයන් සැලකිල්ලට ගනිමින්, 2019 දෙසැම්බර් 31 දිනට රු.637,405,736 ක ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි.</td>
<td>2021.06.02 දිනැති අංක 180/2021 දරන මණ්ඩල පත්‍රිකාවෙන් ලබා දී ඇති උපදෙස් මත උකස් කිරීම මත ලැබිය යුතු රු. මිලියන 637 ක ශුද්ධ වෙනස කපා හැරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.</td>
</tr>
</table>

## 8. රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව

1. ආයතනයේ නම - රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව

2. වර්ෂ සඳහා මතය

| | |
|---|---|
| 2018 | තත්ත්වාගණනය කළ මතය |
| 2019 | තත්ත්වාගණනය නොකළ මතය |
| 2020 | තත්ත්වාගණනය නොකළ මතය |

3. අනුපාත විශ්ලේෂණය

| අනුපාත | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| ලාභදායිත්වය | | | |
| වත්කම් මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඒ) | 1.13 | 1.11 | 1.15 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඊ) | 4.82 | 7.73 | 6.09 |
| **ශුද්ධ පොලී ආන්තිකය** | 4.72 | 4.52 | 4.24 |
| උත්තෝලනය | | | |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය-ස්ථර** 1 | 21.69 | 21.04 | 21.58 |
| ද්‍රවශීලතාවය | | | |
| **ද්‍රවශීලතා ආවරණ අනුපාතය** | 83.91 | 121.05 | 116 |

4. ශුද්ධ වත්කම් තත්ත්වය

| | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| මුළු වත්කම් | 42,597,268,360 | 47,311,436,771 | 52,801,920,647 |
| මුළු වගකීම් | 37,410,284,396 | 41,652,768,226 | 46,782,411,961 |
| ශුද්ධ වත්කම් | 5,186,983,964 | 5,658,668,546 | 6,019,508,686 |

5. 2018, 2019 **සහ** 2020 **යන වර්ෂ සඳහා** රජයට ලබා දුන් දායකත්වය

| | 2020 | 2019 | 2018 |
|---|---|---|---|
| **ලාභාංශ** | | | |
| **බදු හෝ වෙනත්** | | | |
| **රජයෙන් ලැබෙන සහනාධාර හෝ ප්‍රදාන** | ගෙවා නැත | ගෙවා නැත | ගෙවා නැත |
| **මූල්‍ය වියදම් සඳහා රජයේ ඇපකර ණය ලැබී ඇත** | | | |
| | | | |

6. **කාර්ය මණ්ඩල තත්ත්වය (අනුමත, තත්‍ය, අතිරික්තය / හිඟය)**

|  | 2020 | 2019 | 2018 |
|---|---|---|---|
| අනුමත | 467 | 467 | 467 |
| **තතය** | 369 | 378 | 389 |

**7.** පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස පරිපාලන වියදම්

|  | **වියදම රු.** | **ආදායම රු.** | ආදායමට ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| 2020 | 1,509,807,674 | 6,076,716,152 | 25% |
| 2019 | 1,357,752,801 | 5,981,510,158 | 23% |
| 2018 | 1,348,957,453 | 5,524,856,523 | 24% |

**8. ප්‍රධාන විගණන නිරීක්ෂණ**

|  | **විගණන නිරීක්ෂණ** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 01. | වසර 12කට වැඩි කාලයක සිට EPF සහ ETF ගෙවිය යුතු ගිණුම්වල රු. 3,008,166 ක නොසැසඳු ශේෂයක් ඉදිරියට ගෙන ගොස් තිබුණි. | එම මුදල නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | 2019 වසර අවසන් වීමට පෙර ඉහත වෙනස නිරවුල් කිරීමට පියවර ගනු ලැබේ. | මුදල නිරවුල් කර ඇත. |
| 02. | රු. 2,400,000 ක මුදලක් වංචා ගිණුමක සටහන් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වත්කම් යටතේ අනාවරණය කර ඇත. 1999 දී සිදු වූ වංචා දෙකකට අදාළ මුදල මෙම ශේෂයෙන් පිළිබිඹු කරයි. කෙසේ වෙතත්, මෙම ශේෂය අයකර ගැනීමේ හැකියාව සැක සහිත වේ. | බැංකුවේ නීති අංශයෙන් අයකරගත නොහැකි බව තහවුරු කිරීමෙන් පසු එම මුදල කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | ඉහත වංචා ආපසු අයකර ගැනීමේ හැකියාව ඉතා දුරස්ථ වේ. 2019 දෙසැම්බර් අවසානයට පෙර කපා හැරීමට කටයුතු කරනු ඇත. | ශේෂය කපා හැර ඇත. |
| 03 | 2016 සැප්තැම්බර් 01 සිට 2017 මාර්තු 31 දක්වා කාලය තුළ බැංකුවේ ණය අංශය විසින් ව්‍යාජ පෞද්ගලික | එම මුදල අයකර ගැනීම සඳහා වැරදිකරුවන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ | අදාළ සැකකරුවන්ට එරෙහිව අපරාධ විමර්ශන කොට්ඨාශයේ නඩු | සීඅයිඩී පරීක්ෂණ ක්‍රියාත්මකයි. |

| | | | | |
|---|---|---|---|---|
| | ආයතන දෙකක සේවකයින් ලෙස පෙනී සිටි අයදුම්කරුවන් හතළිස් හත් දෙනෙකු (47) සඳහා රු. මිලියන 66.34 ක ණය ලබා දී ඇත. ව්‍යාජ ආයතන දෙකේ සේවකයින් ලෙස පෙනී සිටින අයදුම්කරුවන් අදාළ ණය සඳහා අයදුම් කිරීමේදී ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බව අනාවරණය විය. ඉහත ණය මුදලින් රු. 61,506,617 ක් 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය ලෙස වාර්තා කර තිබුණි. | වගකිවයුතු සේවකයින් හඳුනාගෙන අවශ්‍ය පියවර ගැනීම. | පවරා ඇති අතර එම ණය ලබාදීමට සම්බන්ධ අදාළ සේවකයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| 04. | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ කුලිය වශයෙන් රු. 38,312,700 ක් ගෙවා තිබුණද, ගොඩනැගිල්ල ඉතා පැරණි බැවින් ගොඩනැගිල්ලේ කාර්යාල හා වාහන නැවැත්වීමේ ඉඩකඩ, වොෂ් රූම්, දිවා ආහාර කාමරය, ගබඩා, රැහැන් පද්ධති ආදී බොහෝ පහසුකම් සතුටුදායක මට්ටමක නොමැත. තවද, කුලී ගිවිසුමේ විධිවිධාන අනුව රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට බැංකුව අපොහොසත් වී ඇත. එබැවින් කාර්ය මණ්ඩලයේ, වත්කම්වල සහ ගණුදෙනුකරුවන්ගේ ආරක්ෂාව අවදානමට ලක්ව ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ලැබීමෙන් පසුව නව ගොඩනැගිල්ලක් මිලදී ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | බැංකුවේ ඉල්ලීම පරිදි මුදල් අමාත්‍යාංශය විසින් නව ගොඩනැගිල්ලක් මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත, ප්‍රසම්පාදන කමිටුව විසින් ගොඩනැගිල්ලක් තෝරාගෙන 2018 ඔක්තෝම්බර් මාසයේදී ඔවුන්ගේ නිර්දේශය අමාත්‍යාංශය වෙත ලබා දී ඇතත්, මේ දක්වා අපට නව ගොඩනැගිල්ල සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී නොමැත. | තවම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 05 | 2020 දෙසැම්බර් 31 දිනට "ස්ලිප් පාලන ගිණුම" තුළ වාර්තා කරන ලද රු. 1,871,997 ක නොසැසඳු බැර වටිනාකමක් පවතී. | නොසැසඳු ශේෂය සැසඳීමට හෝ කපා හැරීමට හෝ ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | ලේඛනගත සාක්ෂි නොමැතිකම හේතුවෙන් මෙම ශේෂය කපා හැරිය යුතුය. | ස්ලිප් පාලන ගිණුම දැන් නිරවුල් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 06 | 2019 වර්ෂය සඳහා දැනටමත් ගෙවා ඇති රු. 12,450,865 ක අතිරික්ත ගෙවීම සැලකිල්ලට නොගෙන 2020 ජුනි 30 වන දින 2019 වර්ෂය සඳහා මූල්‍ය සේවා මත වැට් බද්දේ අවසාන ගෙවීම ලෙස කළමනාකාරිත්වය විසින් රු. 12,609,581 ක් ගෙවා ඇත. | තහවුරු කරන ලද තොරතුරු සමඟ අවසන් ගෙවීම් කිරීම. | අපගේ බදු උපදේශක විසින් ලබා දී ඇති තාක්ෂණික උපදෙස් අනුව 2019/2020 කාලසීමාව සඳහා බැංකුව මූල්‍ය සේවා සඳහා අවසන් වැට් බද්ද ලෙස රු. 12,609,581 ගෙවා ඇත, මෙම ගණනයට ලාභාංශ ආදායම මත මූල්‍ය නොවන වැට් බදු ආදායම, සාධාරණ වටිනාකම් ලාභය සහ මූල්‍ය ආයතනයක් සමඟ ස්ථානගත කිරීම මත ආයෝජන ආදායම ඇතුළත් විය. ඉහත මූලාශ්‍රවල ආදායම තක්සෙරු වර්ෂය සඳහා වන අවසාන වැට් බදු ප්‍රකාශනයෙන් ඉවත් කරන ලෙස ඔවුන් අපට උපදෙස් දී ඇත. 2019/2020 මූල්‍ය වැට් බද්ද යටතේ ඉහත මූලාශ්‍ර සලකා බැලීම අභියෝගයට ලක් කරමින් අභියාචනාධිකරණයේ නඩුව තවමත් විභග වෙමින් පවතී. නඩුවේ තීන්දුව පැමිණිලිකාර බැංකුවට පක්ෂව නිකුත් කළහොත් එවැනි ප්‍රතිලාභයක් ඉල්ලා සිටිය හැක. එම තීන්දුව පැමිණිලිකරුට එරෙහිව නිකුත් කළහොත් ඉහත සඳහන් ආදායම් මාර්ග සඳහා මූල්‍ය වැට් බදු නොගෙවීම | දැන් පියවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සම්බන්ධයෙන් බැංකුව කිසිදු දඩයක් නොලබයි. | |
| 07 | මූලික බැංකුකරණ විසඳුම (core banking solution) මිලදී ගැනීමේ ක්‍රියාවලිය 2016 ජුනි මස ආරම්භ වුවද, විගණන දිනය දක්වා නව මූලික බැංකුකරණ විසඳුම මිලදී ගැනීමට බැංකුවට නොහැකි විය. | බැංකුව සඳහා මූලික බැංකුකරණ විසඳුම හැකි ඉක්මනින් මිලදී ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | බැංකුව 2020-ජුලි 16 වැනි දින ලංසු විවෘත කර ඇති අතර ලංසු යෝජනා 5ක් ලැබී ඇත. ඉන් අනතුරුව, තාක්ෂණික ඇගයීම් කමිටුව තාක්ෂණික ඇගයීම (I අදියර) පිළිබඳ ඇගයීම ආරම්භ කර තාක්ෂණික ඇගයීම් වාර්තාව සම්පූර්ණ කර 2020 දෙසැම්බර් 02 වන දින අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව ("මුදල් සහ ප්‍රාග්ධන වෙළඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය") වෙත ඉදිරිපත් කර ඇත. මෙම වාර්තාව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත තාක්ෂණික ඇගයීම් අදියර සම්පූර්ණ කිරීමෙන් පසු ඇගයීම් ක්‍රියාවලියේ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා වන අතුරු වාර්තාවක් වන අතර මූල්‍ය ඇගයීම දිගටම කරගෙන යාමට මූල්‍ය සහ දෘඩාංග යෝජනා විවෘත කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුවට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබුණු පසු, තාක්ෂණික ඇගයීම් | ක්‍රියාවලිය ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කමිටුව විසින් මූල්‍ය ලංසු විවෘත කිරීමටත්, ඇගයීමේ අවසන් අදියර වන මූල්‍ය ඇගයීම දිගටම කරගෙන යාමටත් කටයුතු කරනු ඇත. | |
| 08 | බැංකුවේ සේවක සංඛ්‍යාව අනුව, අනුමත සේවක සංඛ්‍යාව සහ තත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙළින් 467 ක් සහ 369 ක් වූ අතර ඒ අනුව 2020.12.31 දිනට පුරප්පාඩු 98 ක් ඇත. බැංකුවේ සුමට ක්‍රියාකාරිත්වයට බලපාන ප්‍රධාන කළමනාකාර තනතුරු 17ක් 2020 දෙසැම්බර් 31 වන විට පුරප්පාඩු වී ඇති බව වැඩිදුරටත් අනාවරණය විය. | බැංකුවේ සුමට මෙහෙයුම් සහතික කිරීම සඳහා අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | බැංකුවේ යෝජිත ශාඛා පුළුල් කිරීම හා සම්බන්ධව බැංකුවේ සේවක සංඛ්‍යාව මුලින් තීරණය කර ඇත. කෙසේ වෙතත්, බැංකුවේ අවම නියාමන ප්‍රාග්ධනය රැස්වන තුරු නව ශාඛා විවෘත කිරීමට අවසර දීම CBSL විසින් අත්හිටුවා ඇති අතර, පුරප්පාඩු පිරවීම කල් දමා ඇත. | එම තත්ත්වයම වේ. |
| 09 | බැංකුව විසින් සේවක වැටුපෙන් අඩු කිරීම වෙනුවට එහි සේවකයින් වෙනුවෙන් සිය අරමුදල්වලින් 2020 වර්ෂය සඳහා රු. 1,756,213 ක මුදලක් උපයන විට ගෙවන බදු ලෙස ගෙවා තිබුණි. | බැංකුවේ උපයන විට ගෙවන බදු ගෙවීමට අදාළව "2016 අප්‍රේල් 29 දිනැති අංක PED 03/2016 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයට" අනුකූල විය යුතුය. | සාමූහික ගිවිසුමේ කොන්දේසි අනුව උපයන විට ගෙවන බදු (ඒපීටී) ගෙවයි. | එම තත්ත්වයම වේ. |
| 10 | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 3.1.i.e වගන්තිය අනුව මණ්ඩලය බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත් බව සහ අඛණ්ඩතාව සමාලෝචනය කළ යුතුය.<br>තොරතුරු සහ වාර්තා උත්පාදනය කිරීමේදී AS 400 කර්මාන්තයේ අවශ්‍යතාවය සඳහා පහසුකම් සපයා නොමැත. | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 3.1.i.e වගන්තියේ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. | නව මූලික බැංකු පද්ධතියක් මිලදී ගැනීමට බැංකුව කටයුතු යොදා ඇත.<br>2021.12.16 දින ලංසු ඇරයුම් කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් ප්‍රකාශයට පත් කරන ලද අතර 2022.02.03 දිනෙන් ලංසු අවසන් වේ. | එම තත්ත්වයම වේ. |

| | | | | |
|---|---|---|---|---|
| 11 | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 3.2.i වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, අධ්‍යක්ෂවරුන් 7 ට නොඅඩු සහ 13 කට නොවැඩි විය යුතුය.<br>බැංකු පනතට අනුව, අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හත් (7) විය යුතුය. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ තත්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පහක් (5) විය. | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 3.2.i වගන්තියේ රේගුලාසිවලට අනුකූල විය යුතුය. | සටහන් කර ගන්නා ලදි.<br>දැන් අනුකූළ වී ඇත. | එම තත්ත්වයම වේ. |
| 12 | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 3.5.ix වගන්තිය අනුව සභාපතිවරයා විසින් ප්‍රධාන කළමනාකාරිත්වයේ හෝ වෙනත් විධායක රාජකාරිවල සෘජු අධීක්ෂණය සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරත නොවිය යුතුය.<br>ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර කළමනාකරු (ණය) සහ සහකාර අභ්‍යන්තර විගණකවරයාගේ පත්වීම් ලිපි 2020 දී සභාපතිවරයා විසින් අත්සන් කර ඇති බව නිරීක්ෂණය විය. | සභාපතිවරයා බැංකුවේ විධායක රාජකාරි ඉටු නොකළ යුතුය. | සටහන් කර ගන්නා ලදි.<br>2021 දෙසැම්බර් 31 දිනැති ලිපිය මගින් අපි මේ කාරණය සම්බන්ධයෙන් GA වෙතින් පැහැදිලි කිරීමක් ඉල්ලා ඇත. | එම තත්ත්වයම වේ. |
| 13 | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 3.6.iii.c වගන්තිය අනුව මානව සම්පත් හා වේතන කමිටුව විසින් නියමිත ඉලක්ක සහ අරමුණුවලට එරෙහිව ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ කාර්ය සාධනය වරින් වර ඇගයීමට ලක් කළ යුතුය.<br>ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ කාර්ය | 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 3.6.iii.c වගන්තියේ රේගුලාසිවලට අනුකූල විය යුතුය. | ඉදිරි ක්‍රියාමාර්ග සඳහා සටහන් කර ගන්නා ලදි.<br>අනාගතයේදී එකඟ වූ KPIs වලට එරෙහිව KMPs වල කාර්ය සාධනය නිරීක්ෂණය කිරීමෙන් ඔවුන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. | එම තත්ත්වයම වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | සාධන ඇගයීම සඳහා බැංකුව ආරම්භයේ දී නියමිත අරමුණු සහ ඉලක්ක සලකා බලා නොමැති බව නිරීක්ෂණය විය. | | | |
| **14** | 2020 දෙසැම්බර් 31 දිනට රු.72,103,281 ක දිගුකාලීන පාරිභෝගික මුදල් ආපසු ගෙවීමේ ශේෂයන් නිරීක්ෂණය විය. | දිගුකාලීන පාරිභෝගික මුදල් ආපසු ගෙවීමේ ශේෂය ඉක්මනින් පියවිය යුතුය. | 2021.12.31 දිනට මෙම ගිණුමේ ශේෂය රු. 50,739,909 ක් දක්වා අඩු විය. | |
| **15** | 2020 දෙසැම්බර් 31 දිනට 2/22/4703 සහ 2/22/4702 යන ලෙජර් ගිණුම්වලට අදාළව පිළිවෙළින් රු. 1,563,966 ක සහ රු. 1,233,723 ක දිගුකාලීන හිඟ අත්තිකාරම් ශේෂ දෙකක් පවතී. | දිගුකාලීන හිඟ අත්තිකාරම් ශේෂය හැකි ඉක්මනින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | | |

## **9.** මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සි

1. **ආයතනයේ නම** — **මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සි**

2. **වර්ෂ සඳහා මතය**

| | |
|---|---|
| 2018 | කරුණක් අවධාරණය කිරීම සහිත තත්ත්වාගණනය නොකළ මතය |
| 2019 | කරුණක් අවධාරණය කිරීම සහිත තත්ත්වාගණනය නොකළ මතය |
| 2020 | කරුණක් අවධාරණය කිරීම සහිත තත්ත්වාගණනය නොකළ මතය |

3 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | **2018 (%)** | **2019 (%)** | **2020 (%)** |
|---|---|---|---|
| **කාර්ය සාධන අනුපාත** | | | |
| ස්කන්ධය මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඊ) | 6.30 | 4.0 | (54.39) |
| වත්කම් මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඒ) | 0.51 | 0.28 | (3.20) |
| පොලී ආන්තිකය | 7.83 | 6.52 | 4.50 |
| **වත්කම්වල ගුණාත්මක අනුපාතය** | | | |
| දළ අක්‍රීය අත්තිකාරම් (එන්.පී.එල්) | 11.46 | 14.53 | 16.84 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත** | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය | 4.70 | 5.64 | 4.41 |
| මුළු ප්‍රාග්ධනය | 8.98 | 8.64 | 5.59 |
| **ව්‍යවස්ථාපිත අනුපාතය** | | | |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය | 10.20 | 12.30 | 8.17 |

4. ශුද්ධ වත්කම් තත්ත්වය

| | **2018 (රු.'000)** | **2019 (රු.'000)** | **2020 (රු.'000)** |
|---|---|---|---|
| මුළු වත්කම | 35,659,527 | 36,975,116 | 32,359,209 |
| මුළු වගකීම් | (33,135,423) | (34,367,328) | (30,891,358) |
| ශුද්ධ වත්කම් | 2,524,104 | 2,607,788 | 1,467,851 |

5. 2018, 2019 සහ 2020 යන වර්ෂ සඳහා රජයට ලබා දුන් දායකත්වය

| **විස්තරය** | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| රජයට ගෙවන ලාභාංශ/බදු | - | - | - |

6. කාර්ය මණ්ඩල තත්ත්වය (අනුමත, තත්‍ය, අතිරික්තය/හිඟය)

| **විස්තරය** | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව | ලබා දී නැත. | 1338 | 1299 |
| තත්‍ය සේවක සංඛ්‍යාව | ලබා දී නැත. | 1000 | 976 |
| අතිරික්තය / හිඟය | ලබා දී නැත. | 338 | 414 |

7. පිරිවැටුම/ආදායමට ප්‍රතිශතයක් ලෙස පරිපාලන වියදම්

| **විස්තරය** | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| මුළු ආදායම (රු.'000) | 6,549,905 | 6,839,015 | 5,188,013 |
| මුළු මෙහෙයුම් වියදම් (රු.'000) | 2,005,619 | 2,122,317 | 1,955,140 |
| ආදායමට ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් වියදම් | 30.6 | 31.0 | 37.7 |

8. විගණන නිරීක්ෂණ

| | **විගණන නිරීක්ෂණ** | **විගණන නිරීක්ෂණ සිදු කළ වර්ෂය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **කළමනාකාරිත්වය විසින් කරන ලද අදහස් දැක්වීම්** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|---|---|
| 01. | සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී, වසරකට වැඩි කාලයක් සඳහා ණය හිමියන්ගේ දීර්ඝ කාලින ශේෂය රු.10,994,432 කි.හඳුනා නොගත් ඍජු තැන්පතු සහ ඉදිරිපත් නොකළ ගෙවීම් ඊට ඇතුළත් ය. | 2018 | මාසික හා වසර අවසාන සැසඳුම් සකස් කිරීමේදී කළමනාකාරිත්වය සිය පද්ධති තවදුරටත් වැඩිදියුණු කළ යුතු බව නිර්දේශ කෙරේ. සැසඳුම් පිළිබඳ ගැඹුරු සමාලෝචනයක් සිදු කරන අතර සංශෝධනය | උසාවි නඩු සහ අතිරික්ත ගෙවීම් සිදු කළ පුද්ගලික ණය හැර හඳුනාගත් කළඹ සසඳන අතර අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම 2019 දෙසැම්බර් මාසයට පෙර සිදු කරනු ලැබේ. | අයකිරීමේ අංශය සහ ශාඛා කණ්ඩායම ගනුදෙනුකරුවන්ගේ ඍජු තැන්පතු නිරන්තරයෙන් අධීක්ෂණය කර නිෂ්කාශන | මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2021 ඔක්තෝම්බර් මාසයේදී දිගුකාලීන හිඟ ශේෂය රු. මිලියන |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | කළ සටහන් අනුමත කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යා විකෘති කළ හැකි දිගුකාලීන හිඟ ශේෂයන් නොමැති බවට කළමනාකාරිත්වය සහතික විය යුතුය. | | ය කරයි. | 14 ක් නිරවුල් කරන ලදි. |
| 02. | 2018 ජූලි මස 1 වන දින සිට සමාගම පළමු පෙළ ප්‍රාග්ධනය සියයට 6 ට වඩා සහ මුළු ප්‍රාග්ධනය සියයට 10 ට වඩා පවත්වා ගත යුතුය.කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතාවයට අනුකූල වීමට සමාගම අපොහොසත් වී ඇත.තවද, මෙම අනුකූලතාවයට එරෙහි ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග පැහැදිලි කිරීම සඳහා සමාගමට පුළුල් සැලැස්මක් මේ වන විට නොමැත. | 2018 | මෙම තත්වය මඟහරවා ගැනීම සඳහා සමාගමේ කළමනාකාරිත්වය විසින් පිළියම් යෙදිය යුතු බව නිර්දේශ කෙරේ. | සවිස්තර සැලැස්මක් ඉදිරිපත්කර අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කර ඇත.උපදෙස් හා අනුමැතිය සඳහා මව් සමාගම ලෙස BOC වෙත එම ක්‍රියා පටිපාටියම ඉදිරිපත් කර ඇත.මේ අතර, සීබීඑස්එල් විසින් වසර 4 ක කාලයක් තුළ අයිඑෆ්ආර්එස් 9 දින 1 බලපෑම හඳුනා ගැනීමට ඉඩ ලබා දීමේ හැකියාව ලිඛිතව පෙන්වා දී ඇත. | රු. මිලියන 2,100 ක නව ප්‍රාග්ධනය ක් යෙදවීම.<br><br>අයවැයගත වාර්ෂික ලාභ ලබා ගැනීම මගින් රඳවාගත් ඉපැයීම් වැඩි කිරීම. | සියලුම CBSL නියාමන ප්‍රාග්ධන අනුපාත 2021.12.31 දිනට අනුකූල වේ. |
| 03. | මෙම කාල සීමාව තුළදී සමාගම විසින් වත්තල පිහිටි ඔවුන්ගේ දේපළවලින් එකක් රු. 94,297,500 කට බැහැර කරන ලදි. එස්.ඒ.එම්.ඒ.පෙරේරා මහතා විසින් 2018 අගෝස්තු 7 දින කරන ලද තක්සේරුව අනුව ඉහත දේපලෙහි බලකර විකිණීමේ වටිනාකම රු.98,250,000කි මෙම දේපලෙහි තක්සේරුව | 2018 | මෙම ගනුදෙනු සිදු කිරීමට පෙර ඒවා නිසි ලෙස ඇගයීමට ලක් කිරීම නිර්දේශ කරනු ලැබේ. | මෙම දේපල අත්පත් කර ගනු ලැබුවේ ගනුදෙනුකරු විසින් ණය පහසුකම් නොගෙවීම හේතුවෙනි.<br>පහත සඳහන් හේතූන් මත සමාගම එම දේපල බැහැර කර ඇත. | විනිවිදභාවය ශක්තිමත් කිරීම සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද 'අත්පත් කරගත් | මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්තිය අනුගමනය කරයි. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | රු.3,952,500 කින් සත්‍ය විකුණුම් වටිනාකමට වඩා වැඩියෙන් පෙන්නුම් කෙරේ. මෙම දේපල MBSL හි දැනට සිටින එක් ගනුදෙනුකරුවකුට විකුණා ඇත්තේ රු. 64,297,500 ක නව ණයක් ලෙසිනි.පසුව එම දේපලම පාරිභෝගිකයා විසින් MBSL වෙත කුලියට දී ඇත.විකිණීමේ ලාභය ලෙස රු. 83,199,014 ක් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හදුනා ගෙන ඇති අතර එමඟින් සමාගමේ පහළම තලය ඉහළ නැංවීම සඳහා ගනුදෙනුව සිදුවී ඇත්දැයි සැක කෙරේ. | | | 1.පාරිභෝගිකයාට ලබා දී ඇති ණය මුදල අය කර ගැනීම.<br>2.ලැබීමක් නොමැති (Non – Yielding) වත්කම ඇවර කිරීම.<br>එම දේපල විකිණීමෙන් පසු කුලියට ගෙන නොමැත. නිසි ණය ඇගයීමකින් පසුව මෙම ණය ගැනුම්කරුට ලබා දී ඇති අතර ණය ලබා දීම ද අපගේ ප්‍රධාන ව්‍යාපාරය වේ.මෙය සමාගමට ප්‍රධාන ආදායම ලැබීම වේ.කෙසේ වෙතත්, ලබා දී ඇති කාලයට පෙර ණය මුදල පාරිභෝගිකයා විසින් සම්පූර්ණයෙන් පියවා ඇත.මෙය මූල්‍ය සමාගමක සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තකි. | දේපළ බැහැර කිරීම පිළිබඳ මාර්ගෝප දේශ" ක්‍රියාත්මක වේ. | |
| 04. | රු. 40,279,985 ක අවිනිශ්චිත ගිණුම් ශේෂය සඳහා විගණනය සඳහා ලේඛනගත සාක්ෂි ලබා දී නොමැත. | 2018 | මාසික හා වසර අවසාන සැසඳුම් සකස් කිරීමේදී කළමනාකාරිත් වය සිය පද්ධති තවදුරටත් වැඩිදියුණු කළ යුතු බව නිර්දේශ කෙරේ. සැසඳුම් පිළිබඳ ගැඹුරු සමාලෝචනයක් සිදු කරන අතර | කළමනාකරණය අවිනිශ්චිත ගිණුම්වල ශේෂයන් නිරවුල් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර එය 2019 ඔක්තෝබර් අවසානය වන විට අවසන් කළ හැකිය. | මණ්ඩලය විසින් අනුමත කරන ලද 'දිගුකාලීන හිඟ ශේෂ නිෂ්කාශන ප්‍රතිපත්තිය ' ක්‍රියාත්මක වේ. ප්‍රතිපත්තිය ට අනුව, | මණ්ඩල යේ අනුමැති යට අනුව, 2021.12. 31 දිනට ශේෂය නිරවුල් විය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | සංශෝධනය කළ සටහන් අනුමත කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යා විකෘති කළ හැකි දිගුකාලීන හිඟ ශේෂයන් නොමැති බවට කළමනාකාරිත්වය සහතික විය යුතුය. | | අභ්‍යන්තර විගණන අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරන ඕනෑම අනුමැතියක් නිර්දේශ කළ යුතුය. | |
| 05. | රු. මිලියන 2,375 ක් වටිනා පහසුකම් 13,379 ක් අක්‍රීය පහසුකම් ලෙස පද්ධතිය තුළ සලකුණු කර ඇතත් ඒවාට එරෙහිව කිසිදු නීතිමය පියවරක් ගෙන නොමැත. | 2019 | පැහැර හරින ලද ගනුදෙනුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ. | ලේඛනගත කිරීමේ අඩුපාඩු කිහිපයක් නිසා මෙය ප්‍රමාද විය. | පද්ධතිය තුළ "අක්‍රීය පහසුකම්" ලෙස සලකුණු කර ඇති සියලුම පහසුකම් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුව වෙත යොමු නොකෙරේ.<br><br>නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුවට යොමු කරන පහසුකම් සම්බන්ධයෙන් පමණක් සමාගම නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ | නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුවට යොමු කරන පහසුකම් සම්බන්ධයෙන් පමණක් සමාගම නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරයි. |

<table>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td>කරයි.</td><td></td></tr>
<tr><td>06.</td><td>අවිනිශ්චිත ගිණුමේ ඇතුළත් රු.2,867,968 ක හර ශේෂයන් හා රු.2,525,500 ක බැර ශේෂයන් සැසඳීමට සමාගමට නොහැකි වූ අතර අදාල ශේෂයන් සඳහා මුල් ලිපි ලේඛන හෝ සහයක ලිපි ලේඛන සැපයීමටද නොහැකි විය.</td><td>2019</td><td>අවිනිශ්චිත ගිණුමේ ඇතුළත් ශේෂයන් සැසඳීමට හා නිරවුල් කිරීමට නිර්දේශ කෙරේ.</td><td>රු.1 , 418,425 ක ශේෂය 2020 ජනවාරි 30 දිනට නිවරදි කර ඇති අතර අනෙකුත් ශේෂයන් 2020 දෙසැම්බර් 31 ක දිනෙන් අවසන් වන වර්ෂයෙදී නිවැරදි වනු ඇත.</td><td>මණ්ඩලය විසින් අනුමත කරන ලද 'දිගුකාලීන හිඟ ශේෂ නිෂ්කාශන ප්‍රතිපත්තිය' ක්‍රියාත්මක වේ. ප්‍රතිපත්තියට අනුව, අභ්‍යන්තර විගණන අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරන ඕනෑම අනුමැතියක් නිර්දේශ කළ යුතුය.</td><td>මණ්ඩලය අනුමත ප්‍රතිපත්තියට අනුව 2021.12. 31 දිනට ශේෂය නිරවුල් කරන ලදි.</td></tr>
<tr><td>07.</td><td>ණය හිමියන්ගේ තාවකාලික ගිණුම්, හඳුනා නොගත් ඍජු තැන්පතු, ඉදිරිපත් නොකළ ගෙවීම් හා සැළසුම් නොකළ ගෙවීම් එකතු කිරීමේ ගිණුම්වල දිර්ඝ කාලීන හිඟ ශේෂයන් නිරීක්ෂණය විය. දිර්ඝ කාලීන හිඟ ශේෂවල වයස් විශ්ලේෂණය පහත වගුවේ දැක්වේ.<br><table><tr><td rowspan="2">විස්තරය</td><td colspan="4">හිඟ කාල සීමාව (අවුරුදු)</td></tr><tr><td>0-1</td><td>1 -3</td><td>3-5</td><td>අවු. 5 ට</td></tr></table></td><td>2019</td><td>තාවකාලික ගිණුම්වල දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට නිර්දේශ කෙරේ.</td><td>අදාළ අංශ සමඟ සැසඳීම සිදු කරමින් පවතී. ඊට අමතරව, නොසැදෙන සියළු ශේෂ වර්ෂය අවසානයේදී නිරවුල් කිරීමට ප්‍රතිපත්තියක් සංවර්ධනය කළ යුතු අතර 2020 වසර අවසන් වන විට අනුමතිය ලබා ගත යුතුව ඇත.</td><td>මණ්ඩලය විසින් අනුමත කරන ලද 'දිගුකාලීන හිඟ ශේෂ නිෂ්කාශන ප්‍රතිපත්තිය' ක්‍රියාත්මක වේ. ප්‍රතිපත්තියට අනුව, අභ්‍යන්තර විගණන අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය</td><td>ණයහිමියන්: මණ්ඩලයේ අනුමැතියෙන් පසුව හැකි සියලුම දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කරන ලදි.<br>හඳුනා නොගත් ඍජු තැන්පතු: සඳහන්</td></tr>
</table>

<table>
<tr>
<td></td>
<td>
<table>
<tr><td></td><td></td><td></td><td></td><td>වැඩි</td></tr>
<tr><td>ණය හිමියන්</td><td>2,757,977</td><td>3,385,165</td><td>3,575,125</td><td>101,876,139</td></tr>
<tr><td>හඳුනා නොගත් සෘජු තැන්පතු</td><td>3,828,498</td><td>20,178,176</td><td>13,243,884</td><td>3,394,665</td></tr>
<tr><td>ඉදිරිපත් නොකළ ගෙවීම</td><td>227,050</td><td>4,144,888</td><td>5,696,461</td><td>4,846,159</td></tr>
<tr><td>සැළසුම් නොකළ ගෙවීම් එකතු කිරීම</td><td>6,841,504</td><td>304,012</td><td>-</td><td>7,145,516</td></tr>
<tr><td>එකතුව</td><td>13,655,029</td><td>28,012,241</td><td>22,515,470</td><td>110,116,963</td></tr>
</table>
</td>
<td></td>
<td></td>
<td></td>
<td>අපේක්ෂා කරන ඕනෑම අනුමැතියක් නිර්දේශ කළ යුතුය.</td>
<td>කර ඇති ශේෂයෙන්, මණ්ඩලය අනුමත ප්‍රතිපත්තියට අනුව 2021 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී රු. මිලියන 18 ක වසර 5 කට වැඩි මුදලක් නිරවුල් කර ඇත.<br><br>ඉදිරිපත් නොකළ ගෙවීම්: සඳහන් කර ඇති ශේෂයෙන්, මණ්ඩලය අනුමත ප්‍රතිපත්තියට අනුව 2021 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී රු. මිලියන 11 ක වසර 2</td>
</tr>
</table>

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | කට වැඩි මුදලක් නිරවුල් කර ඇත. |
| 08. | 2019 දී සිදු වූ වංචා සහ වැරදි හේතුවෙන් සමාගමට රු. 45,203,058 ක අලාභයක් වාර්තා වී ඇති අතර රු. 8,056,058 ක් අයකර ගැනීමට හැකි විය. සමාගම විසින් වර්ෂය තුළ සිදු වූ වංචා සිද්ධීන් හා සම්බන්ධ සේවකයින් 18 දෙනෙකුගේ සේවය අවසන් කර තිබුණි. | 2019 | වංචා වළක්වා ගැනීම සඳහා සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට නිර්දේශ කෙරේ. | කිසිදු නඩු පැවරීමකින් තොරව අය කර ගත හැකි මුදල් ආපසු අයකරගෙන ඇති අතර අනෙකුත් ඒවා නීතිමය ක්‍රියාවලියකට යටත් වේ. | <u>ආයතන මට්ටමින්</u><br><br>අ. පුද්ගලික ණය - සියලුම භාරගැනීම් සහ වැටුප් තහවුරු කිරීම් PL Unit @ CCD (බෙදා හැරීමට පෙර) මගින් නැවත තහවුරු කරනු ලැබේ.<br><br>ආ. BM ට අමතරව "ශාඛා මෙහෙයුම් නිළධාරියා " ශක්තිමත් කර වැඩි වගකීමක් පැවරීම. සියලුම ණය ලිපිගොනු ප්‍රධාන කාර්යාලය ට යැවීමට පෙර ශාඛා මෙහෙයුම් | AGM R2, ප්‍රධාන විධායක නිලධාරී සහ අභ්‍යන්ත ර විගණක වරුන් විසින් CID වෙත ප්‍රකාශ ලබා දෙන ලදී. අදාළ පාර්ශවය න් සහ සැකකරු වන් සමඟ අවශ්‍ය ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන බව අපරාධ පරීක්ෂණ දෙපාර්ත මේන්තු වේ විමර්ශක යින් දැනුම් දී ඇත.<br><br>2021.12. 31 දිනට |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | නිලධාරියා විසින් සහතික කළ යුතුය.<br><br>ඇ. විශේෂයෙන් ලීසිං සහ අනෙකුත් ඉහළ වටිනාකම් සහිත පහසුකම් සඳහා - පාරිභෝගික පරීක්ෂණ ඡායාරූප SKALE පද්ධතියට අමුණා තිබිය යුතු අතර පරීක්ෂණට ගිය නිලධාරියා ඔහුගේ පැමිණීම තහවුරු කිරීම සඳහා ගූගල් සිතියම ඉදිරිපත් කළ යුතුය.<br><br><u>ශාඛා මට්ටමින්/ ප්‍රාදේශීය මට්ටමින්</u><br><br>ඈ. තිස්ස ශාඛාවෙන් පුද්ගලික | රු. මිලියන 37 ක් ලබා දී ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | ණය පහසුකම් ලබා දීම තාවකාලික ව නතර කර ඇත.<br><br>ඉ.<br><br>1 වන කුලී අධීක්ෂණ ක්‍රියාවලිය ප්‍රාදේශීය මට්ටමින් සිදු කරනු ලබන අතර යම් ප්‍රමාදයක් ඇත්නම් ප්‍රාදේශීය ප්‍රධානියාට හේතුව තහවුරු කිරීමට BM සහ RO දැනුවත් කරනු ලැබේ.<br><br>ඊ.<br><br>PL පහසුකම් හැර අනෙකුත් සියලුම පහසුකම් සඳහා පාරිභෝගිකයින් සහ ඇපකරුවන්, මුදල් ලබා දීම සඳහා | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | නිර්දේශ කිරීමට පෙර ප්‍රාදේශීය කාර්යාලය මගින් දූරකථනයෙන් තහවුරු කරනු ලැබේ.<br>1. චූදිත BM ගේ රු. 1,135,000 /- ක් වූ පාරිතෝෂිත හිමිකම රඳවා තබා ගැනීම. තවද එය ඔහු විසින්ම කරන ලද හානියට එරෙහිව පියවීම සඳහා නියමිත වේ.<br>2. එක් නිල කාර්ය මණ්ඩල ඉතුරුම් ගිණුමක් නොමැතිව සුබසාධන ගිණුම් හෝ වෙනත් පුද්ගලික ඉතුරුම් ගිණුමක් පවත්වාගෙ | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | න යාමට අවසර නැත.<br><br>3. කාර්ය මණ්ඩල ඉතුරුම් ගනුදෙනු සමීපව අධීක්ෂණය කරනු ලබන අතර කාර්ය මණ්ඩල ඉතිරිකිරී මේ සීමාවන් සඳහා විශේෂ අනුමැතිය ක් ගත යුතුය.<br><br>4.<br><br>අදාළ සියලු සැක සහිත සේවකයින් ඉවත් කර නව කාර්ය මණ්ඩලය ක් පත් කරන ලදි. ශාඛා මෙහෙයුම් නිරීක්ෂණ ය සඳහා නව උපාධිධාරී පුහුණු මෙහෙයුම් නිලධාරියෙකු පත් කර ඇත. | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 09. | සමාගම විසින් රු. මිලියන 521 ක් වන තවමත් භාවිතයේ පවතින දේපළ, පිරියත සහ උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇත. භාවිතයට ගත හැකි තත්ත්වය මත පදනම්ව එම වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කිරීමට සමාගම විසින් අවශ්‍ය කටයුතු සිදු කර නොමැත. | 2020 | තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ම ක්ෂය කරන ලද වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කළ යුතු බව නිර්දේශ කෙරේ. | භෞතික සත්‍යාපනය සහ ස්ථාවර වත්කම් සඳහා සංකේත යෙදීම අවසන් වීමෙන් අනතුරුව, ප්‍රත්‍යාගණනයට සම්බන්ධ මුදල් ප්‍රමාණය සහ පිරිවැය මත පදනම්ව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | භෞතික සත්‍යාපන යෙන් පසුව, බාහිර විගණකව රුන්ගේ උපදෙස් අනුව සම්පූර්ණ යෙන්ම ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනව ත් ආයු කාලය නැවත තක්සේරු කරන ලදි. | නැවත තක්සේ රු කරන ලද ප්‍රයෝජ නවත් ආයු කාලය මත පදනම්ව, 2021 මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සිදු කරන ලදි. |
| 10. | "ලැබිය යුතු රක්ෂණ නියෝජිතායතන කොමිස් මුදල" වශයෙන් වර්ග කර ඇති, රු. 14,147,683 ක් දීර්ඝ කාලයක සිට හිඟව පවතින ලැබිය යුතු ශේෂයක් වශයෙන් නිරීක්ෂණය වූ අතර එම ශේෂය සේවාදායකයාට නොලැබුණු, රක්ෂණ සමාගම්වල වැට් බදු කොටසකින් ද සමන්විත වේ. | 2020 | | දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂ නිරවුල් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයේ නිර්දේශය සහිතව මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක් සකස් කර ඇත. අභ්‍යන්තර විගණනය විසින් විගණන කමිටුව වෙත ලියා හැරීමේ පත්‍රිකාව ඉදිරිපත් කර ඇති අතර ලියා හැරීමේ ප්‍රතිපත්තියට අනුව දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂය ලියා හැරීමට විගණන කමිටුවේ අනුමතිය ලබා දී ඇත. | මණ්ඩලය විසින් අනුමත කරන ලද 'දිගුකාලීන හිඟ ශේෂ නිෂ්කාශන ප්‍රතිපත්තිය ක්' ක්‍රියාත්මක වේ. ප්‍රතිපත්තිය ට අනුව, අභ්‍යන්තර විගණන අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරන ඕනෑම අනුමැතිය ක් නිර්දේශ | මණ්ඩල යේ අනුමැති ය ලබා ගැනීමෙ න් පසු 2021 ඔක්තෝ ම්බර් මාසයේදී රු. මිලියන 14 ක දිගුකාලී න හිඟ ශේෂය නිරවුල් කරන ලදි. |

<table>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td>කළ යුතුය.</td><td></td></tr>
<tr>
<td>11.</td>
<td>ණය හිමියන්ගේ තාවකාලික ගිණුම්වල ද, හඳුනා නොගත් සෘජු තැන්පතු සහ ඉදිරිපත් නොකළ ගෙවීම් ගිණුම්වල දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂ නිරීක්ෂණය විය. දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය පහත වගුවේ දක්වා ඇත.
<table>
<tr><th>විස්තරය</th><th colspan="5">හිඟව පවතින කාල පරිච්ඡේදය</th></tr>
<tr><th></th><th>0-1</th><th>1-3</th><th>3-5</th><th>වර්ෂ 5 කට වැඩි කාලයක්</th><th>එකතුව</th></tr>
<tr><td>ණය හිමියන්</td><td>12,600</td><td>7,852, 644</td><td>3,097,115</td><td>104,601,496</td><td>115,563,855</td></tr>
<tr><td>හඳුනා නොගත් සෘජු තැන්පතු</td><td>-</td><td>-</td><td>4,253,600</td><td>16,638,549</td><td>20,892,149</td></tr>
<tr><td>ඉදිරිපත් නොකළ ගෙවීම්</td><td>-</td><td>1,399, 678</td><td>2,354,981</td><td>9,947, 389</td><td>13,702,048</td></tr>
<tr><td>එකතුව</td><td>12,600</td><td>9,252, 322</td><td>9,705,696</td><td>131,187,434</td><td>150,158,052</td></tr>
</table>
</td>
<td>2020</td>
<td>තාවකාලික ගිණුම්වල දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂ නිරවුල් කිරීමට නිර්දේශ කරන ලදි.</td>
<td>වසර 5 ක සාමාන්‍ය ණය කාලසීමාව සැලකිල්ලට ගනිමින්, අභ්‍යන්තර විගණන අංශයේ නිර්දේශය සහිතව දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂ පියවා ගැනීම සඳහා මණ්ඩලය මගින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක් සකස් කර ඇත. අභ්‍යන්තර විගණනය විසින් විගණන කමිටුව වෙත ලියා හැරීමේ පත්‍රිකාව ඉදිරිපත් කර ඇති අතර ලියා හැරීමේ ප්‍රතිපත්තියට අනුව දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂය ලියා හැරීමට විගණන කමිටුවේ අනුමතිය ලබා දී ඇත.</td>
<td>මණ්ඩලය විසින් අනුමත කරන ලද 'දිගුකාලීන හිඟ ශේෂ නිෂ්කාශන ප්‍රතිපත්තියක්' ක්‍රියාත්මක වේ. ප්‍රතිපත්තියට අනුව, අභ්‍යන්තර විගණන අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරන ඕනෑම අනුමැතියක් නිර්දේශ කළ යුතුය.</td>
<td><u>ණය හිමියන්</u><br><br>ඉහත සඳහන් කළ ශේෂය රු. මිලියන 104.5 ක් දක්වා අඩු කර ඇත.<br><br><u>හඳුනා නොගත් සෘජු තැන්පතු</u><br><br>සඳහන් කර ඇති ශේෂයෙන්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2021 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී රු. මිලියන 18 ක වසර 5 කට වැඩි මුදලක් නිරවුල් කර ඇත.</td>
</tr>
</table>

<table>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td><td><u>ඉදිරිපත් නොකළ ගෙවීම්</u><br><br>සඳහන් කර ඇති ශේෂයෙන්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2021 ඔක්තෝම්බර් සහ නොවැම්බර් මාසවලදී රු. මිලියන 11 ක වසර 2 කට වැඩි මුදලක් නිරවුල් කර ඇත.</td></tr>
<tr><td>12.</td><td>2020 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් විමර්ශනය කරන ලද ප්‍රධාන වංචනික ක්‍රියාකාරකම් සාරාංශගත කර පහත දක්වා ඇත.<br><table><tr><th>ශාඛාව</th><th>විස්තරය</th><th>සිදු වූ සම්පූර්ණ මූල්‍ය අලාභය (රු.)</th></tr><tr><td>මොණරාගල</td><td>ව්‍යාජ ලේඛන මත ලීසිං පහසුකම් 11 ක් ලබාදී ඇත.</td><td>මිලියන 16.63</td></tr></table></td><td>2020</td><td>මින් ඉදිරියට මෙවැනි වංචනික ක්‍රියාකාරකම් සිදු වීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ.</td><td>නීති අංශය මගින් ලබා දී ඇති උපදෙස්වලට අනුව, ගනුදෙනුකරුවන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර, නඩු වල ප්‍රගතිය මත අනෙකුත් නඩු සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ද ආරම්භ කර ඇත. ශාඛා කළමණාකරු හැටන් ශාඛාවට මාරු කර ඇති අතර</td><td><u>ආයතන මට්ටමින්</u><br><br>අ. පුද්ගලික ණය - සියලුම භාරගැනීම් සහ වැටුප් තහවුරු කිරීම PL Unit @ CCD (බෙදා හැරීමට පෙර) මගින්</td><td>AGM R2, ප්‍රධාන විධායක නිලධාරී සහ අභ්‍යන්තර විගණකවරුන් විසින් CID වෙත ප්‍රකාශ ලබා දෙන</td></tr>
</table>

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | තිස්සමහාරාමය | වයාජ සහ අසත්‍ය ලේඛන ඉදිරිපත් කරමින් ණය සහ ලීසිං පහසුකම් 21 ක් ලබා ගැනීම. | මිලියන **32.17** | | | දැනට අය කර ගැනීමේ අංශයේ සේවය කරයි.<br><br>විනය පරීක්ෂණයක් මත පදනම්ව 2020-02-20 (පසුව 2021-07-15 දිනැතිව) දින සිට ක්‍රියාත්මක වන පරිදි ශාඛා කළමනාකරු සේවයෙන් පහ කර ඇත. තවද, ශාඛා කළමණාකරුට සහ මෙම වංචාවට සම්බන්ධ තුන්වන පාර්ශවයට එරෙහිව 2021-07-13 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නඩු පවරා ඇත.<br><br>ගාල්ල ශාඛාවේ හිටපු කළමනාකරුගෙන් අලාභය අයකර ගැනීම සඳහා 2021 ජුනි 25 දින වංචා විමර්ශන කාර්යාංශයට කරන ලද පැමිණිල්ල. | නැවත තහවුරු කරනු ලැබේ.<br><br>ආ. BM ට අමතරව "ශාඛා මෙහෙයුම් නිළධාරියා " ශක්තිමත් කර වැඩි වගකීමක් පැවරීම. සියලුම ණය ලිපිගොනු ප්‍රධාන කාර්යාලය ට යැවීමට පෙර ශාඛා මෙහෙයුම් නිලධාරියා විසින් සහතික කළ යුතුය.<br><br>ඇ. විශේෂයෙන් ලීසිං සහ අනෙකුත් ඉහළ වටිනාකම් සහිත පහසුකම් සඳහා - පාරිභෝගික පරීක්ෂණ ඡායාරූප SKALE පද්ධතියට අමුණා තිබිය යුතු | ලදී. අදාළ පාර්ශවයන් සහ සැකකරුවන් සමඟ අවශ්‍ය ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශකයින් දැනුම් දී ඇත.<br><br>2021.12.31 දිනට රු. මිලියන 37 ක් ලබා දී ඇත. |
| | ගාල්ල | **Mass Eco Cabana** චෙක්පත අවනතු කර ගැනීම. | මිලියන **5.215** | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | අතර පරීක්ෂණට ගිය නිලධාරියා ඔහුගේ පැමිණීම තහවුරු කිරීම සඳහා ගූගල් සිතියම ඉදිරිපත් කළ යුතුය.<br><br><u>ශාඛා මට්ටමින්/ ප්‍රාදේශීය මට්ටමින්</u><br><br>ඈ. තිස්ස ශාඛාවෙන් පුද්ගලික ණය පහසුකම් ලබා දීම තාවකාලික ව නතර කර ඇත.<br><br>ඉ.<br><br>1 වන කුලී අධීක්ෂණ ක්‍රියාවලිය ප්‍රාදේශීය මට්ටමින් සිදු කරනු ලබන අතර යම් ප්‍රමාදයක් ඇත්නම් ප්‍රාදේශීය ප්‍රධානියාට හේතුව තහවුරු | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | කිරීමට BM සහ RO දැනුවත් කරනු ලැබේ.<br><br>ඊ.<br><br>PL පහසුකම් හැර අනෙකුත් සියලුම පහසුකම් සඳහා පාරිභෝගිකයින් සහ ඇපකරුවන්, මුදල් ලබා දීම සඳහා නිර්දේශ කිරීමට පෙර ප්‍රාදේශීය කාර්යාලය මගින් දුරකථනයෙන් තහවුරු කරනු ලැබේ.<br><br>1. චූදිත BM ගේ රු. 1,135,000 /- ක් වූ පාරිතෝෂිත හිමිකම රඳවා තබා ගැනීම. තවද එය ඔහු විසින්ම | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | කරන ලද හානියට එරෙහිව පියවීම සඳහා නියමිත වේ.<br><br>2. එක් නිල කාර්ය මණ්ඩල ඉතුරුම් ගිණුමක් නොමැතිව සුබසාධන ගිණුම් හෝ වෙනත් පුද්ගලික ඉතුරුම් ගිණුමක් පවත්වාගෙන යාමට අවසර නැත.<br><br>3. කාර්ය මණ්ඩල ඉතුරුම් ගනුදෙනු සමීපව අධීක්ෂණය කරනු ලබන අතර කාර්ය මණ්ඩල ඉතිරිකිරී මේ සීමාවන් සඳහා විශේෂ අනුමැතිය ක් ගත යුතුය.<br><br>4. | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | අදාළ සියලු සැක සහිත සේවකයින් ඉවත් කර නව කාර්ය මණ්ඩලයක් පත් කරන ලදි. ශාඛා මෙහෙයුම් නිරීක්ෂණය සඳහා නව උපාධිධාරී පුහුණු මෙහෙයුම් නිලධාරියෙකු පත් කර ඇත.<br><br>AGM R2, ප්‍රධාන විධායක නිලධාරී සහ අභ්‍යන්තර විගණකවරුන් විසින් CID වෙත ප්‍රකාශ ලබා දෙන ලදී. අදාළ පාර්ශවයන් සහ සැකකරුවන් සමඟ අවශ්‍ය ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශකයි | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | න් දැනුම් දී ඇත.<br><br>2021.12.31 දිනට රු. මිලියන 37 ක් ලබා දී ඇත. | |